

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்

Sri Lanka Broadcasting Corporation







# වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය 2016

# ஆண்டறிக்கை மற்றும் கணக்குக் கூற்று 2016

# Annual Report & Statement of Accounts From 2016

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

# වාර්ෂික වාර්තාව

## සහ

# ගිණුම් ප්‍රකාශනය

**2016 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා**

**ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,**
**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**කොළඹ.**

**ගරු අමාත්‍යතුමනි,**

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1. 2016 ජනවාරි මස 01 වන දින සිට 2016 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඉටුකළ කාර්යයන් පිළිබඳ පාලන වාර්තාව
2. 2016 ජනවාරි මස 01 දින සිට 2016 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ගිණුම් වර්ෂය සඳහා ගිණුම් සම්බන්ධ වාර්තාව
3. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවසන් ගිණුම් සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව
4. 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කළ පරිකථනය

මෙයට - විශ්වාසී,

සිද්දි එම් ෆාරුක්,
සභාපති,
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
කොළඹ 07.

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | පාලන වාර්තාව | 09 |
| 2. | වාර්ෂික ගිණුම් ප්‍රකාශය | 19 |
| 3. | මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව | 45 |
| 4. | 2016 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය | 73 |

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

## දැක්ම

ප්‍රමුඛ ශ්‍රී ලාංකික ගුවන්විදුලි සන්නිවේදකයා වීම.

## මෙහෙවර

ශ්‍රාවකයාගේ ජීවිතයට බලපාන ආර්ථික, සමාජීය, සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාපනික, විනෝදාත්මක යනාදී විවිධ ක්ෂේත්‍ර ඇසුරෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමෙන් ඔවුනගේ ජීවිත ආලෝකමත් කිරීමක් උදෙසා දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනයට සමත්වන ආකාරයෙන් ගුවන්විදුලි මාධ්‍ය මෙහෙයවීම.

## අරමුණු

1. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුන සඳහා ශ්‍රාවක පිරිසක් සහිත ගුවන්විදුලි නාලිකා පවත්වාගෙන යන ආයතනය ලෙස කටයුතු කිරීම.
2. වගකීමෙන් යුතුව සමබර තොරතුරු කඩිනමින් ලබාදෙන, ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීම.
3. දේශීය සංස්කෘතියේ අභිවෘද්ධිය පිණිස උසස් සහ නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම.
4. දැනුම, ආකල්ප සහ කුසලතාවන්ගෙන් පිරිපුන් ස්වයං අභිප්‍රේරණ කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීම.
5. නිෂ්පාදන සහ විකාශන තාක්ෂණය නිසි පරිදි යාවත්කාලීන කරමින් දෙස් විදෙස් ශ්‍රාවකයන්ට පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම.
6. ආචාරධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන්විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම උදෙසා පුරෝගාමී ආයතනය ලෙස ක්‍රියා කිරීම.
7. ජාතික ගුවන්විදුලිය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා නිර්මාණශීලි දායකත්වය සැපයීම.
8. යහපත් මුල්‍ය පාලනයක් හා මානව සම්පත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම.
9. තරගකාරී වෙළෙඳ පොළ උපායශීලීව ජය ගැනීම.

# පාලන වාර්තාව - 2016

# පාලන වාර්තාව - 2016

## හැඳින්වීම

1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 1967 ජනවාරි මස 05 වන දින සිට ක්‍රියාත්මකවන ලෙසට ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දකි.

2016 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා වූ මාස 12ක කාලපරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණය වේ.

සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේදය තුළ පහත දක්වෙන සාමාජිකයන් සංස්ථා මණ්ඩලයට ඇතුළත් වූහ.

| | | | |
|---|---|---|---|
| 1 | නීතිඥ නන්ද මුරුත්තෙට්ටුවෙගම | - | සභාපති |
| 2 | එස්.ඒ.සී.කුලතිලක මිය | - | භාණ්ඩාගාර නියෝජිත |
| 3 | ආචාර්ය අරුන්දතී රෙංගනාදන් මිය | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 4 | වරලත් ඉංජිනේරු කිත්සිරි සමරසිංහ මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 5 | ඩබ්.ජයසිරි මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 6 | විශාරද දීපිකා ප්‍රියදර්ශනී පීරිස් මෙනවිය | - | සංස්ථා මණ්ඩල සාමාජික |

## පාලන වාර්තාව

විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමී රාජ්‍ය මාධ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 2016 වර්ෂය තුළ ද සිය අරමුණු සාධනයේ ලා අති විශාලය කාර්ය භාරයක් ඉටු කර ඇත. ලාංකීය ජනමනස, දැනුමින් පෝෂණය කරමින් රසවින්දනාත්මක හරවත් වැඩසටහන් විසුරුවා හැරීම සම්බන්ධයෙන් 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක වීම සඳහා ගුවන්විදුලි සංස්ථාවේ එක් එක් අංශයන්හි දායකත්වය පිළිබඳ ලුහුඬු සටහන් පහත සඳහන් කර ඇත.

## ■ සිංහල ස්වදේශීය සේවය

ජාතික ගුවන්විදුලියේ අනන්‍යතාවය රැකෙන පරිදි සදාචාරවත් මාධ්‍ය සම්ප්‍රදායක පෙරගමන්කරුවා වශයෙන් ක්‍රියා කිරීම සිංහල ස්වදේශීය සේවය වෙත පැවරී ඇති ප්‍රධානතම වගකීම වේ. ''ගුවන්විදුලිය මහජන සේවයකි'' යන සංකල්පය අනුව කටයුතු කරමින් ගුණාත්මක හා චින්තනාත්මක වැඩසටහන් මගින් ජන මනස තුළ විශ්වසනීයව රැඳී සිටිමින් රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීම 2016 වර්ෂයේදී ද සිංහල ස්වදේශීය සේවය මනාව ඉටු කර ඇත. කෘෂිකර්මාන්තය, සත්ව නිෂ්පාදන ආදිය කෙරෙහි ජනතාව තුළ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ''සාර සංවාද'', ''ගෙවත්ත'' ආදී වැඩසටහන් ද පරිසර හිතකාමී ජන මනසක් ගොඩනැගීම අරමුණු කරගනිමින් ''තිරසර දියවර'' හා ''මිහිතලය'' වැනි වැඩසටහන් ද ඉදිරිපත් කර ඇත.

කාලීනව වැදගත් මාතෘකා ඔස්සේ අදාළ ක්ෂේත්‍රයන්හි පළපුරුදු විද්වතුන්ගේ සහභාගීත්වයෙන් ප්‍රවෘත්ති අංශයේද දායකත්වය ඇතිව ''සුභාරතී'' වැඩසටහන ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරය වූ ප්‍රධානතම වැඩසටහනකි. ''පුවත් සිරස්තල'', ''ප්‍රවෘත්ති පසුබිම'', ''පුවත් අටුවාව'' ආදී ජනතාවගේ ප්‍රවෘත්ති අවශ්‍යතාවය සැපිරීම සඳහා 2016 වර්ෂය තුළ ප්‍රචාරය වූ වැඩසටහන්ය.

ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා බෞද්ධ, හින්දු, කතෝලික, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගමික වැඩසටහන් ස්වදේශීය සේවය ඔස්සේ දෛනිකව ප්‍රචාරය කරන ලද වැඩසටහන්ය. ඊට අමතරව විශේෂ ආගමික උත්සව අලලා වැඩසටහන් නිෂ්පාදනය කොට ඇත. ආගමික අංශයේ විශේෂ දායකත්වයෙන් දෛනිකව ධර්මදේශනා දෙකක් මෙම වර්ෂයේද ප්‍රචාරය කර ඇති අතර රටවටා නත්තල් හා රටවටා අවුරුදු වැඩසටහන් දීර්ඝ කාලයක් පුරා පැවත එන 2016 වර්ෂයේද උත්කර්ෂවත් අන්දමින් විකාශය කළ ස්වදේශීය සේවයට අනන්‍ය වූ වැඩසටහන් වේ.

ඉහළ ශ්‍රාවක ප්‍රතිචාර ලබා ඇති ''බෞද්ධ නාටය'', ''කෙටි කතා'', ''විශ්ව සාහිත්‍යයෙන්'' ආදිය ගුවන්විදුලි නාට්‍ය අංශයේ නිෂ්පාදනයන් වේ.

අනාගතයට යහපත් මාධ්‍ය භාවිතයෙන් යුතු තරුණ කැළක් බිහි කිරීම අරමුණු කරගනිමින් ළමා නිර්මාණ රාශියක් දූයේ දූවාදරුවන්ගේ දායකත්වයෙන් ප්‍රචාරය කිරීම 2016 වර්ෂයේදී ද සිදු කර ඇත.

සතියේ දින පහ තුළ කාන්තාවගේ දැනුම පුළුල් කිරීමේ අරමුණ පෙරදැරිව කාන්තා වැඩසටහන් අංශයේ ඉදිරිපත් කිරීම් වශයෙන් සඳ ''සංහිතා'', ''ලිය පැහැසරණිය'', ''සඳමිණි ආර'', ''ලිය පියසර'' සහ ''සඳලිය සෙවණ''දැක්විය හැක.

## ■ අධ්‍යාපන සේවය

ගුවන්විදුලි සංස්ථා අධ්‍යාපන සේවය, ස්වදේශීය සේවා ගුවන්කාලය තුළ දූයේ දුවාදරුවන්ගේ අධ්‍යාපනික තත්ත්වය ඉහළ නැංවීම සඳහා ජාතික මෙහෙවරක් වශයෙන් ක්‍රියාත්මකවන විකාශය වන අතර 2016 වර්ෂයේදී ද දූයේ දුවාදරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීමේ අරමුණින් විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත. විධිමත් අධ්‍යාපන වැඩසටහන්, නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්, අ.පො.ස.(සා.පෙ.) පුනරීක්ෂණ වැඩසටහන්, අ.පො.ස.(උ.පෙ.) පුනරීක්ෂණ වැඩසටහන්, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සිසුන් සඳහා විශේෂ වැඩසටහන් පෙර වර්ෂයන්හි මෙන්ම මෙම වර්ෂයේද ක්‍රියාත්මක විය. විභාග කොමසාරිස්තුමාගේ මූලිකත්වයෙන් අ.පො.ස.(සා.පෙ.) සහ අ.පො.ස.(උ.පෙ.) විභාගය සම්බන්ධයෙන් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන 2016 වර්ෂයේද ප්‍රචාරය විය. දරුවන්ගේ දැනුම, රසවින්දන වර්ධනය කිරීම තුළින් ගුණාත්මක පුරවැසියකු බිහිකිරීමේ අරමුණ පෙරදැරිව අධ්‍යාපන සේවය මඟින් නිර්මාණාත්මක වැඩටසහන් රාශියක් ප්‍රචාරය කර ඇත.

## ■ වෙළඳ සේවය

වෙළඳ අරමුණු සාධනය කරමින් ඵලදායී ලෙස අසන්නාගේ දැනුම, රසවින්දනය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන නාලිකාව ලෙස ගුවන්විදුලි සංස්ථාවේ සිංහල වෙළඳ සේවය හඳුන්වා දිය හැකිය. 2016 වර්ෂයේද වෙළඳ සේවයේ සියලුම ගුවන්කාලයන් වෙළඳපොළ ඉලක්ක කරගනිමින් සැලසුම් කර තිබූ අතර අලෙවි අංශය සමඟ එක්ව මෙම වැඩසටහන් සියල්ලම පාහේ අලෙවියට කටයුතු කර ඇත.

අලෙවි අංශය හා වෙළඳ සේවය එක්ව 2016 වසර තුළ 'ගයන ගැයුම්', 'ලතා ප්‍රණාම' ආදී ප්‍රසංග සංවිධානය කර ඇති අතර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම තුළින් සංස්ථාව වෙත විශාල ආදායමක් උපයා දී ඇත. ඊට අමතරව එම වැඩසටහන් සංස්කරණය කර නැවත ප්‍රචාරයට යොදා ඇත.

කාලීන වැදගත්කමක් ඇති මාතෘකා ඔස්සේ අදාල ක්ෂේත්‍රයන්හි විද්වතුන්ගේ සහභාගීත්වයෙන් සංවාදාත්මක වැඩසටහන් මාලාවක් ලෙස 'සාර ප්‍රභාගිර' ප්‍රචාරය කර ඇත. 'කතා සරිත් සාගරේ', සහ ශ්‍රී ෂ අනුග්‍රහයෙන් ප්‍රචාරය වූ 'ඇවිද්ද පය දහස්වටී' ආදී වැඩසටහන් රටේ පිළිගත් පුද්ගලයින් හා විද්වත් වෘත්තිකයින්ගේ දායකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වේ.

වසර 50කට අධික කාලයක සිට 'හඳමාමා' වෙළඳ සේවයටම අනන්‍ය වූ වැඩසහනක් ලෙස ප්‍රචාරයට යොදා ඇති අතර සෑම වැඩසටහනක් සඳහාම විවිධ ආයතනයන්ගේ අනුග්‍රාහක දායකත්වය ලබාගෙන ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් 'සුව අරණ' වැඩසටහන 2016 වර්ෂයේ ප්‍රචාරය වූ සුවිශේෂ වැඩසටහනකි. 2016 වර්ෂයේ අසන්නන්ගේ ඉල්ලීම් සඳහාම වෙන් වූ වැඩසහන් වශයෙන් ලක් මැදුර අනුග්‍රහයෙන් විකාශය වූ 'ලක්මැදුරෙන් මධුර ගී' දැක්විය හැකිය. පීපල්ස් ලීසිං අනුග්‍රහයෙන් 'ජනජය මාවත' විකාශය වූ අතර ඒ මඟින් එම ආයතනයේ ප්‍රාදේශීය කාර්යාලයක නිලධාරියකු සම්බන්ධ කරගනිමින් ඔවුන් විසින් ජනතාවට ලබාදෙන සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම සිදුවිය. 'වනන්තරේ කතන්දරේ' වැඩසටහන සැඟවී ඇති සුවිශේෂී ස්ථානයන් පිළිබඳව ජනතාව දැනුවත් කරන වාර්තාමය වැඩසටහනකි.

## ■ සිටි එෆ්.එම්. සේවය

සංකීර්ණ සමාජ රාමුවක් තුළ අභියෝග ජයගනිමින් ගුවන්විදුලි ක්ෂේත්‍රයේ වඩාත්ම ඵලදායී හා ජනප්‍රියම වාණිජ ගුවන්විදුලි නාලිකාව බවට පත්වීමේ අභිලාෂයෙන් ක්‍රියාත්මක වන ගුවන්විදුලි සංස්ථා සිටි එෆ් එම් සේවය ශ්‍රී ලාංකීය ජනතාවගේ සන්නිවේදන අවශ්‍යතා ජාතික වගකීමකින් යුතුව ඉටු කිරීමේ ප්‍රමුඛයා වශයෙන් කටයුතු කරයි. තරඟකාරී වෙළඳපොල උපායශීලීව ජයගැනීම, ජාතික වගකීමකින් යුතුව විශ්ව දැනුම සහ තොරතුරු නිවැරදිව සමබරව විශ්වසනීයත්වයෙන් යුතුව ශ්‍රාවකයා වෙත යොමු කිරීම, උසස් රුචිකත්වයක් සහිත ශ්‍රාවක සමාජයක් බිහි කිරීම තුළින් දේශීය සංස්කෘතියේ අභිවර්ධනය පිණිස නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම ආදී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස 2016 වර්ෂයේදී සිටි එෆ් එම් සේවය පහත සඳහන් වැඩසටහන් ඇතුළුව විශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

- සෝමදාස ඇල්විටිගල අභිනන්දන ප්‍රසංගය
- සංස්ථා දිනය නිමිත්තෙන් පැවැත්වෙන සර්ව රාත්‍රික ආගමික ආශීර්වාද පූජාව සජීවීව ප්‍රචාරය කිරීම
- අනුග්‍රාහක වැඩසටහන් ලෙස

| | |
|---|---|
| මුළු රටම එළියයි- දස දෙසම කළඑළියයි | විදුලිබල මණ්ඩලයේ අනුග්‍රහයෙන් |
| අලුත් අවුරුදු ගීතය | කැන්ඩි අනුග්‍රහයෙන් |
| ඩයලොග් සිත්ගත් ගීතය | ඩයලොග් අනුග්‍රහයෙන් |

- 'වස විස නැති රටක්' නිෂ්පාදන ප්‍රදර්ශනයේ මාධ්‍ය ආවරණය
- අලුත් අවුරුද්ද සඳහා 'ලොව වටා අවුරුදු' වැඩසටහන ප්‍රචාරය කිරීම හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව 'ඇසිදිසි බක්මහ උළෙල' සංවිධානය කිරීම
- වෙසක් උත්සවය මූලික කරගනිමින් එහි තේමාව වූ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව කෙටි වැඩසටහන් ප්‍රචාරය කිරීම
- පොසොන් උත්සවය මූලික කරගනිමින් 'මිහින්තලාවය දහම් අමාවයි' සංගීත ප්‍රසංගය ප්‍රචාරය කිරීම
- ශ්‍රීපාද පත්මයේ ශෛලමය අනුරුව හා සර්වඥ ධාතූන් වහන්සේලා සහිත සධාතුක කරඬුව මහජන ප්‍රදර්ශනය - මාධ්‍ය ආවරණය
- පද්ම ශ්‍රී පණ්ඩිත් අමරදේව මහතාගේ අවමගුල් උත්සවය පිළිබඳ සජීවී තත්ත්ව විස්තර සහ අවමගුල් උත්සවය සජීවීව ප්‍රචාරය කිරීම
- නව වැඩසටහන් ලෙස 'සිටි එෆ් එම් යොවුන් පුරය', 'ස්ටූඩියෝ සික්ස්', 'ඉරිදා අටයි තිහ', 'දඟ රඟ', පාරමී නාට්‍යය ආදිය හඳුන්වා දීම

■ දෙමළ ස්වදේශීය සේවය

දමිළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් අනුව යමින් ඔවුන්ගේ ජීවිතයට බලපාන සමාජීය, ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික හා රසවින්දනාත්මක වැඩසටහන් ප්‍රචාරය කිරීම 2016 වර්ෂයේ ද දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ සිදුකර ඇත.

ඒ අතර තෛපොංගල් දිනය, සරස්වතී පූජාව සංස්කෘතිකමය වැදගත්කමින් යුතු විශේෂ අවස්ථාවන් සම්බන්ධයෙන් වැඩසටහන් ප්‍රචාරය කර ඇති අතර ඒ හා බැඳුණු විවිධ විචිත්‍රාංගයන් නිෂ්පාදනය කර ඇත. හින්දු ආගම හා වෙනත් ආගම් අදහන දමිළ ජනතාව ඉලක්ක කරගනිමින් විශේෂ ආගමික වැඩසටහන් ප්‍රචාරය කර ඇත. 2016 වර්ෂයේදී ප්‍රචාරය කළ ආගමික වැඩසටහන් ලෙෂ 'යාවයි තිරකදර්ශනම්' බයිබල් වැඩසටහන ද 'දීපම්' ක්‍රිස්තියානි ආගමික වැඩසටහන ද විශේෂයෙන් හඳුන්වාදිය හැකිය. ඊට අමතරව වෙසක් උත්සවය හා පොසොන් උත්සවය නිමිති කොට ජාතික උත්සව අවස්ථා ප්‍රචාරයට යොදා ඇත. හජ්ජි උත්සවය සම්බන්ධයෙන් වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

ජාත්‍යන්තර වශයෙන්, ජාතික වශයෙන් හා සමාජීය වශයෙන් වැදගත්වන විවිධ දින මූලික කරගනිමින් විශේෂ වැඩසටහන් ප්‍රචාරයට යෙදීම සහ ඒවා සම්බන්ධයෙන් පැවති ජාතික උත්සව ආවරණය කිරීම 2016 වසරේද සිදු කර ඇත. එම වැඩසටහන් ලෙස , 'රටවටා අවුරුදු' සිංහල හින්දු අලුත් අවුරුදු වැඩසටහන, නිදහස් දින සැමරුම, මැයි දින සැමරුම, මත්ද්‍රව්‍ය නිවාරණ දින වැඩසටහන, ලෝක ළමා දින වැඩසටහන, කාන්තා දින වැඩසටහන දැක්විය හැක.

## තෙන්ඩ්‍රල් සේවය

තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ආරම්භ කර ඇති දෙමළ මාධ්‍ය ගුවන්විදුලි නාලිකාව වන්නේ තෙන්ඩ්‍රල් සේවයයි. 2016 වසරේද තෙන්ඩ්‍රල් සේවයේ අනන්‍යතාවය රැකගනිමින් විවිධ ජාතික, ආගමික, සමාජීය වැදගත්කම් සහිත දිනයන්හි විශේෂ වැඩසටහන් ප්‍රචාරය කිරීම සිදු කර ඇත. ඒ අනුව තෛපොංගල් දිනය හා සරසවතී පූජාව සඳහා විශේෂත්වයක් ලබා සංස්ථා පරිශ්‍රය තුළ උත්සව සංවිධානය කිරීම පෙර වර්ෂවල සේම 2016 වර්ෂයේ ද උත්කර්ෂවත් අන්දමින් සිදුවිය. සිංහල හින්දු අලුත් අවුරුදු දිනය, රාමසාන් උත්සව සමය, හජ්ජි උත්සවය, නිදහස් දිනය, කාන්තා දිනය, ලෝක ළමා දිනය ආදිය සඳහා විශේෂ වැඩසහන් ප්‍රචාරය කර ඇත. ඊට අමතරව නල්ලූර් පූජා සමය තුළ තත්ත්ව විස්තර වාර්තා සැපයීමද සිදු කර ඇත.

දෙමළ භාෂාව කතා කරන ශ්‍රාවකයාගේ දැනුම විනෝදය සඳහා 'පාට්ටක්ක පාට්ට' නමින් පටිගත කරන ලද ගීතයෙන් ගීතය වැඩසටහන ද දැක්විය හැකිය. ගීත, නාට්‍ය, විකට ජවනිකා වැනි විවිධ විචිත්‍රාංගයන් ඇතුළත් දැනුම, විනෝදය සපිරි වැඩසටහන් රාශියක් 2016 වර්ෂයේ ශ්‍රාවක ජනතාව වෙත තිළිණ කර ඇත.

ක්‍රිස්තියානි ආගමික වැදගත්කමකින් යුතු තලවිල හා මඩු දේවස්ථාන වන්දනා සමයන්හි විශේෂ වැඩටසහන් සහ තත්ත්ව විස්තර වාර්තා ලබාදීම සිදුකරනු ලැබිණි. එසේම ක්‍රිස්තියානි / කතෝලික ආගමික වැඩසටහන් රාශියක් සේවාදායක අනුග්‍රහය යටතේ තෙන්ඩ්‍රල් සේවය ඔස්සේ ප්‍රචාරයට යොදා ඇත.

■ මුස්ලිම් සේවය

වසර 60කට අධික කාලයක සිට ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් මුස්ලිම් සංස්කෘතික හා ඉස්ලාම් ආගමික පසුබිම පදනම් කරගෙන විකාශයවන එකම ගුවන්විදුලි නාලිකාව ගුවන්විදුලි සංස්ථා මුස්ලිම් සේවයයි. මෙම

සේවය දෙමළ ස්වදේශීය සේවය ඔස්සේ ඊට නියමිත ගුවන්කාලයන් තුළ විකාශය වේ. ශ්‍රී ලාංකීය මුස්ලිම් ප්‍රජාව අතර පමණක් නොව දකුණු ඉන්දියානු මුස්ලිම් ජනයා අතරද මෙම සේවය ජනප්‍රසාදයට පත්ව ඇත. මුස්ලිම් සේවය තුළ ප්‍රචාරය වන වැඩසටහන් බොහෝමයක් අනුග්‍රාහක දායකත්වය ඇතිව ප්‍රචාරය කෙරෙන වැඩසටහන් වේ. ජනවර්ගයක් මූලික කරගනිමින් සිය විකාශන කටයුතු සිදු කරනු ලැබුවද ගුවන්විදුලි සංස්ථා මුස්ලිම් සේවය සැමවිටම ජාතීන් අතර සහජීවනය සහ සහයෝගීතාවය වර්ධනය කිරීම ප්‍රධානතම අරමුණක් වශයෙන් සලකා වැඩසටහන් සම්පාදනය කර ඇති අතර 2016 වසර ද මුස්ලිම් ප්‍රජාවට සේම සමස්තයක් ලෙස ශ්‍රී ලාංකික ජනතාව වෙත සිය සහයෝගීතාවය ප්‍රධානය කළ වසරකි.

- **ඉංග්‍රීසි සේවය**

ඉංග්‍රීසි සේවයේ ප්‍රධානතම අරමුණ වන්නේ සංගීතම වැඩසටහන් තුළින් ඉංග්‍රීසි සේවය වටා එක්රොක් වූ අති විශාල ශ්‍රාවක ප්‍රජාව පිනවීමය. පැරණි සහ සංගීතමය වශයෙන් වැදගත්කමක් සහිත ඉංග්‍රීසි ගීත පුස්තකාලයක් ගුවන්විදුලි සංස්ථාව සතුවන අතර ඒවා ආශ්‍රයෙන් සැකසුණු වැඩසටහන් රාශියක් 2016 වර්ෂයේ ප්‍රචාරයට යොදා ඇත. සංගීතමය වැඩසටහන්වලට අමතරව විවිධ රටවල ජාතික දින උත්සව, එම රටවල විශේෂ සිදුවීම් ආශ්‍රයෙන් සැකසුණු වැඩසටහන්, ජාත්‍යන්තර වශයෙන් වැදගත්වූ විවිධ දිනයන් සම්බන්ධ වැඩසටහන්, මැයි දිනය, නිදහස් දිනය ආදී විවිධ ජාතික වැදගත්කමක් සහිත වැඩසටහන් පෙර වර්ෂයන්හි මෙන්ම 2016 වර්ෂයේද ප්‍රචාරය කර ඇත. ජාතික හා සංස්කෘතික වශයෙන් වැදගත්වන විවිධ උත්සව ආදිය පිළිබඳව සැකසුනු විශේෂ වැඩසටහන් ද 2016 වර්ෂය තුළ ඉදිරිපත් කර ඇත.

- **රජරට සේවය**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ප්‍රාදේශීය සේවා සංකල්පය ජනතා මෙහෙවරෙහි යෙදවීමේ ප්‍රථම අවස්ථාව වන්නේ රජරට සේවයයි. රජරට සේවය ආරම්භයේ සිට අද දක්වාම තමන්වෙත පැවරී ඇති එම වගකීම නොපිරිහෙලා ඉටු කරයි. 2016 වර්ෂයේ රජරට සේවයේ ක්‍රියාකාරකම් ගුවන්විදුලි සංස්ථාවේ උන්නතියට සැලකිය යුතු බලපෑමක් එල්ල කර ඇත. රජරට සේවය ආරම්භයේ පටන්ම සුවිශේෂත්වයක් උසුලන්නේ කලාකරුවන් රටට දායාද කිරීම සම්බන්ධයෙනි. එම කලාකරුවන් සම්බන්ධ කරගනිමින් විශේෂ වැඩසහන් කීපයක්ම මෙම වර්ෂයේදී නිෂ්පාදනය කර ඇත. එසේම කාලයත් සමඟ අභාවයට ගොස් නවතා දමා තිබූ නව පදමාලා, සාදු ජනරාව ආදී වැඩසටහන් කීපයක්ම නැවත ආරම්භ කිරීම 2016 වර්ෂයේදී සිදු කරන ලද විශේෂ කාර්යක් වේ. ඊට අමතරව ප්‍රදේශයේ පාසල් සම්බන්ධ කරගනිමින් විශේෂ අධ්‍යාපන වැඩසටහන් ද විහාරස්ථාන සම්බන්ධ කරගනිමින් ආගමික වැඩසටහන් ද ප්‍රචාරය කර ඇත. විශේෂයෙන් රජරට කලාපයට වැදගත්වන වකුගඩු රෝගය ආදී රෝග සම්බන්ධව ජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් සකසා ඇත. ලෝක ළමා දිනය සම්බන්ධ වැඩසටහන් ද පරිසරය සම්බන්ධ වැඩසටහන් ද විශේෂ කලාකරුවන් සම්බන්ධ වැඩසටහන් ද ප්‍රචාරය කර ඇති අතර රජරට කලාපයට විශේෂ වූ පොසොන් පොහොය ආශ්‍රයෙන් වැඩසහන් කීපයක්ද ප්‍රචාරයට යොදා ඇත. ජනවාරි මස 05 වන දිනට යෙදෙන ගුවන්විදුලි සංස්ථා සංවත්සරය වෙනුවෙන් මහ පිරිත් දේශනය සහ පසුදා මහා සංඝයා විෂයෙහි දානමය පිංකම සිදුකිරීම 2016 වර්ෂයේදී සිදුකරනු ලැබුවේ රජරට සේවය මගිනි.

- **රුහුණු සේවය**

රුහුණු සේවය, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රධානතම ප්‍රාදේශීය සේවාවලින් එකකි. ප්‍රවෘත්තිමය, සංස්කෘතිකමය, ආගමික සහ අධ්‍යාපනික වශයෙන් ප්‍රාදේශීයව වැදගත්වන කරුණු ඇසුරු කරගනිමින් 2016 වර්ෂයේද රුහුණු සේවය සිය වැඩසටහන් සැකැස්ම පවත්වාගෙන ගොස් ඇත. ප්‍රදේශයේ ඇති විහාරස්ථානයන්හි පැවති ආගමික උත්සව පිළිබඳව සජීවී විස්තර ප්‍රචාරය, පෝදා විශේෂ ආගමික වැඩසටහන් ආදිය මගින් ආගමික වශයෙන් වැදගත්වන අවස්ථාවන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කර ඇත. සංස්කෘතිකමය වටිනාකම් සහිත සීනිගම දේවාල පෙරහැර හා කතරගම පෙරහැර ආශ්‍රිතව සජීවී විස්තර ප්‍රචාරයන් ඉදිරිපත් කර ඇත. රුක්මණී දේවී ගී ප්‍රසංගය හා ප්‍රේමකීර්ති ද අල්විස් අනුස්මරණ උපහාර ප්‍රසංගය 2016 වර්ෂයේ ඉටුකර ඇති සුවිශේෂී ප්‍රසංගයන් ලෙස හඳුන්වා දිය හැක. 'මාතර මාමා' වැඩසටහනේ සංවත්සර ප්‍රසංගය හා අවුරුදු උත්සවය පැවැත්වීමද මෙම වර්ෂයේ ඉටු කරන ලද සුවිශේෂී වැඩසටහන් ය. අවසාන වශයෙන් ලාංකීය ජන ජීවිතවලට එල්ලවූ දරුණු ව්‍යසන අවස්ථාවක් වූ 2004 සුනාමි ව්‍යසනයෙන් ජීවිත අහිමිවූවන් සිහිපත් කරමින් විශේෂ වැඩසටහනක් ප්‍රචාරය කෙරිණි.

- **වයඹ හඬ**

වයඹ හඬ, වයඹ ප්‍රදේශය ආවරණය කරමින් පවත්වාගෙන යන ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාවයි. ප්‍රාදේශීය වශයෙන් සහ ජාතික වශයෙන් සුවිශේෂ අවස්ථාවන් ජනතාව වෙත දැනුම, රසවින්දනය ඔස්සේ ලබාදීම අරමුණු

කරගනිමින් 2016 වර්ෂය තුළ වයඹ සේවය සිය කටයුතු මෙහෙයවා ඇත. ජාතික වශයෙන් වැදගත්වන විශේෂ දිනයන් හා විශේෂ ජාතික උත්සව පිළිබඳව පෙර වර්ෂයන්හි මෙන්ම මෙම වර්ෂයේද විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඊට අමතරව හෘද රෝග, වකුගඩු රෝග, මත්ද්‍රව්‍ය, කුරුණෑගල ආපදා කමිටුව, පරිසර සතිය, දුම්වැටි විරෝධී දිනය, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම ආදී ඉතා වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් නිෂ්පාදනය කොට ප්‍රචාරය කිරීමට කටයුතු යොදා ඇත. විජය කුමාරණතුංග, අජන්තා රණසිංහ, එච්. ආර්. ජෝතිපාල, විජය නන්දසිරි, එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක, සුනිල් දයානන්ද කෝණාර ආදී සුවිශේෂී පුද්ගලයන් සම්බන්ධව විශේෂ වැඩසටහන් ප්‍රචාරය කර ඇත. මලිය දේව විද්‍යාලයේ උසස්පෙළ විශිෂ්ඨයින් සම්බන්ධ වැඩසටහන, පාසල් දරුවන්ට සුභාවිත ගීතය හඳුන්වාදීමේ වැඩසටහන, දේශීය නර්තන කලාව සම්බන්ධ වැඩසටහන ආදී පාසල් දරුවන්ට වැඩදායී වැඩසටහන් රැසක් හා මලියදේව ආදිශිෂ්‍ය සංගමය සංවිධානය කළ මලිදෙව් මේලා ප්‍රදර්ශනය සඳහා මාධ්‍ය අනුග්‍රහය ලබාදීම දීමද 2016 වර්ෂයේදී ඉටු කළ කාර්යයන්ය. ඊට අමතරව වයඹ හඬ 7 වන සංවත්සරය වෙනුවෙන් ආශිර්වාද වැඩසටහන්, සුබ පැතුම් හා ගීත ආදී වැඩසටහන් ඉදිරිපත් කර ඇත.

- **රේඩියෝ දඹාන**

රේඩියෝ දඹාන ගුවන්විදුලි නාලිකාව, මූලිකව ශ්‍රී ලංකාවේ ආදිවාසීන් වන වැදි ජනතාව ඉලක්ක කරගනිමින් සහ දඹාන ආශ්‍රිත ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාවේ තුළ ක්‍රියාත්මකවන වෙළෙඳ අභිප්‍රායෙන් මිදුණු එකම ගුවන්විදුලි නාලිකාව වේ. 2016 වර්ෂයේදී ද ආදිවාසීන්ගේ අනන්‍යතාවය, ඇදහිලි හා විශ්වාස, කලාකෘති ආදිය සංරක්ෂණය කරමින් ඔවුන්ගේ ජන ජීවිතයට වැදගත්වන ක්ෂේත්‍රයන් ආවරණය කිරීම රේඩියෝ දඹාන ඉටු කර ඇත. වී වගාව හා අනෙකුත් ගොවිතැන් සඳහා කාබනික ද්‍රව්‍ය යෙදීමේ වැදගත්මක පිළිබඳව විශේෂ වැඩසටහන් ලෙස 'වස විස නැති ගොවිතැන', වකුගඩු රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍ය තිලක් අබේසේකර මහතා ඇතුළු මහනුවර මහ රෝහලේ වෛද්‍යවරු හා ගිරාදුරුකෝට්ටේ වකුගඩු රෝග ඒකකයේ සම්පත් දායකත්වයෙන් මහවැලි කලාපවල ශීඝ්‍රයෙන් පැතිරෙන වකුගඩු රෝගය දැනුවත් කිරීමේ විශේෂ ව්‍යාපෘතිය සහ වැදි භාෂාව මිය යා නොදී පවත්වාගෙන යාම සඳහා දඹානේ ගුණවර්ධන ඇතුළු පිරිසකගේ සම්පත් දායකත්වයෙන් දැනුවත් කිරීමේ නිවේදන ප්‍රචාරය කිරීම ආදිය 2016 වර්ෂයේ රේඩියෝ දඹාන ඉටු කළ ප්‍රජා සත්කාරයන් වශයෙන් හඳුන්වා දිය හැකිය.

- **ප්‍රවෘත්ති අංශය**

2016 වර්ෂය තුළ දී ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය ප්‍රවෘත්ති වැඩසටහන් කීපයක් සකස් කර ප්‍රචාරය කර තිබේ. දිනපතා ප්‍රචාරය වන සුභාරතී වැඩසටහනට අමතරව ප්‍රවෘත්ති පසුබිම, ඇතුල් පැත්ත, පුවත් අටුවාව ආදී වැඩසටහන් ඒ අතර වේ. කාලීන වශයෙන් වැදගත්වන දේශපාලනික, ආර්ථික සාමාජීය කරුණු සම්බන්ධයෙන් ශ්‍රාවක ප්‍රජාව දැනුවත් කිරීම මූලික කරගනිමින් රජයේ සංවර්ධන වැඩපිළිවෙල ජනගත කිරීමේ අරමුණ ද ඇතිව මෙම ප්‍රවෘත්ති වැඩසටහන්හි අන්තර්ගතය සකස් වී තිබේ.

දිනකට එක් භාෂාවකින් ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ තුනක් ප්‍රචාරය වන අතර භාෂාත්‍රයෙන්ම ප්‍රචාරය වන ප්‍රවෘත්ති ප්‍රකාශ ප්‍රමාණය 12 කි. ඊට අමතරව පැයෙන් පැය භාෂා තුනෙන්ම ප්‍රවෘත්ති ලුහුඬින් ප්‍රචාරය කර ඇත.

- **සංවර්ධන ඒකකය**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා සහභාගී වූ විවිධ උත්සව සඳහා මාධ්‍ය ආවරණය ලබාදීමේ කටයුතු සංවර්ධන ඒකකය විසින් ඉටුකර ඇත. එම උත්සව අවස්ථාවන් අමතා ගරු ජනාධිපතිතුමන් කරනු ලැබූ ප්‍රචාරය කර ඇති අතර ඒ සියල්ල සංරක්ෂණය කිරීමට ද කටයුතු යොදා ඇත. මෙම උත්සව සඳහා පූර්ව නිවේදන සකස්කොට ප්‍රචාරයට යෙදීමෙන් පූර්ව ප්‍රචාරක කටයුතු සිදුකිරීම සහ එම උත්සව අවස්ථා සජීවීව ප්‍රචාරය කිරීමට ද කටයුතු කර ඇත.

ගරු ජනාධිපතිතුමන් 2016 වර්ෂයේදී සහභාගී වූ ජර්මන් සංචාරය, ජපානයේ ජී 7 සමුළුව, එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය ඇමතීම, චීනය, ඉන්දියාව වැනි විදේශීය සංචාරයන් පිළිබඳ තත්ත්ව වාර්තා ප්‍රචාරය සහ එම අවස්ථාවන්වලදී ජනාධිපතිතුමන් කරනු ලැබූ කතා ප්‍රචාරයට යෙදීම ද සිදුකොට ඇත.

- **සංගීත අංශය**

පෙර වර්ෂයන්හි මෙන්ම 2016 වර්ෂයේදී ද ගුවන්විදුලි සංස්ථා සංගීත අංශය සංස්ථාවේ සෑම නාලිකාවක් ඔස්සේම ගුණාත්මක සංගීත වැඩසටහන් ඉදිරිපත් කිරීමට උපරිම දායකත්වය සපයා ඇති අතර ශාස්ත්‍රීය වැඩසටහන්, සරළ ශාස්ත්‍රීය වැඩසටහන්, නිර්මාණාත්මක වැඩසටහන් විචාරාත්මක වැඩසටහන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත. ඒ අතරින් ප්‍රවීණ සංගීතවේදී වී.සෝමපාල පෙරේරා මහතා විසින් ඉදිරිපත් කළ බටනලා හා මැණ්ඩලීන් වාදන

ඇතුළත් ඔයැ බැටැබා ප්‍රසංගය විශේෂ කොට හඳුන්වා දිය හැක.

පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසල් ගුරුවරුන්, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් සඳහා සහ සංගීත ලැදි ඕනෑම රසවතෙකුට මහඟු අත්වැලක් වන, ශ්‍රී ලංකාවේ ප්‍රථම පෙරදිග සිංහල සංගීත ශබ්දකෝෂය ගුවන්විදුලි සංස්ථා ප්‍රකාශනයක් ලෙස ජනගත කිරීම 2016 වසරේ සංගීත අංශය විසින් ඉටු කළ විශේෂ කාර්යයක් ලෙස දැක්විය හැක.

ලෝක ළමා දිනය මූලික කරගනිමින් ළමා ශිල්පී පරීක්ෂණයෙන් සමත් ළමුන් සහභාගී කරවාගෙන ''පුංචි පුංචි තරු වගේ'' නමින් ළමා ගීත 16 ක් ඇතුළත් සංයුක්ත තැටියක් නිර්මාණය කිරීමද 2016 වර්ෂයේදී සිදු කළ කාර්යයකි.

## ■ ශ්‍රවණ පර්යේෂණ අංශය

2016 වර්ෂය ශ්‍රවණ පර්යේෂණ අංශයට විශේෂිත වසරකි. 2010 වසරේ සිට ශ්‍රවණ පර්යේෂ අංශයේ පර්යේෂණ නිලධාරීන් තිදෙනා වෙනත් අංශ වෙත අනුයුක්ත කර තිබූ අතර 2015 වර්ෂයේදී ඔවුන්ගෙන් දෙදෙනෙක් නැවත මෙම අංශය වෙත අනුයුක්ත කරනු ලැබිණි. ඒ අනුව 2016 වර්ෂයේදී විශේෂිත පර්යේෂණ ව්‍යාපෘති කිහියක්ම විධිමත් ලෙස සිදු කිරීමට හැකියාව ලැබිණි. ඒ අතරින් දේශීය සේවාවන්හි ශ්‍රවණ තත්ත්වය පිළිබඳව ප්‍රශ්නමාලා ක්‍රමය යටතේ සමීක්ෂණයක් කිරීම, ප්‍රවෘත්ති ප්‍රකාශ ද ඇතුළුව වැඩසටහන් 30ක් ගුණාත්මක හා ප්‍රමාණාත්මක ඇගයීමකට ලක්කිරීම, දෙස් විදෙස් වැදගත් සිදුවීම් ආශ්‍රයෙන් දිනයේ වැදගත් සිදුවීම් සේවාවන්හි ප්‍රයෝජනය වෙනුවෙන් ලබාදීම විශේෂයෙන් දැක්විය හැකිය. ඊට අමතරව අධ්‍යයන අවශ්‍යතා සඳහා යොමුවන විශ්ව විද්‍යාල පර්යේෂකයන්ට හා පාසල් දරුවන්ට ඔවුන්ගේ පර්යේෂණ සඳහා සහය දැක්වීම ගුවන්විදුලියේ මහජන සේවයක් වශයෙන් ශ්‍රවණ පර්යේෂණ අංශයෙන් නිතිපතා සිදුවන කාර්යයකි.

## ■ මධ්‍යම ක්‍රියාකාරී අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මැදිරි මෙහෙයුම් කටයුතු සහ පටිගත කිරීම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අංශය වන්නේ මධ්‍යම ක්‍රියාකාරී අංශයයි. සංස්ථාව සතු සම්බන්ධතා මැදිරි, සංරක්ෂණ මැදිරි සහ පටිගත කිරීමේ මැදිරි සඳහා ක්‍රියාකාරී සහයකවරුන් යෙදවීම සහ අනෙකුත් පහසුකම් සැලසීම මධ්‍යම ක්‍රියාකාරී අංශයේ කාර්ය භාරය වේ. 2016 වර්ෂයේ ද වැඩසටහන්වල ස්වභාවය අනුව ඊට ගැළපෙන ක්‍රියාකාරී සහායකවරුන් ලබාදීම මගින් සංස්ථාවේ වැඩසටහන්වල ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා මහඟු දායකත්වයක් මධ්‍යම ක්‍රියාකාරී අංශය විසින් දක්වා ඇත. ශ්‍රාවකයන්ට බාධා ඇති නොවන පරිදි විශ්වසනීය ගුවන්විදුලි විකාශයක් පවත්වා ගැනීම ක්‍රියාකාරී සහායකයන් සතු ප්‍රධානතම වගකීම වන අතර මෙම වර්ෂය තුළ එම කාර්යය කිසිදු බාධාවකින් තොරව ඉටු කර ඇත.

ස්ටීරියෝ තාක්ෂණය අනුව උපරිම පහසුකම් සහිතව ගීත මෙන්ම වැඩසටහන් ද පටිගත කිරීම සඳහා මධ්‍යම ක්‍රියාකාරී අංශය දායක වී ඇති අතර බාහිර පුද්ගලයින් සඳහා සහ බාහිර ආයතන සඳහා ගෙවීමේ පදනම මත ආනන්ද සමරකෝන් මැදිරිය සහ අංක 5 සහ අංක 6 මැදිරි ලබා දීම සඳහා මධ්‍යම ක්‍රියාකාරී අංශයේ නොමසුරු දායකත්වය 2016 වර්ෂයේදී ද ලබාදී ඇත.

## ■ අභ්‍යාස ආයතනය

2016 වර්ෂය තුළ අභ්‍යාස ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සිංහල නිවේදක නිවේදිකාවන්ගේ භාෂා භාවිතය වැඩිදියුණු කිරීමේ එක්දින වැඩමුළුවක්, ගුවන්විදුලි වැඩසටහන් සැලසුම් කිරීම සම්බන්ධ එක්දින පුහුණු වැඩමුළුවක්, ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනය සම්බන්ධ එක්දින පුහුණු වැඩමුළුවක් සහ වැඩසටහන් නිෂ්පාදන සහායකයින් සඳහා පරිගණක පාදක පටිගත කිරීම් සහ සංස්කරණය සම්බන්ධ දින 03 ක පුහුණු වැඩමුළුවක් ආදී වශයෙන් සංස්ථාවේ අභ්‍යන්තර පුහුණු ක්‍රියාකාරකම් ඉටු කර ඇත.

ඊට අමතරව සංස්ථාවේ පුහුණු අවශ්‍යතා රාශියක් සපුරාලීමේ අරමුණින් පහත දක්වා ඇති පුහුණු වැඩමුළු පවත්වා ඇත.

- කළමනාකරණ සහකාර මෘදුකාංග පුහුණුව
- පසුගිය වර්ෂයේ රාජ්‍ය මාධ්‍යවල වාර්තාකරණය ඇගයීම
- කළමනාකරණ සහායක ලේඛන කුසලතා වැඩමුළුව
- නවක ප්‍රාදේශීය වාර්තාකරුවන් සඳහා පුහුණු වැඩමුළුව
- ඉංග්‍රීසි නිවේදක පුහුණුව
- වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සම්බන්ධ පුහුණුව
- පාලන ලේකම්වරුන් සඳහා පුහුණුව

- සංයුක්ත සැලැස්ම සම්බන්ධ පැහැදිලි කිරීම
- මූලික විමර්ශන පිළිබඳව පුහුණු වැඩමුළුව
- ප්‍රවෘත්ති සන්නිවේදකයින් සඳහා පුහුණු වැඩමුළුව

■ **ඉංජිනේරු අංශය**

2016 වර්ෂය තුළ ගුවන්විදුලි සංස්ථා ඉංජිනේරු අංශය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පහත ආකාරයෙන් වේ.

1. හපුතලේ එෆ් එම් විකශනාගාරය යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතියේ පළවන අදියර ක්‍රියාත්මක කිරීම - ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන සියයකි.

   ඒ යටතේ සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම්
   - කි.වො.5 ධාරිතාවයෙන් යුත් නව සම්ප්‍රේෂණ යන්ත්‍ර 08 ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම
   - විකාශනාගාරයේ සිවිල් ඉංජිනේරු කටයුතු අවසන් කිරීම
   - විකාශනාගාරය සඳහා අවශ්‍ය Links, Processors, Distribution amp ආදී උපකරණ මිලදී ගැනීම
2. සම්බන්ධතා මැදිරි (C 1 – C12 දක්වා) යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර - ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන විස්සකි.
3. නිෂ්පාදන මැදිරි යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම - ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන විස්සකි.

■ **අලෙවි අංශය**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ලාභදායී ආයතනයක් බවට පත්කිරීමේ වගකීම පැවරී ඇත්තේ අලෙවි අංශය වෙතයි. තම අංශය වෙත පැවරී ඇති මෙම සුවිශේෂී වගකීම සෑම වර්ෂයකම සේම මෙම වර්ෂයේද උපරිමයෙන් ඉටු කිරීමට අලෙවි අංශය කටයුතු යොදා ඇත. වැඩසටහන් අංශය හා එක්ව අලෙවි කිරීමට හැකි සෑම ගුවන් කාලයක්ම අලෙවි කිරීමට අලෙවි අංශය සිය උපරිම උත්සාහය දරා ඇති අතර දෛනිකව ලබන අලෙවි ආදායමට අමතරව විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් රාශියක් 2016 වර්ෂයේ සංවිධානය කර ඇත. ඒ අතර ගුවන්විදුලි සංස්ථා දිනය වෙනුවෙන් ජාතික වකුගඩු රෝහලේ වාට්ටුවක් ප්‍රතිසංස්කරණය කිරීම හා රෝහල් කීපයක් සඳහා ඖෂධ ගබඩා කිරීමට ශීතකරණ ප්‍රධානය කිරීම සුවිශේෂී කටයුත්තක් ලෙස හඳුන්වාදිය හැකිය. සෝමදාස ඇල්විටිගල උපහාර ප්‍රසංගය හා රසාංජලී ප්‍රසංගය පැවැත්වීම, ගීතාංජලී ප්‍රසංගය, සංගීතවේදී වී හේමපාල පෙරේරා ප්‍රසංගය සඳහා සේවාදායක සම්බන්ධීකරණය ලබාදීම, 'මිහින්තලාවයි දහම් අමාවයි' දියත උයන පොසොන් කලාපය සංවිධානය කර ක්‍රියාත්මක කිරීම, මහනුවර දළඳා පෙරහැර නිල ගුවන්විදුලිය ලෙස කටයුතු කිරීම, සමන් දේවාල පෙරහැර සඳහා නිල මාධ්‍ය ආවරණය, අවාරේ සිරිපා වැඩසටහන සඳහා සේවාදායක සම්බන්ධීකරණය ලබාදීම 2016 වර්ෂයේ ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘති ලෙස හඳුන්වා දිය හැක.

# ගිණුම් ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
මූල්‍ය තත්ත්වය පිලිබඳප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.)

| | ස | දෙසැම්බර් 31 2016 | දෙසැම්බර් 31 2015 (යළි ප්‍රකාශිත) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | **9** | 2,231,178,033 | 2,460,462,705 |
| විලම්භිත බදු වත්කම් | **8** | 1,277,887 | (409,678) |
| සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ | **10** | 187,825,197 | 254,571,510 |
| ආයෝජන | **11** | 1,000,000 | 1,000,000 |
| | | **2,421,281,116** | **2,715,624,537** |
| **ජංගම වත්කම්** | | | |
| තොග භාණ්ඩ | | 25,907,733 | 27,028,803 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | **12** | 264,571,062 | 229,209,389 |
| මාර්ගස්ථ භාණ්ඩ | | 30,512,997 | 4,852,069 |
| මුදල් හා මුදලට සමාන දෑ | **13** | 320,286,094 | 260,851,451 |
| | | **641,277,886** | **521,941,713** |
| **මුළු වත්කම්** | | **3,062,559,003** | **3,237,566,250** |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 307,386,085 | 307,386,085 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 14,421,999 | 14,421,999 |
| රඳවාගත් ඉපැයුම් | **14** | (74,682,767) | (126,541,868) |
| | | **247,125,317** | **195,266,216** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | | 241,582,628 | 239,321,738 |
| විලම්භිත ආදායම (ජපාන ප්‍රදාන) | | 75,218,347 | 79,909,399 |
| රජයේ ප්‍රදාන | | 722,868,845 | 629,025,361 |
| ත්‍රිකුණාමල ප්‍රදානය | | 1,283,596,811 | 1,646,092,816 |
| විලම්භිත බදු බැරකම් | **8** | 70,970,003 | 75,733,399 |
| | | **2,394,236,634** | **2,670,082,712** |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු | **15** | 251,582,232 | 233,928,814 |
| මූල්‍යමය නොවන බැරකම් | **16** | 169,614,819 | 138,288,508 |
| **මුළු බැරකම්** | | **421,197,051** | **372,217,322** |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | **3,062,559,003** | **3,237,566,250** |

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1971 අංක 38 දරන මූල්‍ය පනත සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සමග අනුකූල වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව මුදල් අධ්‍යක්ෂ සඳහතික කරයි.

ලලිත් හෙට්ටිගේ මහතා
අධ්‍යක්ෂ මුදල් දිනය ...................................

මෙම මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
මෙම මූල්‍ය ප්‍රකාශ 2017 ජුලි මස 19 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදී.

සුදර්ශන ගුණවර්ධන අධ්‍යක්ෂ මණ්ඩලය
සභාපති දිනය ......................................
දිනය .....................................

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
විස්තීරණ ආදායම් ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | සටහන | 2016 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | 2015 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා |
|---|---|---|---|
| විකුණුම් | **1** | 524,036,586 | 495,237,240 |
| විකුණුම් පිරිවැය | **2** | 488,435,383 | 465,369,159 |
| **දළ ලාභය** | | **35,601,203** | **29,868,081** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | **3** | **430,651,446** | 467,193,029 |
| බෙදා හැරීම් පිරිවැය | **4** | **81,367,757** | 84,913,710 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | **5** | **376,206,243** | 386,746,874 |
| පරිපාලන වියදම් | **6** | **317,162,912** | 313,682,908 |
| **මෙහෙයුම් ලාභය** | | **(308,484,262)** | **(288,282,380)** |
| මූල්‍ය පිරිවැය | **7** | **5,555,448** | 6,213,541 |
| **රජයේ ප්‍රදානයට පෙර ලාභය / (අලාභ)** | | **(314,039,711)** | **(294,495,921)** |
| රජයේ ප්‍රදානය | **3.1** | **365,000,000** | 350,000,000 |
| **රජයේ ප්‍රදානයෙන් පසු ලාභය / (අලාභ)** | | **50,960,289** | **55,504,079** |
| විලම්භිත බදු වියදම් | **8** | **6,450,961** | 8,776,009 |
| **බදුවලින් පසු ලාභය** | | **57,411,250** | **64,280,088** |
| **මුළු විස්තීරණ ආදායම** | | **57,411,250** | **64,280,088** |

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිත | | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2015 ජනවාරි 1 දිනට ශේෂය | 307,386,085 | | 14,421,999 | | - | 321,808,084 |
| **විස්තීරණ ආදායම** | | | | | | |
| විස්තීරණ ආදායම | | | | | 64,280,088 | 64,280,088 |
| ආදායම් සංචිත | | | | | (190,821,956) | (190,821,956) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **307,386,085** | **-** | **14,421,999** | **-** | **(126,541,868)** | **195,266,216** |
| **විස්තීරන අදායම** | | | | | | |
| කාලසීමාව සඳහා විස්තීරණ ආදායම | | | | | 57,411,250 | 57,411,250 |
| ආදායම් සංචිත ගැලපුම | | | | | (5,552,149) | (5,552,149) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **307,386,085** | **-** | **14,421,999** | **-** | **(74,682,767)** | **247,125,317** |

## 2016 දෙසැම්බර් මස 31න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | **2016** | | 2015 | |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| බදු සහ පොලී වලට පෙර ශුද්ධ ලාභය | | 50,960,289 | | 62,274,288 |
| **පහත සඳහන් දෑ සඳහා ගැලපුම්** | | | | |
| රජයේ ප්‍රදානයේ ක්‍රමක්ෂය | (67,476,968) | | (57,975,190) | |
| ත්‍රිකුණාමල ප්‍රදානයේ ක්‍රමක්ෂය | (155,406,674) | | (177,769,097) | |
| ක්ෂයවීම | 45,687,595 | | 43,621,211 | |
| ක්ෂයවීම - ත්‍රිකුණාමලය | 45,687,595 | | 182,364,130 | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | 21,300,257 | | 23,335,178 | |
| බොල් ණය සඳහා ප්‍රතිපාදනය | 5,743,906 | | 3,775,144 | |
| විනිමය මත ලාභ / අලාභ | 265,004 | | 176,576 | |
| කල්බදු පොලී | 176,345 | | 1,045,145 | |
| ආ.සේ.ගා | 916,796 | 9,443,000 | 1,807,365 | 20,380,462 |
| | | 60,403,290 | | 82,654,750 |
| ආදායම් සංචිත ගැලපුම (19) | | 867,406 | | 5,947,058 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභ** | | | | |
| තොග භාන්ඩ ඉහළ යාම / පහළ යාම | 1,121,071 | | 4,833,817 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ පිලිබඳ ඉහළ යාම / පහල | (41,105,579) | | (6,157,694) | |
| මාරගස්ථ භාණ්ඩ වල ඉහළ යාම / පහල යාම | (25,660,928) | | 442,436 | |
| වෙළඳ සමහ අනෙකුත් ගෙවිය යුතු දෑ පිලිබඳ ඉහළ යාම / | 22,362,706 | | (4,882,736) | |
| මූල්‍යමය නොවන බැරකම්වල ඉහළ යාම / පහළ යාම | 30,409,515 | (12,873,215) | (4,978,970) | (10,743,147) |
| ගෙවන ලද පාරිතෝෂික | | (19,039,367) | | (6,668,767.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්** | | 29,358,114 | | 71,189,894 |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | | |
| රජයේ ප්‍රදාන (ප්‍රාග්ධන) | 156,629,400 | | 230,300,958 | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (67,720,498) | | (19,684,821) | |
| සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ | (53,946,740) | | (112,958,823) | 97,657,314 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් | | 34,962,163 | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | | |
| කල්බදු කුලිය ගෙවීම | (4,885,634) | | (9,092,168) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් | | (4,885,634) | | (9,092,168) |
| මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම | | 59,434,642 | | 159,755,040 |
| කාල සීමාව ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | | 260,851,452 | | 101,096,412 |
| කාලසීමාව අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ (සටහන 13) | | **320,286,094** | | **260,851,452** |

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. **සාමාන්‍ය තොරතුරු**

1.1. **වාර්තාකරණ අස්තිත්වය**

1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත යටතේ නිසි පරිදි සංස්ථා ගතකොට ස්ථාපනයකොට ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇත.

**1.2.** **ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය**

වසර තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ගුවන් කාලය විකිණීමයි.

**1.3.** **නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය**

2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වසර සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ 2017 ජූලි 19 වැනිදින අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**1.4.** **සේවක සංඛ්‍යාව**

වසර අවසානයේදී ස්ථිර සේවක සංඛ්‍යාව 851 කි. වසර අවසානයේදී කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව 70 කි.

(2015-12-31 - 925)

**2.** **පිළියෙල කිරීමේ පදනම හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යොදාගැනීම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.) සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නව වෙළුමක් නිකුත්කර ඇති අතර 2012 ජනවාරි 01 සිට හෝ ඉන් පසුව ආරම්භ වන වසර සඳහා බලාත්මක වන පරිදි ව්‍යවසායන් මෙම ප්‍රමිති ආදේශ කිරීම අවශ්‍ය කරනු ලබයි.

**3.3. 1.** **වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රත්පත්ති පහත විස්තරකොට ඇත. අන්‍යාකාරයෙන් සඳහන්කර ඇත්තේ නම් මිස ඉදිරිපත්කර ඇති සියලු වසර සඳහා මෙම ප්‍රතිපත්ති ඒකාකාරව ආදේශකර ඇත.

**3.1.1.** **පිළියෙල කිරීමේ පදනම**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙලකර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සහ පසුව පැහැදිළිකොට ඇති අනෙකුත් නිශ්චිත මැනුම් යටතේ පිළියෙලකර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදුකර නොමැත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පිණිස තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. එසේම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේ ක්‍රියාදාමයේ දී කළමනාකාරිත්වය සිය විනිශ්චය ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර 4 වැනි සටහනෙහි හෙළිදරව්කොට ඇත ඊට වත්කම් සහ බැරකම් වාර්තාකොට ඇති ප්‍රමාණ සහ මූල්‍ය වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීම සහ වාර්තාකරණ කාලසීමාව තුළ ආදායම සහ වියදම් ප්‍රමාණ පිළිබඳ වාර්තාව අයත් වේ. වත්මන් සිදුවීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකාරිත්වයේ උපරිම දැනුම මත මෙම ඇස්තමේන්තු පාදක වුවත් අවසානයේ දී තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැක.

### 3.1.2. අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් සිදුකර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

### 3.1.3. පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සියළු භෞතික සිදුවීම් සලකා බලා අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකොට හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

### 3.1.4. සංසන්දනාමත්ක තොරතුරු

සංස්ථාව විසින් එකාකාරව යොදාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේනම් මිස පෙර වසරේ ප්‍රතිපත්ති සමග අනුරූප වේ. සලකාබලන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තැන්හි දී පෙර වසරේ සංඛ්‍යා නැවත සකස්කර ඇත.

### 3.1.5. විදේශ ව්‍යවහාර මුදල්

**(අ) ක්‍රෘත්‍යාත්මක සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය**

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත්කර ඇති අයිතම මණිනු ලබන්නේ අස්තිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය යොදා ගනිමිනි (ක්‍රෘත්‍යාත්මක මුදල් ඒකකය). මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සංස්ථාවේ ක්‍රෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

**(ආ) විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂය**

විදේශ මුදල් ගනුදෙනු, එම ගනුදෙනුව සිදුකළ දිනයන්හි දී පැවති විනිමය අනුපාතය හෝ අයිතම මනිනු අවස්ථාවන්හි දී වටිනාකම යොදාගනිමින් ක්‍රෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සහ විදේශ මුදලින් අභිධානකර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වසර අවසාන විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේ දී ඇතිවන විදේශ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### 3.2. අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.2.1. වත්කම් සහ ඒවායේ මැනීමේ පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය ඇති වත්කම් වනුයේ මුදල් සහ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතුවල සමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ යන දෙකින් වඩා කෙටි කාලසීමාව තුළ මුදලින් උපලබ්ධිවීමට අපේක්ෂිත දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වසරක කාලසීමාවක් ඉක්මවා රඳවා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

#### 3.2.1.1. දේපල, පිරියත හා උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි සමන්විත වනුයේ මූලිකවම ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානවලිනි. සියලු දේපල, පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයට ප්‍රකාශ කරනු ලැබ ඇත. දේපල පිරියත හා උපරකණවල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සමගින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාළ වත්කම වැඩ කරන තත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදුවන ආනුෂංගික වියදම් ද වේ. වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගමට පවත්වාගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. පසුව දරන අනෙකුත් පිරිවැය වත්කමේ ධාරණ අගයට ඇතුලත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතමය තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

#### 3.2.1.2. ප්‍රතිසංස්කරණ පිරිවැය

ආරම්භයේ දී තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීමට හෝ

නඩත්තු කිරීමට දරන ලද වියදම, එලෙස වියදම දැරූ අවස්ථාවේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

#### 3.2.1.3. ක්ෂයවීම

ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනය ගණනයකර ඇත්තේ සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනම යොදා ගනිමිනි. මේ සඳහා යොදාගත් ප්‍රධාන වාර්ෂික අනුපාත වනුයේ,

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 7.5% |
| ශ්‍රව්‍ය සංඛ්‍යාන උපකරණ | 7.5% |
| ගෘහ භාණ්ඩ,සවිකිරීම් සහ උපකරණ | 10% |
| සම්ප්‍රේෂක | 7.5% |
| රථ වාහන | 25% |
| සංගීත භාණ්ඩ | 10% |
| පරිගණක උපකරණ | 50% |
| පටිගත කිරීමේ | 33.33% |
| සුළු උපකරණ | 50% |

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම, වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් සහ ප්‍රයෝජ්‍ය ආයු කාල උචිත පරිදි සමාලෝචනයකොට ගැලපීම් සිදුකරනු ලැබේ.

වත්කමක ධාරණ මුදල එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි මුදලට වඩා වැඩිවන්නේ නම්, එය වහාම එහි අයකරගත හැකි මුදලට පොත් කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ඒවායේ ධාරණ වටිනාකමට සාපේක්ෂව වන අතර මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේ දී එය සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් විකුණන විට දී, අනෙකුත් සංචිතවල ඇතුලත් කර ඇති වටිනාකම් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලැබේ.

### 3.2.2. නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ යනු වත්කමක් ඉදිකිරීමකට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය වේ. නොනිමි වැඩ සැලකියයුතු මට්ටමකට සම්පූර්ණ කරනු ලැබුවිට දී සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම්විට දී අදාළ වත්කම් ගිණුම්වලට මාරුකරනු ලැබේ.

### 3.2.3. මූල්‍ය වත්කම්

#### 3.2.3.1. වර්ගීකරණය

#### 3.2.3.2. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළෙඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරණ කාලසීමාව අවසානයේදී මාස 12 කට වඩා වැඩි කල්පිරීම් සඳහා හැරුණු විට, ඒවා ජංගම වත්කම්හි ඇතුලත් කරනු ලැබේ. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ශේෂ පත්‍රයේ ''වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ සහ මුදල් සහ මුදලට සමාන දේවලින්'' සමන්විත වේ. (සටහන් 3.8 සහ 3.9)

#### 3.2.5.4 පිළිගැනීම සහ මැනීම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට දැක්වෙන මූල්‍ය වත්කම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට පිළිග නු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හිලව්කොට දක්වනු ලැබේ. ආයෝජනවලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වී ඇතිවිට දී හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලැබ ඇතිවිට දී මූල්‍ය වත්කම් පිළිගැනීම අවසන් කරනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් සහ

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් පසුව සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු දෑ පසුව ක්‍රමක්ෂය කරන ලද මිලට දක්වනු ලැබේ.

''ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම්'' කාණ්ඩයේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලින් මතුවන ලාභහෝ අලාභ ඒවා මතුවන කාලසීමාව තුළ 'අනෙකුත් (අලාභ)/ලාභ - ශුද්ධ'' හි ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හෝ මුදල් නොවන සුරැකුම්පත්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් විකුණනු ලබන විටදීහෝ හානි වූ විටදී, ස්කන්ධයේ පිළිගනු ලබන සමුච්චිත සාධාරණ වටිනාකමේ ගැලපීම් 'ආයෝජන සුරැකුම්පත්වලින් ලාභ හෝ අලාභ' ලෙස ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අලෙවියට තිබෙන සුරැකුම්පත් මත පොළිය අනෙකුත් ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### 3.2.5.5 මූල්‍ය වත්කම් හානි

#### (අ) ක්‍රමක්ෂිත පිරිවැයට දැක්වෙන වත්කම්

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදී ම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන් හි (හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්ත්ගත අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මිණිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.

ණය හිමියෝ හෝ ණය හිමියන් සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් සඳහා එළඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම් හා සහසම්බන්ධ වන හිඟ මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්ත්වයන් බඳු ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මිණිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් විය හැක.

''ණය සහ ලැබිය යුතු දේ'' කාණ්ඩය සඳහා, හානියේ ප්‍රමාණය මණිනු ලබනුයේ වත්කමෙහි ධාරණ මුදල සහ මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වත්කමෙහි ධාරණ මුදල අඩුකර අලාභයේ ප්‍රමාණය පිළිගනු ලැබේ. යම් ණයක හෝ කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජනයක විචල්‍ය ණය අනුපාතයක් තිබේනම්, කිසියම් හානි අලාභ මැණීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වත්මනෙහි ක්‍රියාත්මක පොළී අනුපාතයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොල මිලක් යොදාගනිමින් සාධන පත්‍රයක සාධාරණ වටිනාකම පාදකව සංස්ථාව හානිය මැනීමට ඉඩ තිබේ.

පසුව එළඹෙන කාල සීමාවක දී, හානියෙන් සිදුවූ අලාභයේ ප්‍රමාණය අඩුවී එම අඩුවීම හානිවීම පිළිගැනීමෙන් පසු සිදුවූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම් (ණය හිමියාගේ ණය ප්‍රමාණකිරීම වැඩි දියුණුවීමක් බඳු), කළින් පිළිගත් හානිවීමේ අලාභය ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

### 3.2.5.6. වෙළඳ ලැබිය යුතු

වෙළඳ ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධිකළ හැකි වටිනාකමට දක්වනු ලැබේ. ලැබිය යුතු දෑ පිළිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලු මුදල් ප්‍රමාණ සංස්ථාවට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇතිවිට දී වෙළඳ අයවිය යුතු දේවල හානිවීම සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කෙරේ. ණය ගැතියා මුහුණදෙන සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බුන්වත් බවට පත්වීම හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළෙඳ ලැබිය යුතු දෑ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් වත්කමේ ධාරණ වියදම අඩුකරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ පිරිවැය තුළ පාඩු මුදල පිළිගනු ලැබේ. වෙළඳ ලැබීමක් එකතු කරගත නොහැකි වනවිට ලැබිය යුතු වෙළෙඳ මුදල් සඳහා දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ. කලින් කපා හරින ලද මුදල් පසුව එකතු කරගැනීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදා හැරීමේ පිරිවැයට බාරකරනු ලැබේ.

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා හානිවීම සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ.

### 3.2.6. තොග

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශකර ඇත්තේ වඩා අඩු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.

### 3.2.7. මුදල් හා මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑට අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවක් ඇති ආයෝජන සහ බැංකු අයිරා අයත් වේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ බැංකු අයිරා පෙන්නුම් කරනු ලබන්නේ ජංගම වගකීම් තුළ ණය ගැනුම් ලෙස ය.

### 3.2.8. ණය ගැනුම් පිරිවැය

ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් කිරීම සඳහා සැළකියයුතු කාලසීමාවක් ගන්නා වූ වත්කම් වන සුදුසුකම් ලබන වත්කම් අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය වෙත් සෘජුවම ආරෝපණය සාමාන්‍ය හෝ නිශ්චිත ණය ගැනුම් පිරිවැය, එකී වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සාරනුකූලව සූදානම් කරන කාලය තෙක් එම වත්කම්වලට පිරිවැයට එකතු කරනු ලැබේ.

නිශ්චිත ණය ගැනුම්හි තාවකාලික අයෝජන මත උපයනු ලැබූ ආයෝජන ආදායම, සුදුසුකම් ලබන වත්කම් මත ඒවායේ වියදම තීරණය කරන තෙක් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ඇති ණය ගැනුම් පිරිවැයෙන් අඩුකරනු ලැබේ.

අනෙකුත් සියලු ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාව තුළ ලාභ හෝ අලාභයන් හි පිළිගනු ලැබේ.

### 3.2.9. ජංගම සහ විලම්භිත බදු

මෙම කාලසීමාව තුළ බදු වියදම් සමන්විත වන්නේ ජංගම සහ විලම්භිත බදුවලිනි. ආදායම් ප්‍රකාශය තුල බදු පිළිග නු ලබන්නේ අනෙකුතු විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ගණන් ගනු ලබන අයිතමවලට ඒවා අදාළ වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයටය. මෙහිකී පිළිවෙලින් අනෙකුත් විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ද බදු ගණන් ගැනේ.

### අ. ජංගම බදුකරණය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධාන අනුව සමාගමට ජංගම බදු බැරකම් ඇතිවේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කළමනාකාරිත්වය විශ්වාස කරන යතෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශවල මේ බැරකම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ. ගනුදෙනු පිළිබඳව සංස්ථාව විසින් ගනු

ලැබූ ස්ථාවරය අදායම් අධිකාරීන් විසින් අභියෝගයට ලක් කරන අවස්ථා තිබිය හැක. මෙම කරුණු නිසා ඇතිවන කවර හෝ අතිරේක පිරිවැයක් සංස්ථාව මත බැරකම තහවුරු කරන අවස්ථාවේ බදු වියදමක් ලෙස ගිණුම් ගත කරනු ලැබේ.

සලකාබලන වසර සහ පෙර කාල සීමාවන් සඳහා ජංගම බදු වත්කම් සහ බැරකම් මණිනු ලබන්නේ ආදායම් අධිකාරියට ආපසු අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණයන්ගෙනි. ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිතා කළ බදු අනුපාත හෝ බදු නීති වනුයේ ශේෂ පත්‍ර දින වනවිට පනවනු ලබන හෝ සත්තාවීව පනවනු ලබන ඒවා ය. ජංගම බදු සඳහා ප්‍රතිපාදන පදනම් වනුයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තාකර ඇති පරිදි ආදායම් සහ වියදම් අංග පදනම්ව ය.

### ආ. විලම්භිත බදුකරණය

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මුල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු අයකළ හැකි ලාභයට බලනොපාන ගනුදෙනුවක දී වත්කම් සහ බැරකම් ආරම්භක පිළිගැනීමෙන් මතුවන තාවකාලික වෙනස්කම් සහ පූර්වේක්ෂිත අනාගතයේ ප්‍රතිවර්තනය නොවීමට ඉඩ ඇති ප්‍රමාණයට අයෝජන ආශ්‍රිත වෙනසකම් සඳහා විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. ඊට අමතරව, කීර්තිනාමය ආරම්භක පිළිගැනීම මත මතුවන බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම්

සඳහා ද විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. වාර්තාකරණ දිනය වනවිට පනවා ඇති හෝ සත්තාවීව පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය වනවිට දී යොදා ගැනීමට අපේක්ෂා කරන ලබන බදු අනුපාතයන්ට විලම්භිත බදු ගණනය කෙරේ. ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහ බදු අධිකාරීන් විසින් ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලබ්භිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනසකම් උපයෝජනය සඳහා යොදාගත හැකි අනාගත බදු අයකළ හැකි ලාභ ඇතිවිය හැකිතාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්භිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධිවීම තවදුරටත් සිදුනොවිය හැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ.

### 3.2.10. සේවක ප්‍රතිලාභ

### 3.2.10.1 .විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**අ. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය**

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් හැරුණුකොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව මූල්‍ය ප්‍රකාශනයේ පිළිගනු ලබන බැරකම වාර්තාකරණ දිනයට නිර්වචිත බැඳීමේ වත්මන් වටිනාකමයි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම නිර්ණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම වට්ටම් කිරීම මගිනි.

ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන්හි සහ ආශ්‍රිත බැරකමේ කාල සීමාවන්ට සමීප වන්නා වූ කල්පිරීමේ කාලසීමා සහිත පොළී අනුපාත භාවිතා කරමින් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (2006 ප්‍රතිශෝධිත) අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේ දී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

මෙම බැරකම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ. ආයුගණකගේ ප්‍රධාන උපකල්පනයන්ට පහත දෑ ඇතුළත් වේ.

1. පොළී අනුපාතය 11%
2. වැටුප් වර්ධක අනුපාතය 5%
3. සියලු සේවකයන්ගේ විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60

**ආ) නිර්වචිත දායක සැලසුම් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා දායක මුදල් දරන ලදවිට දී ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

### 3.2.11.රජයේ ප්‍රදාන

ප්‍රදානයට අදාළ කොන්දේසිවලට සමාගම අනුකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇත්නම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර හානිපූරණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය සමග ඒවා ගැලපීම පිණිස අවශ්‍ය කාලසීමාව මුළුල්ලේම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම්වල ඇතුලත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම්වල අපේක්ෂිත ආයුකාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

ක්‍රමක්ෂය අනුපාත පහත පරිදි වේ:

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 7% |
| ශ්‍රව්‍ය සංඛ්‍යාන උපකරණ | 7.5% |

| | |
|---|---|
| ගෘහ භාණ්ඩ,සවිකිරීම් සහ උපකරණ | 10% |
| සම්ප්‍රේෂක | 7.5% |
| රථ වාහන | 25% |
| පරිගණක උපකරණ | 50% |

**3.2.12. ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සතුවීටදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යැමක් අවශ්‍යවීම සිදුවිය හැකිවිටක දී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදුකළ හැකිවිට දී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

**3.2.13. අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්**

අසම්භාව්‍ය බැරකමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් හට ගැනීම හෝ හට නොගැනීම මගින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් හෝ එකී බැඳීමෙන් නිදහස් වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීම සඳහා සම්පත් බැහැරට ගලා යැමක් සිදුවීමේ හැකියාවක් නැති නිසා පිළිනොගැනෙන වර්තමාන බඳීමකින් හෝ පැන නැගීමට හැකියාවක් ඇති බැඳීමකි. විශ්වසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින බෙහෙවින් දුර්ලභ අවස්ථාවල දී ද බැරකමක් හඳුනා නොගන්නා නමුත් එවැන්නක පැවැත්ම මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හට ගැනීමෙන් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් පැන නැගීමට ඉඩ ඇති වත්කමකි. සංස්ථාව අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලා ඒම් සිදුවිය හැකි වුවත් එය සැබවින්ම ස්ථිර නොවන අවස්ථාවල දී එවැනි දේවල පැවැත්ම අනාවරණය කරයි.

**3.2.14. වෙළෙඳ ගෙවිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීම් ය. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් තුළ හෝ ඊට අඩු කාලයක් තුළ නම් (හෝ ඊට වඩා කාලය දිගුවේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ දී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

**3.2.15. මූල්‍ය කල්බදු බැඳීම්**

කල්බදු ගත් අයිතමවල හිමිකමට ආනුෂංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස සංස්ථාවට පවරන්නා වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපල, පිරියත හා උපකරණ කල්බද්ද ආරම්භයේ දී කල්බදු ගත් දේපලේ සාධාරණ වටිනාකමට හෝ වඩා අඩුනම් සමුච්චිත ක්ෂයවීම අඩුකොට ආරම්භයේ දී අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනායිත කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු පොළිය අවිනිශ්චිත පොළියක් සේ ගිණුම්ගත කරනු ලැබේ. අනුරූපී ණය බදුදීමනාකරුට ගෙවිය යුතු මුදලක් සේ වාර්තා කරනු ලැබේ. ගෙවන ලද වාරික බැරකම අඩුකිරීම සඳහා යොදා ගනු ලැබේ.

වර්ෂයට අයකරන පොලිය පොලී සඳහා වන අවිනිශ්චිත ගිණුමෙන් ආදයම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ.

**3.2.16. ආදායම් ප්‍රකාශනය**

**3.2.16.1. ආදායම පිළිගැනීම**

ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම ගණන් ගනු ලබන අතර සපයන ලද සේවා සඳහා ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර වට්ටම් සහ වටිනාකම එකතු කළ බදු අඩුකොට සදහන් කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වසනීය ලෙස මැණිය හැකිවිට දී, අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ප්‍රවාහයවීමට ඉඩ ඇතිවිට දී, සහ සංස්ථාවේ එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇතිවිට දී සංස්ථාව ආදායම පිළිගනියි. පහත විස්තර කර ඇති පරිදි, ගනුදෙනුකාර වර්ගය, ගනුදෙනු වර්ගය සහ එක් එක් සැකසුමේ නිශ්චිත තොරතුරු සැලකිල්ලට ගනිමින් සංස්ථාව සිය ප්‍රතිලාභ ඇස්තමේන්තු ඓතිහාසික ප්‍රතිඵල මත පදනම්කර ගනී.

(අ) ගුවන් කාලය අළෙවි කිරීම

ආදායම ගුවන් කාලය විකිණීමෙන් සමන්විත වෙයි. වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන ගුවන් කාලය විකිණීමෙන් ලබන ආදයම මෙසේ පිළිගනු ලැබේ.

(ආ) පොළී ආදායම

එකතුකර ගැනීමට හැකි බව පිළිබඳ සැකයක් ඇත්නම් මිස කාල පදනමින් උපචිත වූ පොළිය (වත්කමේ සඵල ඵලදාව සැලකිල්ලට ගනිමින්) පොළී ආදායම ලෙස පිළිගනු ලැබේ.

(ඇ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් මුදල් දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම සැසඳීමෙන් වන අතර ආදයම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

(ඈ) වෙනත් ආදායම්

අනෙකුත් සියලු ආදායම් පිළිගනු ලබන්නේ උපචිත පදනම මතය.

3.2.17.1. වියදම් පිළිගැනුම

අ) මෙහෙයුම් වියදම්

ආදායම් ප්‍රකාශයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර ඍජු සබඳතා පදනම මතය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේ දී දරනු ලබන සියලු වියදම් වර්ෂයේ ලාභ/පාඩු නිගමනය කිරීමේදී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා සියලු බැරකම් සහ දේපල, පිරියත හා උපකරණ මත ක්ෂයවීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

ආ) මූල්‍ය වියදම්

පොළී ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ණයගැනුම් පිරිවැය ඒවා දරන ලද කාලසීමාවේ දී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.2.18. තුලනාත්මක සංඛ්‍යා

අවශ්‍ය අවස්ථාවල දී ප්‍රවර්තන වර්ෂය තුළ කරනු ලබන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වනු පිණිස තුලනාත්මක සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තාකර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. කෙසේ වෙතත් මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාව, අනාගත කාල සීමාවන්හි සිදුකරනු ලබන වත්කම් හෝ බැරකම්වල ධාරණ වටිනාකමට ද්‍රව්‍යමය වෙනස්කම් අවශ්‍ය කරන්නා වූ ප්‍රතිඵල ඇතිකිරිමට හැක.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් පහසුවෙන් හඳුනාගත නොහැකි වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය බැරකම්වල ධාරණ ප්‍රමාණ පිළිබඳ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමේ දී පදනම සකස් කරන්නා වූ අවස්ථානුගත තත්වයන් යටතේ සාධාරණයැයි විශ්වාස කරනු ලබන අනෙකුත් විවිධ සාධකවල ප්‍රතිඵල මත පදනම් වී ඇත.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, එකී ප්‍රතිශෝධන වත්මන සහ අනාගත කාලසීමා සඳහා බලපාන්නේ නම් එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාල සීමාවේ දී පිළිග නු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත යොදා ගැනීමේ දී කළමනාකාරිත්වය විසින් සිදුකරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළ හැක.

(අ) විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිත කරමින් ආයුගණක පදනමක් මත නිර්ණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම)

නිශ්චය කිරීමේ දී යොදාගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය ඇතුලත් වේ. මෙම උපකල්පනයන්හි කවර හෝ වෙනසක් විශ්‍රාම වැටුප් බැඳීම්වල ධාරණ මුදල් ප්‍රමාණය කෙරෙහි බලපානු ඇත.

උචිත වට්ටම් අනුපාතය සෑම වසරක් අවසානයේදීම සංස්ථාව නිශ්චය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් බැඳීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන අනාගත මුදල් ගලායාම්හි වර්තමාන වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතා කළ යුතු පොළී අනුපාතය වන්නේ මෙයයි. උචිත වට්ටම් අනුපාතය නිශ්චය කිරීමේ දී සංස්ථාව ආයතනික බැඳුම්කරවල පොළී අනුපාත සැලකිල්ලට ගනියි. විශ්‍රාම වැටුප් බැඳීම් අනෙකුත් ප්‍රධාන උපකල්පන වත්මන් වෙළෙඳපොල තත්වයන් මත ද අර්ධ වශයෙන් පාදක වේ.

**(ආ) ආදායම් බදු**

සංස්ථාව ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය නිශ්චය කිරීමේ දී සැළකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇති අතර ඒ සඳහා අවසාන බදු නිශ්චය කිරීම අවිනිශ්චිතය. අතිරේක බදු ලැබීමට නියමිත ද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පාදකව අපේක්ෂිත බදු විගණන ගැටලු සඳහා සංස්ථාව බැරකම් පිළිගනු ලැබේ. මෙම කරුණුවල අවසාන බදු ප්‍රතිඵලය ආරම්භයේ දී වාර්තා කළ ප්‍රමාණයන්ට වඩා වෙනස්වනවිට දී, එම වෙනස්කම් එවැනි නිශ්චයකිරීම් සිදුකරනු ලැබූ කාලසීමාව තුළ ජංගම සහ විලම්භිත ආදායම් බදු වත්කම් සහ බැරකම් කෙරෙහි බලපානු ඇත.

## 5. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 5.1. මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් එය මූල්‍ය අවදානම් මිශ්‍රණයකට නිරාවරණය කරයි, වෙළඳපොළ අවදානම, (ව්‍යවහාර මුදල්, සාධාරණ වටිනාකම පොළී අනුපාත අවදානම, මුදල් ප්‍රවාහ පොළී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළුව) ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම ඒ අතර වේ. සංස්ථාවේ සමස්ත ණය කළමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය මත අහිතකර බලපෑම් ඇතිකළ හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඉලක්කගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කළමනාකරණය සිදුකරනු ලැබේ.

**අ) වෙළඳපල අවදානම්**

**(i) විදේශ විනිමය අවදානම**

සංස්ථාව තමන්ට අවශ්‍ය උපකරණ ජාත්‍යන්තරව ආනයන කරන අතර මූලිකවම ඇමෙරිකානු ඩොලර්වලට අදාළව ව්‍යවහාර මුදල් නිරාවරණයන්ගෙන් මතුවන විදේශ විනිමය අවදානම්වලට නිරාවරණය වේ. අනාගත වාණිජ ගනුදෙනුවලින් සහ පිළිගත් වත්කම් සහ බැරකම්වලින් මතුවන සිය විදේශ විනිමය අවදානම් කළමනාකාරණය කිරිම පිණිස සමාගම දේශීය නියෝජිතයන් සමග ගිවිසුම්වලට එළඹේ.

**(ii) මිල අවදානම**

වෙළෙඳ භාණ්ඩ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ප්‍රධාන සැපයුම්කරුවන සමග ගිවිසුම්වලට එළඹීම මගින් සංස්ථාව අවදානම් අවම කරයි.

**(iii) ණය අවදානම්**

ණය අවදානමට නිරාවරණය වනුයේ මුලිකවම වෙළඳ ලැබිය යුතු දෑ වලින් වන අතර සේවා සැපයීමට පෙර සිය නව ගනුදෙනුකරුවන් සෑම කෙනෙකුම සඳහාම ණය අවදානම කළමනාකරණය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ වගකීම සංස්ථාව සතුය.

ණය අවදානම මතුවනුයේ මුදල් හා මුදලට සමාන දෑ, බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ලැබිය යුතු දෑ සහ වාණිජ ගනුදෙනු වෙත ණය නිරාවරණයවීම් මගිනි. බැංකු සහ මූල්‍ය ආයතන සඳහා, ස්වාධීනව ශ්‍රේණිගත කරනු ලැබූ අවම වශයෙන් 'ඒ' ශ්‍රේණිගත කිරීම සහිත පාර්ශව පමණක් පිළිගනු ලැබේ. අවදානම් පාලනය ගනුදෙනුකරුගේ මූල්‍ය තත්වය, අතීත අත්දැකීම් සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් ණය ගුණත්වය තක්සේරු කරනු ලැබේ. අභ්‍යන්තර හෝ බාහිර ශ්‍රේණිගත කිරීම් මත පාදකව කේවල ණය සීමා පනවනු ලැබේ. ණය සීමා උපයෝජනය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.

**(iv) ද්‍රවශීලතා අවදානම්**

සංස්ථාව විසින් මූල්‍ය පූර්වකථනය සිදුකරනු ලබන අතර සංස්ථාවේ ද්‍රවශීලතා අවශ්‍යතා සහතික කිරීම

පිණිස නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. එබඳු පූර්වකථනයන්හිදී සංස්ථාවේ ණය මූල්‍යකරණ සැලසුම්, ප්‍රඥප්ති අනුකූලතාව සැලකිල්ලට ගනු ලැබේ. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය කරනු ලබන ශේෂයට වඩා සහ ඉහළින් සංස්ථාව විසින් රඳවාගෙන ඇති අතිරික්ත මුදල්, බැඳීම් සපුරාලීම සඳහා යෝග්‍ය කල්පිරීම් සහිත පොළී ආදායම් උපයනු පිණිස කාල තැන්පතුවලට මාරු කරනු ලැබේ.

## 6. ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

| සබඳතාවයේ නම | තනතුර | ගනුදෙනුවේ ස්වභාවය |
|---|---|---|
| සුදර්ශන ගුණවර්ධන මයා | සභාපති | නැත |
| ඩබ්ලිව්. ජයසිරි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| ධනුෂ්ක රාමනායක මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| සිදික් එම් ෆාරුක් මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| එම්.ජේ.ආර්. ඩේවිඩ් මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |

සටහන 1
ආදායම

| විස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම | 2015 අනුමත |
|---|---|---|---|---|
| ආසියානු සේවයේ ගුවන් කාලය විකිණීම | 11,891,588 | 10,495,376 | 32,648 | 10,462,728 |
| T.W.R. ගුවන් කාලය විකිණීම | 87,816,670 | 86,026,727 | | 86,026,727 |
| ප්‍රාදේශීය සේවයේ ගුවන් කාලය විකිණීම | 413,116,481 | 387,970,032 | 2,123,196 | 385,846,836 |
| නිෂ්පාදන ගාස්තු - දේශීය සේවය | 4,986,309 | 4,668,083 | | 4,668,083 |
| මරණ දැන්වීම් | 4,096,908 | 3,992,713 | | 3,992,713 |
| FEBA ගුවන් කාලය විකිණීම | 2,128,630 | 2,084,309 | | 2,084,309 |
| | **524,036,586** | **495,237,240** | **2,155,844** | **493,081,396** |

සටහන 2
විකුණුම් පිරිවැය

| විස්තරය | 2016 | 2015 |
|---|---|---|
| වැටුප්, වේතන සහ දීමනා | 313,401,377 | 298,565,304 |
| සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල | 32,696,029 | 31,311,333 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 6,253,413 | 6,277,520 |
| ප්‍රවාහන සහ යැපුම් දීමනා | 729,201 | 742,040 |
| වැඩසටහන් වියදම | 3,555,709 | 7,894,294 |
| සහන පදනම මත සේවය කළ කාර්ය මණ්ඩලය | 6,213,542 | 10,147,325 |
| වාහන කුලී ගාස්තු | 3,975,371 | 4,044,015 |
| නඩත්තු පිරිවැය | 4,742,199 | 3,970,502 |
| සම්බන්ධ කිරීමේ ගාස්තු | 6,111,988 | 6,632,652 |
| විදුලිය | 110,756,554 | 95,784,174 |
| | **488,435,383** | **465,369,159** |

සටහන - 3
වෙනත් මෙහෙයුම් ආදායම්

| විස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම | 2015 අනුමත |
|---|---|---|---|---|
| ණය සඳහා පොලිය | 4,209,640 | 3,207,498 | | 3,207,498 |
| විවිධ ආදායම් (වෙනත්) | 51,290,473 | 61,524,497 | 2,337,892 | 59,186,605 |
| ආපසු හරවා එවූ චෙක්පත් සඳහා ප්‍රචාරණ නියෝජිතයන්ගෙන් දඩ | 469,884 | 21,062 | | 21,062 |
| නිවාස කුලී | 111,863 | 160,390 | | 160,390 |
| සංචාරක බංගලා වලින ආදායම | 435,000 | 0 | | |
| විශේෂ පටිගත කිරීම් | 546,683 | 181,479 | | 181,479 |
| ආනයනකරුවන්, ගනුදෙනුකරුවන් හට බලපත්‍ර ලබා දීම | 7,890,389 | 7,336,343 | | 7,336,343 |
| කැසට්පට අලෙවිය | 1,852,360 | 4,721,083 | | 4,721,083 |
| දඩ ගිණුම | 1,900 | 1,171,160 | | 1,171,160 |
| අඹේවෙල සංචාරක බංගලාවෙන් ලබන ආදායම | 172,596 | 80,053 | | 80,053 |
| ප්‍රකාශන විකුණුම් | 55,545 | 341,360 | | 341,360 |
| ත්‍රිකුණාමලය ව්‍යාපෘතියෙන් ආදායම | 140,731,469 | 152,703,817 | | 152,703,817 |
| මුළු ආදායම | **207,767,804** | **231,448,742** | **2,337,892** | **229,110,850** |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | 67,476,968 | 57,975,190 | | 57,975,190 |
| ත්‍රිකුණාමලය ප්‍රදාන ක්‍රමක්ෂය | 155,406,674 | 177,769,097 | | 177,769,097 |
| එකතුව | **222,883,642** | **235,744,287** | **-** | **235,744,287** |
| මුළු එකතුව | **430,651,446** | **467,193,029** | **2,337,892** | **464,855,137** |

සටහන - 3.1
රජයේ ප්‍රදාන

| විස්තරය | 2016 | 2,015.00 |
|---|---|---|
| බලපත්‍ර ගාස්තු සඳහා රජයේ ප්‍රදාන | 365,000,000 | 350,000,000.00 |
| | 365,000,000 | 350,000,000.00 |

3.1) ගුවන්විදුලි බලපත්‍ර වෙනුවෙන් ප්‍රදානයක් වශයෙන් රජයෙන් රුපියල් මිලියන 365 ක් ලැබී ඇත..

සටහන 04
බෙදාහැරීමේ
(සේවා සැපයීම) පිරිවැය

| විස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම් | 2015 අනුමත |
|---|---|---|---|---|
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම | 4,312,221 | 1,313,059 | | 1,313,059 |
| ගුවන්කාලය විකිණීම (දේශීය) වෙනුවෙන් කොමිස් මුදල් | 58,729,448 | 55,605,185 | | 55,605,185 |
| ගුවන් කාලය විකිණීම (විදේශීය) වෙනුවෙන් කොමිස්මුදල් | 805,014 | 733,480 | | 733,480 |
| බොල් ණය සහ අඩමාන ණය සඳහා විධිවිධාන | 5,743,906 | 3,629,927 | (145,217) | 3,775,144 |
| වැඩසටහන් වියදම (ක්‍රිකට් සහ කලා) | 11,777,168 | 23,632,059 | 11,249,290 | 12,382,769 |
| | **81,367,757** | **84,913,710** | **11,104,073** | **73,809,637** |

සටහන 5.
වෙනත් මෙහෙයුම් පිරිවැය

| විස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම | 2015 අනුමත |
|---|---|---|---|---|
| බාහිර විකාශන ආයතන වෙත දායකත්වය | 788,302 | 714,622 | | 714,622 |
| ප්‍රවෘත්ති සේවා සහ ප්‍රවෘත්ති සාරාංශ | 954,240 | 1,121,260 | | 1,121,260 |
| වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණය | 910,724 | 727,186 | | 727,186 |
| විදුලිය සහ බලශක්තිය | 5,332,455 | 13,367,556 | 340,119 | 13,027,437 |
| තැපැල් ගාස්තු සහ දුරකථන ගාස්තු | 14,183,473 | 12,826,646 | | 12,826,646 |
| මුද්‍රණ කටයුතු සහ ලිපිද්‍රව්‍ය | 3,835,166 | 3,445,171 | | 3,445,171 |
| මෝටර් රථවාහන ධාවන වියදම් | 13,123,058 | 15,468,658 | | 15,468,658 |
| විකාශන උපකරණ අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව | 10,869,464 | 406,319 | | 406,319 |
| සංගීත උපකරණ අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව | 140,000 | 0 | | |
| දැවභාණ්ඩ සහ මෙවලම් අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව | 3,957,408 | 2,780,420 | | 2,780,420 |
| ගොඩනැගිල්ල සහ ගෙවත්ත අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව | 9,158,706 | 4,740,838 | | 4,740,838 |
| ක්ෂයවීම් | 45,687,595 | 43,621,211 | | 43,621,211 |
| ක්ෂයවීම් - ත්‍රිකුණාමලය | 158,236,740 | 182,364,130 | | 182,364,130 |
| ත්‍රිකුණාමලය වියදම් | 85,722,520 | 88,143,179 | | 88,143,179 |
| බදු අයකිරීම් (ESC) | 916,796 | 1,627,119 | (180,246) | 1,807,365 |
| NBT වියදම් | 9,477,157 | 0 | | |
| වාහන කුලී ගාස්තු | 3,152,698 | 284,140 | | 284,140 |
| මුද්දර ගාස්තු | 46,550 | 108,421 | | 108,421 |
| රේඩියෝ සංඛ්‍යාත ගාස්තු | 9,713,193 | 15,000,000 | - | 15,000,000 |
| | **376,206,243** | **386,746,874** | **159,873** | **386,587,001** |
| | | | | |

සටහන 06
පරිපාලන පිරිවැය

| වස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම | 2015 අනුමත |
|---|---|---|---|---|
| දීමනා - සංස්ථාවේ සභාපති සහ සාමාජිකයන් | 977,000 | 800,000 | | 800,000 |
| වැටුප්, වේතන සහ දීමනා | 177,644,083 | 185,115,252 | | 185,115,252 |
| සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල | 23,370,923 | 24,130,194 | | 24,130,194 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 4,965,963 | 4,810,786 | | 4,810,786 |
| කාර්යමන්ඩලය සඳහා අතිකාල දීමනා | 21,287,568 | 21,818,873 | | 21,818,873 |
| සහන පදනම මත සේවය කරන කාර්ය මණ්ඩලය | 11,556,015 | 14,754,425 | | 14,754,425 |
| කොන්ත්‍රාත් කාර්යමණ්ඩලය සඳහා වේතන | 37,881,678 | 17,520,166 | | 17,520,166 |
| කාර්ය මණ්ඩල පුහුණු ගාස්තු (දේශීය) | 25,500 | 0 | | |
| ප්‍රවාහන සහ යැපුම් දීමනා (දේශීය සහ විදේශීය) | 2,848,980 | 1,806,463 | | 1,806,463 |
| නිවාඩු ගාස්තු | 1,960,928 | 2,624,761 | | 2,624,761 |
| පාරිතෝෂික | 21,300,257 | 23,335,178 | | 23,335,178 |
| සභාපතිවරයා විසින් සත්කාරක සේවා සැපයීම | 472,773 | 392,416 | | 392,416 |
| අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සත්කාරක සේවා සැපයීම | 104,740 | 100,380 | | 100,380 |
| ශුභසාධන වියදම් | 1,737,466 | 1,035,829 | | 1,035,829 |
| වෛද්‍ය සේවා | 191,023 | 189,686 | | 189,686 |
| පොදු ගාස්තු | 964,946 | 1,901,027 | | 1,901,027 |
| පෞද්ගලික ආරක්ෂක සේවය | 538,050 | | | |
| කුලී අනුපාතය සහ බදු | 6,078,588 | 7,544,056 | | 7,544,056 |
| රක්ෂණ ගාස්තු | 443,912 | 2,311,495 | | 2,311,495 |
| විගණන ගාස්තු | 550,000 | 600,000 | | 600,000 |
| නෛතික ගාස්තු | 1,108,418 | 1,551,475 | | 1,551,475 |
| ප්‍රකාශන සහ වාර සඟරා | 692,063 | 477,845 | | 477,845 |
| පාරිතෝෂික, නඩු සහ වෙනත් කටයුතු සඳහා දණ්ඩන | 462,037 | 862,602 | | 862,602 |
| | **317,162,912** | **313,682,908** | **-** | **313,682,908** |

6.1) 2016 වසරේදී කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ඥාතීන්ගේ මරණ දැන්වීම් විකාශනය කිරීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් රු. 823,262.3 ක වියදමක් දරා ඇත. දැනට ක්‍රියාත්මකව පවතින අනුමත පරිපාටියට අනුකූලව මෙම දැන්වීම් විකාශනය කොට ඇත. සෑම වසරකම සංස්ථාව විසින් අනුගමනය කරනු ලබන පිළිවෙත මෙයයි.

තීන්දු ලබා දීමට නියමිතව පවත්නා නඩු - 2016 වසරේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු දෙකක් විභාග වෙමින් පැවතුණි. එක් නඩුවක තත්ත්වය පහත පරිදි වේ. මෙය DC නඩුවේ පැමිණිලිකරු හට නීතිමය පොළිය. සහිතව රු. 10,000,000/) ක මුදලක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ලබා දුන් අංක 23089/MR දරණ D'C' නඩුවේ විනිශ්චය ඉවතලෑම සඳහා සංසථාව විසින් ගොනු කරන ලද අභියාචනයකි. එක් නඩුවක් අභියාචනාධිකරණයේ තවමත් විභාග වෙමින් පවතී. එය සංස්ථාව විසින් ගොනු කොට ඇත්තේ අංක 64296/ දරණ M'C නඩුව සඳහා ලබා දී ඇති විනිශ්චය ඉවත ලෑම සඳහා යි.

මහාධිකරණයේද නඩු දෙකක් විභාග වෙමින් පවතී. තවත් නඩු පහක් දිස්ත්‍රික් අධිකරණයේ විභාග වෙමින් පවතින අතර නඩු දෙකක තත්ත්වය පහත පරිදි වේ. එක නඩුවක් මගින් මිලියන 8 ක් සහ පොලිය ඉල්ලා සිටින අතර අනෙක් නඩුව මගින් ඇ.ඩොලර් 26775 කින් 10%ක කොමිස් මුදලක් සහ රු. 5,917,275 සහ පොළිය ඉල්ලා සිටිනු ලැබේ. මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 3 ක් විභාගවෙමින් පවතින අතර කම්කරු දෙපාර්තමේන්තු විනිශ්චය යටතේ නඩු 2 ක් පවතී.

සටහන 07
මූල්‍ය පිරිවැය

| විස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම | 2015 අනුමත |
|---|---|---|---|---|
| බැංකු ගාස්තු | 461,014 | 480,945 | | 480,945 |
| OD පොලිය | 4,600,117 | 4,461,314 | | 4,461,314 |
| හුවමාරු මත ලැබීම් / (පාඩුවීම්) | 265,004 | 176,576 | | 176,576 |
| ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා කොමිස් | 52,969 | 49,562 | | 49,562 |
| කල්බදු පොලිය | 176,345 | 1,045,145 | | 1,045,145 |
| | **5,555,448** | **6,213,541** | **-** | **6,213,541** |

සටහන 08
8 (i) ආදායම් බදු

| | 2016 | 2015 |
|---|---|---|
| ගිණුම් අනුව ශුද්ධ ලාභය / පාඩුව | **(314,039,711)** | **(287,725,712)** |
| එකතු කිරීම | | |
| ඉඩදිය නොහැකි වියදම් | | |
| ක්ෂයවීම් | 45,687,595 | 43,621,211 |
| ක්ෂයවීම් - ත්‍රිකුණාමලය | 158,236,740 | 182,364,130 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 5,743,906 | 3,629,927 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 21,300,257 | 23,335,178 |
| සත්කාරක සේවා | 577,513 | 492,796 |
| ආර්ථික සේවා ගාස්තු | 916,796 | 1,627,119 |
| | **232,462,806** | **255,070,361** |
| අඩු කිරීම : | | |
| ඉඩදිය හැකි වියදම් | | |
| ප්‍රාග්ධන දීමනා | 182,631,352 | 132,192,315 |
| කල්බදු වාරික | 4,885,634 | 9,092,168 |
| පාරිතෝෂික ගෙවීම් | 19,039,367 | 6,668,767 |
| | **206,556,353** | **147,953,250** |
| බදු අයකළ හැකි ලාභය / (පාඩුව) | (288,133,257) | (180,608,601) |
| ඉදිරියට ගෙන ආ බදු පාඩුවීම් / (අලාභ) | (3,105,900,013) | (2,925,291,412) |
| ඉදිරියට ගෙන ආ සමස්ත බදු පාඩුවීම් | (3,394,033,271) | (3,105,900,013) |
| ආදායම්බදු සඳහා ප්‍රතිපාදන | | |

ආදායම් තුළින් ලබාගනු ලබන ලාභය මත 28% ක අනුපාතයකින් ආදායම් බදු ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සංස්ථාවේ ගලපන ලද බදු පැණවිය හැකි ලාභ මත පදනම්ව ආදායම් බදු පිළිබඳ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශ තුළින් සලසා ඇත.

ii. විලම්භිත (ප්‍රමාදවූ) බදු පැනවීම ගණනය කිරීම සහ LKAS 12 පරිදි විලම්භිත (ප්‍රමාද වූ) බදු පැනවීම හඳුනාගැනීම සලකා බැලීම

විලම්භීත බදු වත්කම් සහ වගකීම්

| මූල්‍ය ස්ථාවරය | 2016 | 2015 |
|---|---|---|
| විලම්භිත බදු වගකීම් | 70,970,003 | 75,733,399 |
| විලම්භීත බදු වත්කම් | (1,277,887) | 409,678 |
| ශුද්ධ විලම්භිත බදු වගකීම් | 69,692,116 | 76,143,077 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | | |
| විලම්භීත බදු වගකීම් | | |
| විලම්භිත බදු වත්කම් | 4,763,396 | 10,130,792 |
| ශුද්ධ විලම්භීත ආදායම් බදු ආදායම | 1,687,565 | (1,354,783) |
| (වියදම්) | 6,450,961 | 8,776,009 |

දේපොල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ශ්‍රී.ලං.ශු.ස.

| දළ ධාරණ ගිණුම පිරිවැය | 01.01.2016 දින වන විට ශේෂය . | අතිරේක/ හුවමාරු රු | බැහැරකිරීම් / හුවමාරු රු | 31.12.2016 දින වන විට ශේෂය රු | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 01.01.2016 රු | කාලප්‍රමාව සඳහා අය කිරීම් රු | පෙර වසරේ ගැලපුම් | ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන රු 31.12.2016 | 31.12.2016 දින වන විට NBW රු |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම | 7,764,234 | - | | 7,764,234 | | | | | 7,764,234 |
| ගොඩනැගිල්ල | 168,923,977 | 4,705,920 | | 173,629,897 | 119,530,139 | 3,845,534 | - | 123,375,673 | 50,254,224 |
| යන්ත්‍රෝපකරණ - යන්ත්‍රසූත්‍ර | 594,772,760 | 47,001,466 | | 641,774,226 | 482,088,168 | 6,552,600 | (22,396) | 488,618,372 | 153,155,855 |
| සංගීත භාණ්ඩ | 7,241,190 | 0 | | 7,241,190 | 6,753,870 | 68,092 | - | 6,821,962 | 419,228 |
| මෝටර් වාහන | 42,770,829 | | | 76,715,695 | 64,194,333 | 2,609,885 | 6,074,886 | 72,879,104 | 3,836,592 |
| මූල්‍ය කල්බදු මත වත්කම් - මෝටර් වාහන | 33,744,857 | | | 0 | | - | - | | |
| දැව භාණ්ඩ , සවිකුරු | 132,199,390 | 1,586,806 | | 133,786,196 | 111,538,295 | 3,919,132 | (1,013) | 115,456,415 | 18,329,781 |
| පටිගත කිරීමේ හා ටේප්පඩි | 24,924,749 | 0 | | 24,924,749 | 24,780,117 | 108,703 | - | 24,888,820 | 35,929 |
| ශ්‍රවණ සංඛ්‍යාතය | 881,100,296 | 4,233,223 | | 885,333,519 | 735,228,332 | 8,977,449 | - | 744,205,781 | 141,127,738 |
| සම්ප්‍රේෂක | 1,413,748,369 | 96,083,657 | | 1,509,832,026 | 977,880,528 | 17,782,708 | - | 995,663,236 | 514,168,790 |
| පරිඝනක උපකරණ | 36,661,492 | 7,047,970 | | 43,709,462 | 33,885,681 | 1,808,975 | (18,150) | 35,676,506 | 8,032,956 |
| පුස්තකාල පොත් | 462,342 | - 10,752 | | 451,590 | | | - | | 451,590 |
| මෙවලම් (ආම්පන්න) | 107,675 | 38,708 | | 146,384 | 103,570 | 14,516 | - | 118,086 | 28,298 |
| | **3,344,422,161** | **160,687,000** | **0** | **3,505,309,170** | **2,555,983,033** | **45,687,594** | **6,033,327** | **2,607,703,954** | **897,605,216** |

දේපොල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ * ත්‍රිකුණාමලය

| දළ ධාරණ ගිණුම පිරිවැය | 01.01.2016 දින වන විට ශේෂය . | අතිරේක/ හුවමාරු රු | බැහැරකිරීම් / හුවමාරු රු | 31.12.2016 දින වන විට ශේෂය රු | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 01.01.2016 රු | කාලසීමාව සඳහා අය කිරීම් රු | පෙර වසරේ ගැලපුම් | ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන රු 31.12.2016 | 31.12.2016 දින වන විට NBW රු |
|---|---|---|---|---|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍රසූත්‍ර | 178,758,308 | 89,000 | | 178,847,308 | 60,969,527 | 13,407,986 | 7,342,036 | 67,035,477 | 111,811,831 |
| මෝටර් වාහන | 4,344,000 | | | 4,344,000 | 4,344,000 | | | 4,344,000 | - |
| දැව භාණ්ඩ, සවිකුරු | 2,839,794 | | | 2,839,794 | 968,575 | 212,985 | 116,638 | 1,064,923 | 1,774,871 |
| කාර්යාල උපකරණ | 7,782,753 | | | 7,782,753 | 3,539,310 | 778,275 | 426,207 | 3,891,378 | 3,891,375 |
| ජෙනරේටර් යන්ත්‍ර | 206,429,150 | | | 206,429,150 | 70,405,921 | 15,482,186 | 8,478,239 | 77,409,868 | 129,019,282 |
| ශ්‍රවණ සංඛ්‍යාතය | 53,354,383 | | | 53,354,383 | 17,314,100 | 4,001,578 | 2,069,330 | 19,246,348 | 34,108,035 |
| සම්ප්‍රේෂක | 1,485,042,006 | 17,903,608 | | 1,502,945,613 | 500,671,483 | 112,065,803 | 60,076,385 | 552,660,901 | 950,284,712 |
| පරිගණක උපකරණ | 52,624,075 | | | 52,624,075 | 61,488,629 | | 8,864,554 | 52,624,075 | - |
| මෙවලම් (ආම්පන්න) | 4,632,471 | | | 4,632,471 | 1,580,008 | 347,435 | 190,267 | 1,737,176 | 2,895,295 |
| උපකරණ | 159,206,556 | | | 159,206,556 | 53,885,237 | 11,940,492 | 6,406,589 | 59,419,140 | 99,787,416 |
| | **2,155,013,496** | **17,992,608** | - | **2,173,006,103** | 775,166,790 | 158,236,740 | 93,970,245 | **839,433,285** | **1,333,572,818** |

ත්‍රිකුණාමලය - අස්පෘශ්‍ය වත්කම්

| දළ ධාරණ ගිණුම පිරිවැය | 01.01.2016 දින වන විට ශේෂය . | අතිරේක/ හුවමාරු රු | බැහැරකිරීම් / හුවමාරු රු | 31.12.2016 දින වන විට ශේෂය රු | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 01.01.2016 රු | කාලසීමාව සඳහා අය කිරීම් රු | පෙර වසරේ ගැලපුම් | ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන රු 31.12.2016 | 31.12.2016 දින වන විට NBW රු |
|---|---|---|---|---|---|---|---|---|---|
| ත්‍රිකුණාමලය පරිගණක මෘදුකාංග ව්‍යාපෘතිය | 12,124,157 | | | 12,124,157 | 9,093,118 | 3,031,039 | | 12,124,157 | - |

සටහන 10
නොනිම් ප්‍රාග්ධන වැඩ

| ක්ෂයවීම් | 2016 | 2015 |
|---|---|---|
| නොනිම් ප්‍රාග්ධන වැඩ | 187,825,197 | 254,571,510 |
| | **187,825,197** | **254,571,510** |

සටහන 11
සමාගම ලංකා පුවත් සමාගම තුළ රුපියල් මිලියනයක් ආයෝජනය කරන ලදී.

| ක්ෂයවීම් | 2016 | 2015 |
|---|---|---|
| ලංකා පුවත් සමාගමේ ආයෝජනය | **1,000,000** | **1,000,000** |

සටහන 12
වෙළඳ කටයුතු සහ වෙනත් ලැබිය යුතු මුදල්

| විස්තරය | 2016 | 2015 ට ගලපන ලද | ගැලපීම | 2015 අනුමත කරන ලද |
|---|---|---|---|---|
| ණයකරුවන්ගේ ගුවන් කාලය | 219,103,192 | 183,906,920 | (1,681,530) | 185,588,450 |
| අඩු : මූල්‍ය වත්කම් පිළිබඳ දෝෂ | (109,557,306) | (103,813,400) | 145,217 | (103,958,617) |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 7,116,214 | 7,014,067 | | 7,014,067 |
| කාර්ය මණ්ඩලය සඳහා වෙනත් අත්තිකාරම් | 8,044,798 | 8,052,588 | | 8,052,588 |
| කාර්යමණ්ඩල ණයකරුවන් E.P.F. | 306,530 | 316,917 | | 316,917 |
| මුලින් ගෙවන ලද ගෙවීම් | 1,071,399 | 22,008 | | 22,008 |
| සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ගෙවීම | 8,000,713 | 8,253,223 | | 8,253,223 |
| සුළු ණයකරුවන් | 22,751,513 | 21,550,080 | (577,650) | 22,127,730 |
| අගරු චෙක්පත් | 4,061,217 | 3,306,373 | | 3,306,373 |
| P.M.G. ජංගම ගිණුම - මරණ දැන්වීම් | 7,997,854 | 7,997,854 | | 7,997,854 |
| ලක්හඬ සමග ශාඛා ගිණුම | 12,807,862 | 12,807,862 | | 12,807,862 |
| G.S.T. පාලන ගිණුම | 237,267 | 237,267 | | 237,267 |
| ලැබිය යුතු ආදායම (වෙනත්) | 39,577,344 | 36,737,676 | 5,482,104 | 31,255,572 |
| රැඳවුම් බදු (ආදායම) | 33,499,303 | 32,876,217 | | 32,876,217 |
| මරණ ආධාර | - | 195,700 | | 195,700 |
| P.M.G ජංගම ගිණුම - ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු | 195,700 | 221,965 | | 221,965 |
| අවිනිශ්චිත ගිණුම | - | 281,110 | | 281,110 |
| වෙනත් තැන්පතු | 9,357,462 | 9,244,962 | | 9,244,962 |
| | **264,571,062** | **229,209,389** | **3,368,141** | **225,841,248** |

සටහන 13,
මුදල් සහ මුදල් සමාන දෑ

| විස්තරය | 2016 | 2015 |
|---|---|---|
| ලංකා බැංකුව - මාතර | 48,457 | 7,726 |
| මහජන බැංකුව - ජාත්‍යන්තර අංශය | 190,426 | 233,087 |
| ලංකා බැංකුව - ටොරින්ටන් ප්‍රධාන ගිණුම. | 21,118,762 | 17,020,694 |
| ඉන්දියානු රාජ්‍ය බැංකුව | 402,609 | 377,104 |
| ලංකා බැංකුව - අනුරාධපුරය | (18,590) | 12,510 |
| ලංකා බැංකුව - මහනුවර | (290,954) | 153,815 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 16,392,792 | 11,597,272 |
| ලංකා බැංකුව - ටොරින්ටන් ගුවන්විදුලි බලපත්‍ර | 8,527,932 | 6,737,471 |
| ලංකා බැංකුව - ටොරින්ටන් - F M ව්‍යාපෘතිය | 27,088 | 1,429,088 |
| මුදල් අග්‍රිම | 88,577 | 132,760 |
| ලංකා බැංකුව - ටොරින්ටන් - කැසට්පත විකුණුම් | 13,188,431 | 5,895,640 |
| ලංකා බැංකුව - මදුරාසිය | 1,164,445 | 1,093,081 |
| මුදල් පොත - ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය | 47,321,241 | 18,255,485 |
| ලංකා බැංකුව - යාපනය ශාඛාව | - | 191,505 |
| ලංකා බැංකුව - ඉතුරුම් | 92,621 | 88,986 |
| ස්ථාවර තැන්පතු | 58,499,697 | 90,666,817 |
| සැනසුම | 60,053 | 322,147 |
| ආන්තික ගිණුම (මහජන බැංකුව) | 153,472,508 | 106,636,263 |
| **Total** | **320,286,094** | **260,851,451** |

සටහන 14,
රඳවාගත් ඉපැයුම්

| විස්තරය | 2016 | 2015 |
|---|---|---|
| ආරම්භක ශේෂය | **(126,541,868)** | **(248,365,120)** |
| 2015 වසරට පෙර ආදායම් සංචිතය | | **54,341,212** |
| ආදායම් සංචිත ගැලපුම | **(53,537,552)** | |
| විස්තීර්ණ ආදායම | **57,411,250** | **64,280,088** |
| ආදායම් සංචිත | **47,985,402** | **3,201,952** |
| එකතුව | **(74,682,767)** | **(126,541,868)** |

සටහන 15,
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු ගෙවීම්

| විස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම | 2015 අනුමත කරන ලද |
|---|---|---|---|---|
| ණයකරුවන් ගුවන් කාලය විකිණීම | 5,240,852 | 3,589,651 | (14,457,750) | 18,047,401 |
| ආපසු ලබා දෙන විවිධ තැන්පතු | 4,680,695 | 3,007,475 | (6,786,579) | 9,794,054 |
| උපචිත වියදම් | 226,657,021 | 203,005,647 | (5,852,641) | 208,858,288 |
| E.P.F. | 3,513,074 | 3,584,749 | | 3,584,749 |
| සුළු ණයකරුවන් | 6,712,813 | 14,789,451 | | 14,789,451 |
| සුළු ණයකරුවන් | - | 0 | (10,000) | 10,000 |
| ME' හි ආරක්ෂිත තැන්පතුව | 576,347 | 630,472 | | 630,472 |
| සැනසුම - සුනාමි | 60,053 | 322,147 | | 322,147 |
| ජර්මානු ජාත්‍යන්තර විකාශන සේවය | - | 0 | (16,932,095) | 16,932,095 |
| O.P.- සඳහා පුහුණු පාඨමාලාව - කොත්මලේ ඇකඩමිය | 590,283 | | | |
| කල්බදු ගිණුම | - | 4,709,287 | | 4,709,287 |
| ණයකරුවන්ගේ පාලන ගිණුම | 3,438,710 | 114,400 | | 114,400 |
| රජරට සංචාරක බංගලාව | 112,384 | 175,536 | | 175,536 |
| | **251,582,232** | **233,928,814** | **(44,039,066)** | **277,967,880** |

සටහන 16,
මූල්‍ය නොවන වගකීම්

| විස්තරය | 2016 | 2015 ගලපන ලද | ගැලපුම | 2015 අනුමත කරන ලද |
|---|---|---|---|---|
| N S L | 15,007,806 | 15,007,806 | | 15,007,806 |
| සේව් ද නේෂන් අරමුදල | (12,418) | (12,418) | | (12,418) |
| උපයන විට ගෙවීමේ බදු | 149,526 | 145,961 | (1,700) | 147,661 |
| VAT පාලන ගිණුම | 46,477,679 | 20,478,861 | | 20,478,861 |
| ESC | 53,501,578 | 52,996,091 | (180,246) | 53,176,337 |
| NBT | 53,794,953 | 48,976,562 | | 48,976,562 |
| ජාතික ආරක්ෂක අරමුදල | 2,835 | 2,835 | | 2,835 |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | 692,759 | 692,759 | | 692,759 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු | 100 | 50 | | 50 |
| | **169,614,819** | **138,288,508** | **(181,946)** | **138,470,454** |

සටහන 17,
මූල්‍ය කල්බදු

| | 2016 | 2015 |
|---|---|---|
| මූල්‍ය කල්බදු (මෝටර්වාහන)<br>ගැලපුම් වර්ෂය තුළ එකතු කිරීම් | 4,709,288 | 13,977,801 |
| | 4,709,288 | 13,977,801 |
| කල්බදු වාරික | (4,709,288) | (9,092,168) |
| | - | 4,885,633 |
| අඩු කිරීම්<br>කල්බදු පොලී අවිනිශ්චිත ගිණුම | | (176,345) |
| | | |
| | - | 4,709,288 |
| ජංගම වත්කම් | - | 4,709,288 |
| ජංගම නොවන වත්කම් | - | |

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/ඒ/එස්එල්බීසී/1/16/463

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ජූලි 31 දින

සභාපති,

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජූනි 29 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02

(i) ප්‍රමිතයේ 25 ඡේදය ප්‍රකාරව ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ (FIFO) ක්‍රමය හා බර තැබූ සාමාන්‍ය පිරිවැය (Weighted Average) ක්‍රමය යන දෙකෙන් එකක් පමණක් අවසන් තොග අගය කිරීමට නිර්දේශ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංයුක්ත තැටි, කැසට් පටි හා සඟරා තොග අගය කිරීම සඳහා අවසන් ලැබීම් පෙර පිටවුම් (LIFO) ක්‍රමය යොදාගෙන තිබුණි.

(ii) ප්‍රමිතයේ 36 ඡේදය ප්‍රකාරව තොග අගය කිරීම සඳහා අනුගමනය කළ අගය කිරීමේ ක්‍රමය මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල තොග අගය කළ ක්‍රමය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7

**ප්‍රමිතයේ 07 ඡේදය අනුව ආයෝජන අත්පත් කරගත් දින සිට ආයෝජන පරිනත වීමට** ගත වන කාලය මාස 3 කට අඩු වන්නේ නම් පමණක් එම වටිනාකම මුදල් හා මුදල් සමාන දෑ යටතේ ආයෝජන ලෙස දැක්විය හැකි වුවත්, මාස 3 කට වඩා පරිනත කාලයක් ඇති රු. 58,499,697 ක් වටිනා ස්ථාවර තැන්පතු, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන අයිතම ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 07 ඡේදය අනුව යම් දේපළකින් අනාගත ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒ නම් සහ එම දේපලේ පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගත යුතු වුවත් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.2,200,000ක රක්ෂිත වටිනාකමක් සහිත මෝටර් රථයක් 2014 වර්ෂයේ සිට සංස්ථාව විසින් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද එය ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17

ප්‍රමිතයේ 35 ඡේදය අනුව මෙහෙයුම් කල්බදු සම්බන්ධයෙන් ආයතන අවම කල්බදු ගෙවීම්, වර්ෂයට අඩු, වර්ෂ 01 සිට වර්ෂ 05 හා වර්ෂ 05 ට වැඩි ලෙස වෙනම හෙළිදරව් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21

ප්‍රමිතයේ 23 (අ) ඡේදය අනුව 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංස්ථාවේ විදේශ ණයගැතියන් ප්‍රමාණය වූ එක්සත් ජනපද ඩොලර් 43,947.59 ක් හා ඉන්දියානු රුපියල් 3,346 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කර රු. 6,590,729 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට ණය ගැතියන් ඇති වූ වර්ෂයේ අවසාන දිනට පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කර දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ විදේශ ණය ගැතියන් රු. 499,553 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නුවරඑළිය "නිවහන" නිවාඩු නිකේතනයෙහි බදු ගිවිසුම අනුව 2016 වර්ෂයේ අවසන් මාස 5 සඳහා බදු කුලී ආදායම රු. 1,450,000 ක් වුවද එම ආදායම රු. 435,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම හා ලැබිය යුතු බදු කුලී ආදායම රු.1,015,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

5

(ආ) ස්ථාවර තැන්පතු 5 කට අදාළව ලැබිය යුතු පොලී ආදායම් ගණනය කර ගිණුම්වලට නොගැනීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආයෝජන පොලී ආදායම හා එදිනට ලැබිය යුතු පොලී ආදායම රු. 813,346 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා සංශෝධිත රේටයන් අනුව ආර්ථික සේවා ගාස්තුව රු.3,200,569 ක් වුවත්, එම ගාස්තුව රු.916,796 ක් ලෙස දැක්වීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු රු.2,283,773 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සංශෝධිත ආර්ථික සේවා ගාස්තු පනත ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු වටිනාකම වූ රු.4,694,559 අවසාන ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල අතර ගුවන් කාල විකුණුම් ගනුදෙනු වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය කාර්යාල ජංගම ගිණුම්වල ශේෂ නිරවුල් නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ඇතිවී තිබූ රු.5,218,793 ක බැර ශේෂය පරීක්ෂා කර නිරවුල් කිරීමකින් තොරව 2016 වර්ෂයේදී රඳවා ගැනීමට ලාභ ගිණුමට මාරු කර තිබුණි.

(ඊ) ප්‍රධාන කාර්යාලයේ ගිණුම්වල පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය සේවාවන් සඳහා වන ජංගම ගිණුම් හා එක් එක් ප්‍රාදේශීය සේවාවන්හි පවත්වාගෙන යනු ලබන ප්‍රධාන කාර්යාලය සමඟ ජංගම ගිණුම් සැසඳුම් කිරීමකින් තොරව ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම්වල සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.128,321ක බැර ශේෂය වර්ෂ අවසානයේ ගුවන් කාල විකුණුම් ණයහිමියන්ට එකතු කර දක්වා තිබුණි.

(උ) මැනුම් කටයුතුවලදී භාවිතා කරන පිරිවැය රු.425,000 ක් වටිනා පවර් ලොගර් නම් වූ උපකරණය, අස්ථානගත වී තිබුණ ද යන්ත්‍ර හා උපකරණ ගිණුමෙන් ඉවත් කිරීමට 2016 වර්ෂය දක්වාම කටයුතු නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ ගිණුමේ දැක්වෙන ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

6

(ඍ) පැමිණිලි පාර්ශවයන්ට අදාලව රු.10,000,000 ක්, රු.1,783,587 ක් හා රු.80,311 ක් වශයෙන් එකතුව රු.11,863,898 ක් වූ ගෙවීමට නියෝග කරන ලද නඩු තීන්දු 3 කට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට, අභියාචනාධිකරණයට හා මහාධිකරණයට කර තිබූ අභියාචනා නඩු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සිදු කිරීමට හෝ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) සංස්ථාවට අයත් සීදුව පිහිටි ඉඩමෙන් රු.2,908 ක් පිරිවැය වූ අක්කර 4 යි පර්චස් 35.4 ක කොටසක් 2005 වර්ෂයේදී රු.20,000,000 ට විකිණීමෙන් ලැබූ ප්‍රාග්ධන ලාභ පාඩු ගණනය නොකර ලද මුළු මුදල ගොඩනැගිලි ගිණුමට බැර කිරීම නිසා ඉඩම් කොටස විකිණීමෙන් ආයතනය ලැබූ ප්‍රාග්ධන වාසිය වූ රු.19,997,092 ගිණුම් වලින් අත්හැරී තිබූ අතර, ගොඩනැගිලි ගිණුමේ වටිනාකම රු.20,000,000 කින් අඩුවෙන් හා ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ රු.5,500,000 ක්ද ගොඩනැගිලි ක්ෂය රු.500,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් පහකට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.94,284,949 ක් වුවද විගණනය වෙත ලබාදුන් උපලේඛන අනුව එම ශේෂය රු.44,332,958 ක් වූයෙන් එම වෙනස සමාන කිරීම සඳහා එකතුව රු.49,951,991 ක් වූ හඳුනා නොගත් ශේෂ ලෙස උපලේඛනවලට ඇතුළත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ණයහිමි උපලේඛනවල දැක්වෙන ශේෂය හා ගිණුම් අංශයේ ණයහිමි පාලන ගිණුම් අතර රු.3,733,969 ක නොසැසඳුනු ශේෂයන් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශන අනුව දැක්වෙන පහත සඳහන් ශේෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම වත්කම් හා වගකීම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ඉඩම් | 7,764,234 | ස්ථාවර වත්කම් ලේඛනය<br>භෞතික සමීක්ෂණ වාර්තා |
| (ආ) | ගොඩනැගිලි | 168,923,977 | භෞතික සමීක්ෂණ වාර්තා<br>ස්ථාවර වත්කම් ලේඛනය<br>විදේශීය රට වලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වත්කම් පිළිබඳ ලිපිගොනු |
| (ඇ) | ණයගැතියන් (මරණ දැන්වීම්) | 7,997,854 | විස්තරාත්මක උපලේඛන |
| (ඈ) | කෙරීගෙන යන වැඩ සඳහා ගෙවීම්(ප්‍රධාන කාර්යාලීය නව ගොඩනැගිල්ල) | 181,000,000 | ඉන්වොයිසි, අපේක්ෂිත වැඩ සැලැසුම, වියදම් ඇස්තමේන්තු, කළ වැඩ වාර්තා |
| (ඉ) | වසර 10 කට අධික කාලයක සිට ගිණුම්වල පවතින වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ (ලක්හඬ ශාඛා ගිණුම) | 12,807,802 | ලිපි ගොනු විස්තර හා වටිනාකම සැදී ඇති ආකාරය දැක්වෙන උපලේඛන |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ විදුලි සංදේශ නියාමන කොමිෂම් සභාවට ගෙවිය යුතු එකතුව රු.147,825,904 ක් වූ ශේෂයෙන් රු.141,315,701 ක ශේෂ 1981 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 35 ක කාලයක් තිස්සේ නිරවුල් කිරීමකින් තොරව පවතින බව නිරීක්ෂණය වේ.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.65,705,259 ක් වූ විදේශීය ණයගැති ශේෂ එකතුවෙන් රු.59,614,083 ක් වූ වර්ෂ 10 කට වඩා පැරණි ණය ශේෂ විය. ඒවා අයකර ගැනීමට හෝ කපා හැරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2011 සහ 2012 වර්ෂවලට අදාළව එකතුව රු.1,110,540 ක විගණන ගාස්තු පියවීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂයේ හඳුනාගෙන නිරවුල් කළයුතු පැරණි ණයහිමි ශේෂ රු.12,609,674 ක් අයභාර සංචිතවලට බැර කර තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ ණයහිමි පාලන ගිණුමේ බැර ශේෂය රු.1,376,083 ක් වූ අතර, විස්තරාත්මක උපලේඛනයේ එම ශේෂය රු.5,112,530 ක් විය. රු.3,736,447 ක් වූ මෙම වෙනසට හේතු සොයා නිවැරදි කරනු වෙනුවට අයභාර සංචිත වලින් ණයහිමි පාලන ගිණුමට මාරුකර මෙම වෙනස්කම සමාන කර තිබුණි.

(ඊ) ගුවන් විදුලි සංස්ථාවේ අවසන් ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,569,930 ක් ස්වාධීන රූපවාහිනී සේවයෙන් ලැබිය යුතු වුවද එම ආයතනයෙහි අවසන් ගිණුම අනුව ගුවන් විදුලි සංස්ථාවට ගෙවිය යුතු මුදලක් නොවිය. තවද, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ගිණුම් අනුව ගුවන් විදුලි සංස්ථාවට ගෙවිය යුතු මුදල රු.26,685 ක් ලෙස දක්වා තිබුණද, ගුවන් විදුලි සංස්ථාවේ ගිණුම් අනුව රූපවාහිනී සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් ශේෂයක් දක්වා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු. 222,503,345 වූ වෙළෙඳ ණයගැතියන් 148 දෙනෙකු වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යවා තිබූ අතර, ඉන් රු.1,402,024 වටිනා ණයගැතියන් හතර දෙනෙකු සංස්ථාවට ගෙවීමට ණය ශේෂ නොමැති බව සනාථ කර තිබුණි.

(ඌ) වසර 21 කට පෙර හා 2007 වර්ෂයේ දී සිදුව තිබූ මූල්‍ය වංචාවකට අදාලව එකතුව රු.503,075 ක් වූ ශේෂය පෙර වර්ෂයේදී අවිනිශ්චිත ගිණුමක පෙන්නුම් කල අතර සමාලෝචිත වර්ෂයදීද නිරවුල් කර ගැනීමට කටයුතු කිරීමකින් තොරව විවිධ ණයගැති ගිණුමට මාරුකර තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 13 දරන පනත හා 2017 මැයි 17 දිනැති 2017 අංක 07 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධිත පනත | * 2016 අප්‍රේල් 01 දින සිට බද්දට යටත් පිරිවැටුම මත ආර්ථික හා සේවා ගාස්තු බදු අනුප්‍රමාණය සියයට 0.5 ක් වුවත් සංස්ථාව විසින් පැරණි අනුප්‍රමාණය වූ සියයට 0.25 යටතේ 2016/17 තක්සේරු වර්ෂය සඳහා බදු වාර්තා සකස් කර ඉදිරිපත් කොට තිබුණි. මේ හේතුවෙන් බදු වාර්තාවල බදු වගකීම රු.1,438,537 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br>සෑම කාර්තුවක් අවසානයේම එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර අදාළ කාර්තුවේ ගාස්තුව ස්ව තක්සේරු පදනම මත මාසික වාරික වලින් ගෙවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කළ බදු තක්සේරු වාර්තා අනුව 2016 දෙසැම්බර් 31 දක්වා දඩ මුදල් සහිතව ගෙවිය යුතු මුළු ආර්ථික සේවා ගාස්තුව රු.54,301,192 කි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 ඡේද අංක A12 | 2016 දෙසැම්බර් 31 දිනට සිදුකළ එකතුව රු.3,536,443 ක් වූ සංයුක්ත තැටි, කැසට්පට හා සහරා වලට අදාලව තොග ගණන් ගැනීමේදී එය නිරීක්ෂණය සඳහා විගණකාධිපති වෙත දැනුම් දීමක් සංස්ථාව විසින් සිදු කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | 4.2.2 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්ම, අයවැය හා කාර්යසාධනය කාලීනව විමර්ශනය කොට සත්‍ය කාර්යසාධනය සැලසුම්ගත කාර්යසාධනයෙන් වෙනස් වන්නේදැයි පරීක්ෂා කොට ඒ අනුව සංයුක්ත සැලැස්ම හා අයවැය සංශෝධනය කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | 7.4.5 වගන්තිය | සංස්ථා විසින් වාර්ෂිකව කමිටු පත් කර සෑම ස්ථාවර වත්කමකම භෞතික පැවැත්ම සත්‍යාපනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වාහන භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. |
| | 5.1.3 වගන්තිය හා 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| | 5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත් මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2016-2018 වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| | 1 ඡේදය | අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන හඳුනාගෙන අපහරණය කිරීම සඳහා කටයුතු කළයුතු නමුත් වසර 2 සිට වසර 10 තිස්සේ අබලන්ව ධාවනයෙන් ඉවත් කර තිබෙන රු.1,300,000 පිරිවැය වූ වාහන දෙකක් සහ පිරිවැය හඳුනා ගත නොහැකි වාහනයක් චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කර නොතිබුණි. |
| (ඉ) | 2005 ජූනි 16 දිනැති අමප/05/විවිධ (026) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | උපදේශකවරුන් පත්කිරීම සඳහා ඉල්ලීම් කිරීමේදී නම් කරනු ලබන්නාගේ ජීවදත්ත තොරතුරු සමඟ ඔහුට පැවරීමට නියමිත නිශ්චිත කාර්යභාරය, කොන්ත්‍රාත්තුවේ කාලසීමාව, පාරිශ්‍රමිකය සහ කාලසීමාව දීර්ඝ කිරීමකදී නම් පෙර කොන්ත්‍රාත්තු කාලයේ කාර්ය සාධන ඇගයීම් වාර්තාවක් සහිතව සංදේශයක් ඉදිරිපත් කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත් 2014 හා 2015 වර්ෂවලදී එවැනි අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව බඳවා ගනු ලැබූ උපදේශකවරු 04 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,920,000 ක මාසික දීමනා ගෙවා තිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය<br>3 වැනි උපලේඛනය<br>2.11 ඡේදය | ස්ථාවර වත්කම් ලේඛනය වෙනුවට පරිගණකය මඟින් පවත්වාගෙන ගොස් තිබූ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා තිබූ අතර ඒ තුළින් ඉඩම්, ගොඩනැඟිලි, වාහන,විදුලි උත්පාදන යන්ත්‍ර(ජෙනරේටර්), ට්‍රාන්ස්මීටර් වැනි වැදගත් අයිතම රාශියකට අදාළ විස්තර අන්තර්ගත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඌ) | 2017 මැයි 17 දිනැති 2017 අංක 7 දරන ආර්ථික සේවා ගාස්තු පනත | සෑම කාර්තුවක් අවසානයේම එළඹෙන මාසයේ 20 වෙනි දින හෝ ඊට පෙර අදාළ කාර්තුවේ ගාස්තුව ස්ව තක්සේරු පදනම මත මාසික වාරික වලින් ගෙවිය යුතුය. නමුත් 2016 සැප්තැම්බර් මාසයේ හැර වසරේ අනෙකුත් කිසිදු කාර්තුවක් සඳහා මාසික වාරික නොගෙවීම නිසා 2016 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු දඩ මුදල් සඳහා ප්‍රතිපාදන සිදු කළයුතු වුවද එසේ නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දඩ මුදල් ගිණුමේ ශේෂය රු.236,386 ක් අඩුවෙන් දක්වා තිබුණි. |
| (එ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පහත සඳහන් වත්කම්වලට අදාලව භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | රු. |
|---|---|---|
| (i) | ත්‍රිකුණාමල(ඩොයිෂ්වෙල්) ප්‍රතිවිකාශනාගාරයේ ස්ථාවර වත්කම් | 2,173,006,103 |
| (ii) | අවසන් තොග | 22,371,290 |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.57,411,250 ක ලාභයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වසරේ ලාභය රු.64,280,088 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,868,838 ක් පිරිහීමක් පෙන්නුම් කරයි. අයහාර වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.15,000,000 ක් වැඩි වී තිබුණ ද,

වෙනත් මෙහෙයුම් ආදායම් රු.36,541,883 කින් එනම්, සියයට 7.8 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශුද්ධ අලාභයක් ඇතිවී තිබූ අතර, 2015 හා සමාලෝචිත වර්ෂවලදී ශුද්ධ ලාභයක් ඇතිවී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු 2015 වර්ෂයේදී රු.827,054,364 ක් වූ දායකත්වය 2016 වසරේදී රු.812,449,234 ක් දක්වා අඩුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

වැදගත් අනුපාත විශ්ලේෂණයන් පහත දැක්වේ.

| අනුපාත | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| <u>ද්‍රවශීල</u> | | | |
| (i) ජංගම | 0.85 : 1 | 1.4:1 | 1.5:1 |
| (ii) ක්ෂණික | 0.77 : 1 | 1.32:1 | 1.46:1 |
| <u>ලාභදායිත්ව</u> | | | |
| (i) දළ ලාභ | 28.28 | 6.03 | 6.79 |
| (ii) ශුද්ධ ලාභ/(අලාභ) | (10.42) | 12.98 | 10.96 |

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ගිණුම් අනුව ජංගම අනුපාතයෙහි හා ක්ෂණික අනුපාතයෙහි වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර, ඒ අනුව ජංගම වගකීම් පියවීමට ප්‍රමාණවත් පරිදි ජංගම වත්කම් තිබෙන බවක් පිළිබිඹු වේ. එසේ වුවද, පහත සඳහන් කරුණු අනුව ගිණුම්වල දැක්වෙන තොරතුරු මත ගණනය කරනු ලබන අනුපාත තුළින් නිවැරදි තත්ත්වය හෙළිදරව් නොවන බව නිරීක්ෂණය වේ.

14

(i) ජංගම වත්කම්වල ඇතුළත් ණයගැතියන් තුළ වර්ෂ 02 සිට වර්ෂ 41ක් දක්වා වූ පැරණි දේශීය ණයගැති ශේෂ රු. 52,046,735 ක් හා විදේශිය ණයගැති ශේෂ රු.61,855,400 ඇතුළත් වීමෙන් ණය අයකර ගැනීමේ හැකියාවක් සහ ද්‍රවශීලතාවයක් නොතිබීම.

(ii) ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට විදේශ ණයගැතියන්ගේ විදේශ විනිමය විචලන වාසිය රු.6,590,729 ක් ලෙස හඳුනා නොගැනීම නිසා විදේශ ණයගැතියන්ගේ සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකිරීම.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 6.03 සිට සියයට 6.79 ක් දක්වා වැඩි වී තිබූ අතර, පසුගිය වසරට සාපේක්ෂව සමස්ත ගුවන්කාල විකුණුම් ආදායම සියයට 5.82 කින් වැඩිවීම එයට හේතු වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය වැරදි ලෙස ගණනය කර තිබීම නිසා දළ ලාභ අනුපාතයෙහි නිවැරදිතාවය පිළිබඳව නිගමනයකට එළඹිය නොහැකි බව නිරීක්ෂණය විය.

(ඇ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අයභාර ප්‍රතිපාදනයට පෙර ශුද්ධ අලාභ අනුපාතය සියයට 59.47 සිට සියයට 59.93 තෙක් වැඩි වී තිබූ අතර, අයභාර ප්‍රතිපාදනවලට පසු ශුද්ධ ලාභ අනුපාතය සියයට 12.98 සිට සියයට 10.96 තෙක් අඩු වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් වැඩිවීම සහ වෙනත් මෙහෙයුම් ආදායම් අඩුවීම එයට හේතු වී තිබුණි.

(ඇ) ණයවර ලිපි විවෘත කිරීමේදී එහි වටිනාකමට සමාන අගයක් සුරක්ෂිතයක් ලෙස පොලී නොලබන බැංකු ගිණුමක තැන්පත් කරන ලෙස බැංකුව විසින් කරන ලද ඉල්ලීමට අනුව විවෘත කරන ලද ගිණුමට සමාලෝචිත වර්ෂයේදී රජයෙන් ලැබුණ රු.109,710,154 ක්වූ ප්‍රාග්ධන දායකය මාරුකර තිබුණු අතර රු.මිලියන 100 කට වැඩි මුදලක් වර්ෂය පුරාම කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව තැන්පත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් දිනට එහි ශේෂය රු.මිලියන 153 ක් විය.

15

**3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පීපල්ස් ට්‍රස්ට් ක්‍රෙඩිට් ඉන්වෙස්ට්මන්ට් කම්පනි ආයතනයෙන් සංස්ථාවේ ප්‍රචාරණය කරන ලද වැඩසටහන් සඳහා ලැබිය යුතු රු.150,000 අයකර ගැනීම සඳහා එම ආයතනයට එරෙහිව නඩු පවරා තිබුණ ද විත්තිකරු පදිංචි ස්ථානය හැර ගොස් තිබීම හේතුවෙන් නඩුව පවත්වාගෙන යාමට නොහැකි වීම නිසා වසර 02 කට වැඩි කාලයක් අධිකරණය විසින් නඩුව බහා තිබුණි.

(ආ) ලංකා සිමෙන්ති සමාගමෙන් සංස්ථාවේ ප්‍රචාරණය කරන ලද වැඩසටහන් සඳහා ලැබිය යුතු රු.471,715 අයකර ගැනීම සඳහා එම ආයතනයට එරෙහිව නඩු පවරා තිබුණ ද රීට් ආඥාවක් ගැනීමට විත්තිකරුගේ වත්කම් ඉදිරිපත් කරන ලෙස අධිකරණයෙන් කරන ලද නියෝගයට අනුව සමාගමේ වත්කමක් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමට සංස්ථාව ක්‍රියා නොකිරීම නිසා වසර 02 කට වැඩි කාලයක් අධිකරණය විසින් නඩුව බහා තිබුණි.

(ඇ) අලෙවි විධායක නිලධාරියකු විසින් අවස්ථා 02 කදී සිදුකරන ලද වංචා හේතුවෙන් රු.4,716,813 ක් හා රු.7,551,750 ක් වූ මුදල් අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ සහ පළාත්බද මහාධිකරණයේ නඩු 02 ක් පවරා තිබුණ ද විත්තිකරු පදිංචි ස්ථානය හැර ගොස් ඇති නිසා ඉහත නඩු 02 වසරකට වැඩි කාලයක් විභාගයට නොගෙන බහා තිබුණි.

(ඈ) ගිරාඳුරුකෝට්ටේ ප්‍රජා ගුවන් විදුලියේ සේවිකාවකට අර්ථසාධක මුදල් නොගෙවීමට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ නඩුවේ තීන්දුවෙන් රු.80,311 ක දායක මුදල් සහ අධිභාරය ගෙවන ලෙස දුන් නියෝගයට එරෙහිව කොළඹ පළාත්බද මහාධිකරණයට අභියාචනය කර තිබූ අතර, මෙම නඩුව වෙනුවෙන් නඩු ගාස්තු සඳහා පමණක් මේ දක්වා රු.245,000 ක් එනම් ගෙවිය යුතුව තිබූ වන්දි මුදල මෙන් තුන් ගුණයකටත් වැඩියෙන් ගෙවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1966 අංක 37 දරන ගුවන් විදුලි සංස්ථා පනත අනුව සංස්ථා අරමුණු පහත සඳහන් වේ.

(i) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුන සඳහා වැඩිම ශ්‍රාවක පිරිසක් සහිත ගුවන් විදුලි නාලිකා පවත්වාගෙන යන ආයතනය ලෙස කටයුතු කිරීම.

(ii) වගකීමෙන් යුතුව සමබර තොරතුරු කඩිනමින් ලබාදෙන, ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීම.

(iii) දේශීය සංස්කෘතියේ අභිවෘද්ධිය පිණිස උසස් සහ නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම.

(iv) දැනුම, ආකල්ප සහ කුසලතාවන්ගෙන් පිරිපුන් ස්වයං අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීම.

(v) නිෂ්පාදන සහ විකාශන තාක්ෂණය නිසි පරිදි යාවත්කාලීන කරමින් දෙස් විදෙස් ශ්‍රාවකයන්ට පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම.

(vi) ආචාරධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන් විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහි කිරීම උදෙසා පුරෝගාමී ආයතනය ලෙස ක්‍රියා කිරීම.

(vii) ජාතික ගුවන් විදුලිය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා නිර්මාණශීලී දායකත්වය සැපයීම.

(viii) යපත් මූල්‍ය පාලනයක් හා මානව සම්පත් කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාම.

(ix) තරඟකාරී වෙළඳපොළ උපායශීලීව ජය ගැනීම.

ආයතනයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරකම් පාදක කරගත් පිරිවැය ගණනය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම මගින් සංස්ථාවේ අනවශ්‍ය වියදම් හඳුනාගෙන එම වියදම් අවම කිරීම තුළින් ලාභ ලැබෙන තත්ත්වයකට පත්කිරීම සංයුක්ත සැලැස්ම අනුව මුදල් අංශයේ ක්‍රමෝපායක් වුවත්, 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ රජරට සේවය, රුහුණු සේවය හා කඳුරට සේවය යන සංස්ථාවේ සියළුම ප්‍රාදේශීය සේවාවල වියදම් පිළිවෙලින් සියයට 53.8 ක්

16 ක් හා 72.2 ක් වර්ධනය වී තිබූ අතර, අලාභය ද සියයට 0.2 ක් 45 ක් හා 148 ක් වර්ධනය වී තිබුණි. ඒ අනුව මුදල් අංශයේ ඉහත වියදම් පාලනය කිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. අදාළ වගකිව යුතු පාර්ශව අපොහොසත්ව ඇති බව සනාථ වී තිබේ.

(ආ) ප්‍රාදේශීය සේවාවන්හි අලෙවි ක්‍රමෝපායන් ප්‍රධාන කාර්යාලයේ අලෙවි ක්‍රමෝපායන් හා ඒකාබද්ධව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් මෙම සේවාවන්හි ආදායම් තත්ත්වය සියයට 50 කින් වර්ධනය කිරීමට ආයතනය 2014 වර්ෂයේදී සංයුක්ත සැලැස්ම මඟින් සැලසුම් කර තිබුණ ද, එම අරමුණු සාක්ෂාත් කිරීමට සැලසුම් කළ ක්‍රමෝපායන් සාර්ථකව මෙහෙයවීමට අපොහොසත්ව තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සේවා හා ප්‍රජා ගුවන් විදුලි සේවා ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම සඳහා අවශ්‍ය සම්ප්‍රේෂණ පද්ධතීන් යාවත්කාලීන කිරීම හා දැනට පද්ධතියේ පිහිටුවා ඇති සමස්ත මැදිරි උපකරණ හා උපාංග නව තාක්ෂණයට සරිලන පරිදි යාවත්කාලීන කිරීම තුළින් උසස් හා නිර්මාණාත්මක වැඩ සටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම මගින් ආයතනයේ මූල්‍ය තත්ත්වය යහපත් කිරීම අරභයා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වසර 05 තුළ රු.307,691,512 ක මූලධන පිරිවැයක් ආයතනය දරා තිබුණි. නමුත් 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ රජයේ දායකයට පෙර අලාභය සියයට 61.7 කින් වර්ධනය වී තිබීම තුළින් ඉහත අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීමට ආයතනය අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) පසුගිය වසර පහක ආයතනයේ අවසාන ගිණුම් විශ්ලේෂණය කිරීමේදී ගුවන් කාල විකුණුම් ආදායම උච්චාවචන වී තිබුණ ද, පැහැදිලි වර්ධනයක් සිදුවී නොතිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ විකුණුම්වල සියයට 8.31 ක පසුබෑමක් දක්නට ලැබුණි. මෙම කාලපරිච්ඡේදයේ විකුණුම් පිරිවැය සියයට 35.83 ක් වර්ධනය වී තිබූ අතර, දළ ලාභය සියයට 83.22 කින් පිරිහී තිබුණි.

(ඉ) අලෙවි අංශයේ කාර්ය මණ්ඩලය තරඟකාරී වෙළඳපල සමඟ සම්බන්ධ වීමේදී ලබා ගන්නා දැනුම සහ තොරතුරු තරඟකාරී වෙළඳපල අභියෝගවලට මුහුණ දිය හැකි වැඩසටහන් නිෂ්පාදනය සඳහා යොදාගත හැකි ක්‍රමයක් සකස් කර ක්‍රියාත්මක කිරීම හා තරඟකාරී වෙළඳපල දිනා ගැනීම සඳහා අවශ්‍ය වෙළඳපල උපක්‍රම හඳුනාගෙන ඒවා සංස්ථාවේ අලෙවිකරණ කටයුතු සඳහා යොදා ගැනීම තුළින් සංස්ථාවේ ගුවන්

කාල අලෙවිය වර්ධනය කිරීමට ක්‍රමෝපායන් සකස් කර තිබුණ ද, 2012 වර්ෂයට සාපේක්ෂව පසුගිය වර්ෂ 5 ගුවන් කාල විකුණුම් ආදායම් සියයට 5.6 සිට සියයට 13.4 දක්වා පරාසයකින් අඩුවී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ලෙස පිළිවෙලින් රු.3,002,691 හා රු.1,884,632 ක් ලෙස ගිණුම්ගතව ඇති ගුවන්විදුලි සංස්ථාව පරිහරණය කරන කොළඹ පිහිටි හෙක්ටයාර 2.5036 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම 1949 වර්ෂයේ සිට බුක්ති විඳින නමුත් මේ දක්වා නීත්‍යානුකූලව පවරා ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) වාණිජ පරමාර්ථයෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2012 පෙබරවාරි 23 දින සිට රු.127,400,000 ක වාර්ෂික බදු මුදලක් ගෙවීමේ පදනමට 2012 වර්ෂයේ සිට වසර 30 ක කාලයකට ඉඩමක් බදු ගැනීම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින දක්වාම එම අරමුණ ඉටුකරගෙන නොතිබුණ අතර, 2016 දෙසැම්බර් 31 දිනට බදු මුදල් හා දඩ වශයෙන් රු.මිලියන 1000 ක් ගෙවිය යුතුව තිබුණද මූල්‍ය ප්‍රකාශනවල මේ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සම්ප්‍රේෂණාගාරයක් ඉදිකිරීම සඳහා අක්කර 159 රූඩ් 03 පර්චස් 22 වපසරියකින් යුත් දියගම පිහිටි ඉඩම 1959 වර්ෂයේදී පවරාගෙන තිබුණි. පවරාදීමේ කොන්දේසි අනුව ඉඩම එම අරමුණ සඳහාම යොදාගත යුතු වුවත් 2006 වර්ෂයේ සිට සම්ප්‍රේෂණාගාර කටයුතු නවතා තිබූ අතර ඉඩම පවරා ගැනීමේ කොන්දේසිවලට පටහැනිව අක්කර 10 ක හා අක්කර 19 රූඩ් 02 පර්චස් 23.2 ක බිම් කොටස් 2 ක් 2002 හා 2009 වර්ෂයන් හි පිළිවෙලින් රු.22,000,000 කට හා 25,000,000 ට විකුණා ලබාගත් රු.47,000,000 ක මුදල ආදායමට ගෙන තිබුණි. මෙම ඉඩමෙහි ඉතිරි කොටස දැනටද සංස්ථාව සතු ගොඩනැගිලි පවතින බැවින් සහ එහි සංවර්ධනය සඳහා සංස්ථාව කටයුතු කර තිබුණ ද, කිසිදු වන්දි මුදලක් ලබාදීමකින් තොරවම 2009 වර්ෂයේදී මෙම ඉඩම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංවර්ධන පදනමට සංස්ථාවේ එකඟත්වයක් නොමැතිව පවරාගෙන තිබුණි.

19

(ඇ) 1989 වර්ෂයේදී ජපාන රූපවාහිනී සහ ජපාන ගුවන් විදුලි ආයතනයේ (NHK) ආධාර ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අවසානයේදී සම්ප්‍රේෂණාගාර ගොඩනැගිල්ල හා සියලුම යන්ත්‍රෝපකරණ 1993 වර්ෂයේදී ගුවන් විදුලි සංස්ථා ප්‍රධාන කාර්යාලයට භාර දී තිබුණි. එම ඉඩම හා ගොඩනැගිලි 2011 ජූලි 29 දිනැති තක්සේරු වාර්තාව අනුව රු.960,000,000 කට තක්සේරු කර තිබුණද කිසිදු වත්කමක් ගිණුම්ගත කර නොතිබුණු අතර ව්‍යාපෘතියට අදාළ කිසිදු ලිපි ගොනුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 1974 වර්ෂයේ සිට මිලදී ගත්, විකුණා හෝ භාවිතයෙන් ඉවත් කර තිබුණු වත්කම්වල පිරිවැය හඳුනාගත හැකි ආකාරයට ලේඛන නඩත්තු කර නොතිබුණු අතර භාවිතයෙන් ඉවත් කර හා විකුණා තිබුණු වත්කම් ගිණුම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ශේෂය හා භෞතිකව පවතින වත්කම්වල වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා වගකිව යුතු පාර්ශවයන් මේ දක්වා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) ගිවිසුම ප්‍රකාරව බදු කුලී නොගෙවීම නිසා සංස්ථාවට අයත් නුවරඑළිය "නිවහන" නිවාඩු නිකේතනයේ බදු මුදල් නොගෙවීම හේතුවෙන් බදුකරුට විරුද්ධව නඩු පවරා බදුකරු නිවහනින් ඉවත් කර තිබුණ ද 2005 වර්ෂයේ සිට 2014 වර්ෂයේ පෙබරවාරි දක්වා ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු රු.5,106,500 ක බදුකුලී සහ බදු ගැණුම්කරුගෙන් දේපළෙහි අයිතිය නැවත ලබා ගැනීම සඳහා 2010 වර්ෂයේ සිට වැයකර තිබුණු රු.2,151,206 ක නඩු ගාස්තුව අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් 2017 දෙසැම්බර් 31 දක්වාම නෛතික ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වී නොතිබුණි.

(උ) නුවරඑළිය "නිවහන" නිවාඩු නිකේතනය සහිත ඉඩමේ බදු කාලය 2015 ඔක්තෝබර් අවසන් වීමට නියමිතව තිබියදී එහි කාලය දීර්ඝ කර ගැනීමකින් තොරව 2015 ජූනි 01 දින සිට අවුරුදු තුනක කාල සීමාවකට මාසිකව රු.290,000 ක බදු කුලියකට නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා බාහිර පාර්ශවයකට බද්දට දී තිබුණ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදු කුලිය රු. 725,000 බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හා දෙසැම්බර් 31 දිනට සංස්ථාව සතුව පිළිවෙලින් රු.90,666,817 ක හා රු.58,499,697 ක ස්ථාවර තැන්පතු ඇතුළුව මුදල් හා බැංකු ශේෂය රු.260,851,451 ක් හා රු.320,286,094 ක් වුවද රු.30,000,000 කට අධික බැංකු අයිරාවක් වසර පුරාම පවත්වාගෙන යාම හේතුවෙන් රු.4,600,116 ක අයිරා පොලී ගෙවීමට සිදුවී තිබුණි.

(එ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත අනුව නිසි පරිදි බදු මුදල් නොගෙවීම හේතුවෙන් 2004/2005 තක්සේරු වර්ෂයේ සිට 2014/2015 දක්වා කාලයට අදාළව හිඟ බදු මත රු.17,987,509 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඹේවෙල ගුවන්විදුලි විකාශනාගාරය ඉදිකිරීම සඳහා 1984 වර්ෂයේදී රජය විසින් නුවරඑළිය හා වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවලට අයත් අක්කර 30 ක පමණ භූමි ප්‍රමාණයක් වෙන්කර දී තිබූ නමුත් බදු ගිවිසුමක් මගින් නීත්‍යානුකූලව මෙම භූමිය පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, 2017 දෙසැම්බර් 31 දක්වාම එම ඉඩම යෝජිත කාර්යය සඳහා උපයෝගී කරගෙන නොතිබුණි. නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයිති අක්කර 6 ක පමණ භූමි කොටස සඳහා බදු ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර තිබියදී අදාල ප්‍රාදේශීය ලේකම් විසින් "විදුලංකා" නමැති පෞද්ගලික ආයතනයකට මෙම ඉඩමේම කොටසක් බදු දීමට කටයුතු කර තිබුණි. තවද වැලිමඩ ප්‍රාදේශීය ලේකම්ට අයිති ඉතිරි අක්කර 24 ක පමණ භූමි ප්‍රමාණය සඳහා බදු අයිතිය ලබා ගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබූ අතර, සංස්ථාව විසින් ඉඩමේ ඇති සංචාරක බංගලා දෙක පමණක් පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) එෆ් එම් සම්ප්‍රේෂණාගාරයක් ඉදිකිරීම සඳහා 1990 වර්ෂයේදී රු. 50,000 කට මිලදී ගෙන තිබූ හෙක්ටයාර් 1.503 ක වපසරියකින් යුත් කලටුවාවේ පිහිටි ඉඩම මේ දක්වා යෝජිත කාර්යයට යොදවා නොතිබුණි. එයින් පර්චස් 19.77 ක කුළුණක් ඉදිකර ලංකා බෙල් ආයතනය විසින් 2011 වර්ෂයේ සිට භුක්ති විඳිමින් පැවතියද ඒ සඳහා මාසිකව රු.15,000 බැගින් ගෙවීමට එම ආයතන එකඟ වී තිබුණද මේ දක්වා නීත්‍යානුකූල බදු ගිවිසුමකට එළඹීමට නොහැකි වීම නිසා 2011 වර්ෂයේ සිට ආයතනයට ලැබිය යුතු බිම් කුලී ආදායම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) විකාශනයන්හි ශ්‍රවණ තත්ත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට ඒකකයක් සංස්ථාව තුළ ස්ථාපනය කර නොතිබුණු අතර, ශ්‍රාවකයන්ගෙන් සංස්ථාවට ලැබෙන පැමිණිලි ලේඛනගත කිරීම සංස්ථාවේ කිසිදු අංශයකින් සිදුකර නොතිබුණි. පැමිණිලි ශ්‍රවණ පර්යේෂණ අංශය වෙත යොමුකර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළයුතු වුවත්, මෙවැනි ක්‍රියා පිළිවෙතක් නොවීම නිසා ඒ සම්බන්ධව සංස්ථාවට කාලීන පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

### 4.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

ගුවන් විදුලි සේවා ස්වයංක්‍රීයකරණ සඳහා මෘදුකාංග හා උපකරණ මිලදී ගැනීම සඳහා 2008 වර්ෂයේ සිට අවස්ථා කීපයකදී එකතුව රු.3,400,000 ක මුදලක් වැය කර තිබුණ ද, 2017 දෙසැම්බර් වන විටද එම සේවාවෙන් ලැබිය යුතු පහසුකම් ලබාගැනීමට හැකි වන පරිදි එම මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි. තවද, ගිණුම්කරණය සඳහා යොදා ගන්නා මෘදුකාංගයේ තත්ත්වයද එලෙසම පවතී. මෙනිසා මෘදුකාංග ලබා ගැනීමට විශාල මුදලක් වැය කර තිබුණ බොහෝ කාර්යයන් මේ දක්වා ස්වයංක්‍රීයකරණය කර නොතිබූ බව නිරීක්ෂණය වේ.

### 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගුවන් විදුලි සංස්ථාවට අයත් අක්කර 125 ක සීදූව ඉඩමෙන් පර්චස් 10 බැගින් වූ කැබලි 1027 ක් ගුවන් විදුලි සංස්ථාවේ එකඟත්වයකින් තොරව 2000-2001 කාල පරිච්ඡේදය තුළ කටාන ප්‍රාදේශීය ලේකම් විසින් ජනතාව අතර බෙදා දී තිබුණි. විගණන දිනය දක්වාම ඉඩමේ අයිතිය සංස්ථාව සතුව පැවතුණද වන්දි අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 ඔක්තෝබර් 19 දින සිට 2016 ඔක්තෝබර් 27 අතර දිනක ආරක්ෂක අංශය භාරයේ තිබියදී බලාගාර අංශයේ භාවිතයේ තිබූ රු. 425,000 ක් වටිනා පවර් ලොගර් මිණුම් උපකරණය අස්ථානගත වී තිබුණු අතර, වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

සංස්ථාව සතු කරගහතැන්න විකාශනාගාරය නවීකරණය කිරීම සඳහා රු.104,720,555 ක් වටිනා කිලෝවොට් 10 ට්‍රාන්ස්මිටර් 07 ක් හා ඇන්ටනා පද්ධතියක් මිලදීගෙන සවිකිරීමේ කොන්ත්‍රාත්තුව පැවරීමේදී ට්‍රාන්ස්මිටරයේ සහ ඇන්ටනා පද්ධතියෙහි ක්ෂේත්‍ර ප්‍රබලතාවය මැනීමේ පිරිවිතර නොසලකා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීම හේතුවෙන්, පසුව සිදු කළ ගුවන් විදුලි තරංග ප්‍රබලතා කේෂත්‍ර පරීක්ෂණ වාර්තාවේ දක්වා තිබූ අගයන් බලාපොරොත්තු වන පිරිවිතර වල සඳහන් අවම අගයන්ටද වඩා අඩු අගයන් බව නිරීක්ෂණය විය. තවද පරීක්ෂා කර තබූ අවස්ථා 182 කින් ග්‍රාමීය මට්ටමේදී තිබිය යුතු අවම අගයන් හෝ සපුරා තිබුණේ අවස්ථා 09 කදී පමණක් බව අනාවරණය විය.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට 851 ක සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සකස් කර අනුමැතිය සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 851 ක් සහ අතිරික්ත කාර්ය මණ්ඩලය 187 ක් විය.

(ඇ) සංස්ථාවේ ප්‍රධාන මාණ්ඩලික තනතුරු 04ක් වර්ෂ 03ත් 09ත් අතර කාලයක සිට පුරප්පාඩුව පවතීම හේතුවෙන් සංස්ථාවේ කාර්යසාධනයට සෘජුවම බලපෑම් ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

(ඈ) ජන ගායනා පර්යේෂණ හා ගීත වැඩසටහන් අධීක්ෂණයට පැවරුම් පදනම මත පත්කර ඇති නිලධාරියාට පත්වීම් ලිපිය අනුව හිමි රු.35,000 ක් වූ මාසික දීමනාවට අමතරව රු.10,000 බැගින් එකතුව රු.260,000 ක ඉන්ධන දීමනාවක් 2016 අප්‍රේල් 01 දින සිට මේ දක්වා ගෙවා තිබුණි.

(ඉ) සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරමින් සිටි නිලධාරියා 2015 ජනවාරි 19 දින සිට එම තනතුරෙන් මුදාහැර තිබුණද, ගුවන් විදුලි සංස්ථා පනතේ 19 (3)(ආ) වගන්තිය ප්‍රකාරව එම නිලධාරියා පෙර සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි පිහිටුවා නොතිබුණි. ඒ වෙනුවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2015 ඔක්තෝබර් 19 දින සිට සංස්ථාවේ උපදේශක තනතුරක පිහිටුවා තිබූ නමුත්, ඔහු විසින් එම තනතුර භාර නොගන්නා බව දැනුම් දී තිබුණි. නමුත් මෙම නිලධාරියාව මුදාහරින ලද දිනයේ සිට වෙනත් රාජකාරි පැවරීමක් සිදුකර ආයතනයේ කාර්ය සාධනයට දායක කරගත හැකිව තිබියදී එසේ නොකර වෙනත් අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුව පත්කර තිබියදී අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුට හිමි නිල නිවාස, නිල වාහන , ඉන්ධන, වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් හා දුරකථන දීමනා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,076,918 ක් ගෙවීම් කර තිබුණි.

**4.8 වාහන උපයෝජනය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(අ) ආයෝජන මණ්ඩලයෙන් ලබා දෙන ලද ධාවන තත්ත්වයේ පවතින වාහනයක් 2010 වර්ෂයේදී රු. 2,300,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණ ද එහි අයිතිය නිරවුල්ව සංස්ථාවට පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 10 කට වඩා වැඩි කාලයක සිට අබලන්ව ධාවනයෙන් ඉවත් කර ඒකල සම්ප්‍රේෂණාගාර භූමියේ ගාල් කර තිබෙන මහවැලි අධිකාරියෙන් ලබා දෙන ලද වාහනයක් 2010 වර්ෂයේදී රු. 150,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණ ද මේ දක්වා එහි අයිතිය නිරවුල්ව සංස්ථාවට පවරා ගැනීමට කටයුතු නොකිරීම නිසා එය අපහරණය කිරීමට පවා නොහැකිව අකර්මන්‍යව තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් හා වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 04 දිනදීය.

### 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි ඡේදයේ (1) වගන්තිය ප්‍රකාරව 2016-2018 සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අංශ 3 ක් යටතේවූ ක්‍රියාකාරකම් 10ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණ අතර අංශ 2 කට අයත් ක්‍රියාකාරකම් 4 ක් වසර අවසානය වන විටදී ද ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 04ක් පැවතියද, 2016 දෙසැම්බර් 31 දිනට විගණන සහායකයන් දෙදෙනකු පමණක් සේවයේ යොදවා තිබුණි.

### 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදයේ (අ) වගන්තිය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර, එම ඡේදයේ (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කර තිබිය යුතු වුවද සංස්ථාව විසින් 2016 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි.

**5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---------------------------------

2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2017 දෙසැම්බර් 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.7 නොවිසඳී ඇති විගණන ඡේද**

----------------------------------

(අ) පුත්තූර්හි ඇන්ටනා කුළුන ඉදිකිරීමේ කටයුතු ඉදි කිරීමේ මූල්‍ය හා තාක්ෂණික හැකියාව නොසලකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව 2011 ජූලි 16 දින හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා තිබුණි. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත රු. 9,126,933 ගෙවා තිබූ අතර ඉදිකිරීම් කටයුතු සිදු කිරීමෙන් තොරව කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. ගෙවූ අත්තිකාරම් මුදලින් රු. 4,348,041 පමණක් සංස්ථාවට ආපසු ගෙවීම නිසා රු.4,778,892 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) 1996 වර්ෂයේදී මීටර් 60 ක් හා මීටර් 100 ක් උස ඇන්ටනා කුළුනු 2ක් ගෙන්වීම සඳහා රු.23,119,683 ක් වැයකර තිබුණු අතර, කුළුනු සවිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකට අත්තිකාරම් ලෙස රු.2,568,000 ක් ගෙවා තිබුණි. සවිකළ යුතු ස්ථාන තීරණය කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කුළුනු සවිකර නොතිබූ අතර, එම උපකරණ ඒකල භූමියේ අනාරක්ෂිතව ගොඩගසා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) සංස්ථාව විසින් රු.860,000 ක් ගෙවා මිලට ගෙන තිබුණු නිවාස දෙකක් (අනුරාධපුර හා මහනුවර) සඳහා පැවරුම් සහතික ලබාගෙන නිසි පරිදි අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) සංස්ථාවේ ගිණුම්කරණ ක්‍රමය යාවත්කාලීන කර නොතිබීම.<br>(ii) විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දෝෂ පැවතීම.<br>(iii) වත්කම්, වගකීම්, ආදායම්, වියදම් ගිණුම්වලින් අත්හැරීම් නිරීක්ෂණය වීම. |
| (ආ) වත්කම් පාලනය | (i) සංස්ථාවට විසින් මිලදී ගෙන ඇති ඉඩම් සඳහා නීත්‍යානුකූල ඔප්පු ලබාගැනීමට කටයුතු නොකිරීම.<br>(ii) සංස්ථාවට හිමි භුක්ති විඳින ඉඩම් ආරක්ෂා කරගැනීමට නොහැකි වීම හා ඉඩම් විශාල ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගෙන නොතිබීම.<br>(iii) සංස්ථාවට හිමිකම ඇති භුක්ති නොවිඳින ඉඩම් බාහිර පාර්ශවයන් විසින් අනවරසරයෙන් අත්පත් කරගෙන පැවතීම.<br>(iv) ඉඩම් හා ගොඩනැගිලි භෞතිකව සත්‍යාපනය කර නොතිබීම.<br>(v) වත්කම් පරිපාලනයේ දුර්වලතා නිසා සංස්ථාවට පාඩු සිදුවී තිබීම.<br>(vi) ඇතැම් වත්කම් ඉවත්කර විකුණා ඇතත් ඒවා පොත් වලින් ඉවත් කර නොතිබීම. |
| (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | (i) වර්ෂ 41 කට වඩා පැරණි ණය ශේෂ අය නොවී පැවතීම.<br>(ii) ණයගැති පාලන ගිණුම් හා උපලේඛන අතර වෙනස හඳුනාගෙන සැසඳීමට කටයුතු කර නොතිබීම. |

(iii) ණයහිමි පාලන ගිණුම් හා උපලේඛන අතර වෙනස හඳුනාගෙන සැසඳීමට කටයුතු කර නොතිබීම.

(iv) වසර 02ත් 10 ත් අතර නොගෙවූ උපචිත වියදම් පැවතීම හා වියදම් විශ්ලේෂණය කර පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබීම.

(v) ප්‍රමිත හා බදු පනත් අනුව බදු වගකීම් නිසි දිනයට නිරවුල් නොකිරීම.

(ඇ) තොග පාලනය

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අවසන් තොගය සඳහා භෞතික තොග ආගණනය කර නොතිබීම.

(ඈ) වාහන පාලනය

(i) අබලන් වූ වාහන හා භාවිතා කළ නොහැකි වාහන හඳුනාගෙන අපහරණය කිරීමට කටයුතු කර නොතිබීම.

(ii) වාහන පිළිබඳ භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබීම.

(ඉ) කාර්යය මණ්ඩල පරිපාලනය

(i) බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබීම.

(ii) නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවන ලෙස බඳවා ගත් උපදේශකයන් කාලය දීර්ඝ කරමින් වසර ගණනාවක් සේවයේ යොදවා තිබීම.

(iii) අනුමත නොවුණු තනතුරු සඳහා බඳවාගැනීම හේතුවෙන් සේවක අතිරික්තයක් පැවතීම.

(ඊ) ප්‍රසම්පාදන පාලනය

(i) සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබීම.

(ii) විකාශනාගාරයක් නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු පැවතීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඉහත සඳහන් කරුණ පිළිබඳව ඔබගේ අංක එම්ඊඩී/ඒ/එස්එල්බීසී/1/16/463 හා 2018 පෙබරවාරි මස 14 දිනැති 14(2)(සී) කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙනි.

වාර්තාවේ 1:2, 1:3 වගන්ති හි සඳහන් කරුණුවලට එකඟ වෙමි.

**2:2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2:2:1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං ගි ප්‍ර) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී ලං ගි ප්‍ර) ප්‍රමිතිවලට යොමුව**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 , 25 ඡේදය

සමස්තයක් ලෙස තොග ගණනය කිරීම කරනු ලබන්නේ Fi Fo (ක්‍රමය (පෙර ලැබීම් පෙර පිටවුම් ක්‍රමය) අනුවය. එය සංස්ථාව දිගින් දිගටම අනුගමනය කර ඇත. ශේෂ පත්‍රයට අනුව 2016 තොගය මිලියන 25.91 ක් වන අතර, එයින් මිලියන 10ක් පමණ ඩීසල් තොගය වේ. එම තොගය ගැනුම් මිළට අගය කර ඇත. තොගය අධිතක්සේරු කර ඇතැයි යන මතයට එකඟ විය නොහැක.

2016 ගිණුම් ප්‍රකාශයේ සටහන්වල 3.2.6 යටතේ මේ පිළිබඳව හෙළිදරව් කර ඇත.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 07 ඡේදය

සංස්ථාවේ පවතින මූල්‍ය තත්ත්වය අනුව ලැබෙන ආදායමින් කොටසක් ස්ථාවර තැන්පත් ගිණුමක් යටතේ තැන්පත් කරනු ලබන අතර, එම මුදල් ක්ෂණික අවශ්‍යතා මත ආපසු ලබා ගන්නා බැවින්, මෙය ආයෝජනයක් ලෙස සැලකිය යුතු නොවේ.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 07 ඡේදය

මෙම වාහනය මේ දක්වා ගුවන් විදුලි සංස්ථාවට පවරා දී නොමැත. ජනාධිපති ලේකම් කාර්යාලයට පවරා දීමට කටයුතු කර ඇත.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත
අංක 17
(ස) 33 ඡේදය

**මෙම ඡේදය යටතේ පෙන්වා ඇති ඉඩම් කල්බදු ක්‍රමය යටතේ ගිවිසුම් මගින් පවරා ගෙන නැත. ඒවායේ වර්තමාන තත්ත්වය පහත දැක්වේ.**

| ඉඩම | විස්තරය |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා බාහිර ආයෝජකයෙකුගේ සේවය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් මෙම බදු ඉල්ලීම සිදුකර ඇති අතර, එම ක්‍රියාවලිය සිදුවී නැත. නමුත් බදු ගණනය කිරීමට වාර්ෂිකව සිදුකර ඇත. විගණනය විසින් ප්‍රකාශිත මුදල බදු වශයෙන් ගණනය වී ඇත.<br>මේ සම්බන්ධයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර එහි තීරණය අනුව අදාල ඉඩම් කොටස බදු ගෙවීමකින් තොරව සංස්ථාවට පවරා දෙන ලෙස දන්වා ඇත. එම කටයුතු කෙරෙමින් පවතී. |
| නුවරඑළිය | අඹේවෙල පිහිටි නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් කොටස සංස්ථාව වෙත බදු ලබා දී තිබුණද, වින් පවර් ආයතනයට ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇති නිසා නැවත |

මැනුම් කටයුතු කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් නැවත සංස්ථාවට ලබාදෙන ඉඩම් කොටස සඳහා බදු මුදල තක්සේරු කර එවිය යුතුය.

කුච්චවේලි — මෙම බදු මුදල සංස්ථාවේ මූල්‍ය තත්ත්වය අනුව දරාගත නොහැකිය. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් මගින් ඉඩම් කොමසාරිස් ජනරාල්ට අදාල තොරතුරු දන්වා මෙම බදු මුදල සම්බන්ධයෙන් කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

හුන්නස්ගිරිය — මේ සම්බන්ධව සාකච්ඡා කර ඉදිරි කටයුත කිරීමට තීරණය කර ඇත.

(**ii**) 56 ජේදය — මේ දක්වා කල්බදු ගිවිසුමක් ක්‍රියාත්මක නොවන බැවින් ගිණුම්ගත කර නැත.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 23 (**a**) ජේදය — විදේශීය ණය ගැතියන් 2007 සිට අයවිය යුතු ප්‍රමාණය ඒ ඒ වර්ෂවල පවතින විනිමය අනුපාතයට ගණනය කර ගිණුම්වල පෙන්වා ඇත. මෙම ණයවලින් (කොටසක් අයකර ගැනීමේ අවිනිශ්චිත භාවයක් පවතින බැවින් එම ප්‍රමාණය වර්තමාන විනිමය අනුපාතයට පරිවර්තනය කර දැක්වීමෙන් උපලබ්ධි නොවන ලාභයක් ගිණුම්වල පෙන්වන හෙයින් ඒ මත බදු මුදල්ද ගෙවීමට සිදුවනු ඇත. ඒ අනුව ප්‍රවර්ථන වර්ෂවල මුදල් පමණක් පවතින මිලට ගණනය කර ඇත.

### 2:2:2 විගණනයේ විෂය පථය සීමා කිරීම

අ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත අංක 501 ජේද අංක **A1** — 2016 වර්ෂයේදී කැසට් පට, සඟරා සහ ඉන්ධන තොගය භෞතිකව ගණනය කර ගිණුම්වලටගෙන ඇති අතර, ප්‍රධාන ගබඩාව නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවේදී කඩා ඉවත් කර තාවකාලික ස්ථානයකට මාරු කිරීම නිසා තොග භෞතිකව පරික්ෂා කිරීමට අපහසු විය.

ආ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත — 2016 වර්ෂයේ කැසට්, සඟරා තොග ගණනය අංක 705 කිරීමේදී විගණකාධිපති වෙත වාර්තා කොට ජේද අංක **A**12 නැත. 2017 වර්ෂයේ තොග ගණනයේදී විගණනය දැනුවත් කොට ඇත.

### 2:2:3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2016 වර්ෂයට අදාලව බදු කුලී ආදායම සහ ලැබිය යුතු බදු කුලී ආදායම නිවැරදිව කර 2017 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදී.

(ආ) ගිණුම්ගත කිරීමේ දෝෂයක් සිදුවී ඇති අතර, එය 2017 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඇ) 2017 වර්ෂයේදී ගිණුම් නිවැරදි කර ඇත.

(ඈ) ආර්ථික සේවා ගාස්තු අනුපාතය 2016 දෙවන කාර්තුවේදී 0.25% සිට 0.5% දක්වා වැඩිකළ බවට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව දන්වන ලද්දේ 2017 වර්ෂයේදීය. ඒ වන විට අදාල ගෙවීම් ආර්ථික සේවා බදු පනත ප්‍රකාරව වාර්තා සකස් කර යවා තිබුණි. 2017 වර්ෂයේදී ගෙවිය යුතු අර්ථික සේවා ගාස්තු ගිණුම්වල දක්වා ඇත.

(ඉ) ඉහත (ඈ) දක්වා ඇති පරිදිම දඩ මුදලක් ඇති වුවත්, එය ඉවත්කර ගැනීමට කටයුතු කර ඇති අතර, එම නිසා ගිණුම් ගලපා නැත.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ත්‍රිකුණාමල විකාශනාගාරය වෙනමම ව්‍යාපෘතියක් ලෙස සලකා තිබූ හෙයින් ඉන් ලද ආදායම වෙනත් ආදායම් යටතේ අවසන් ගිණුම්වල

ඇතුලත් කරන ලදී.

(උ) ගුවන්කාල විකුණුම්වලට බලපාන වියදම ගණනය කරන්නේ ඍජුවම වැඩසටහන් නිෂ්පාදන වියදම, පරිපාලන වියදම්වලින් නාලිකාවලට ඍජුව සම්බන්ධවන සේවක වැටුප්, දීමනා, සම්ප්‍රේෂණාගාර සඳහා විදුලිය වෙනුවෙන් ගෙවන ගාස්තු හා අනෙකුත් ඍජුවම ගුවන්කාල සඳහා වන වියදම් වේ. විගණනය පෙන්වා දී ඇති පරිදි ගුවන් කාල විකුණුම් කොමිස් ඍජුවම ගුවන්කාල ආදායමට ඇතුළත් විය යුතුද යන්න නැවත විමසා බලා තීරණයක් ගෙන ඉදිරි වර්ෂවල නිවැරදි කිරීමට සලකා බැලිය හැක. විගණනය පෙන්වා දී ඇති පරිදි විකුණුම් පිරිවැය 50%ක් අඩුවෙන් දක්වා ඇතැයි යන්නට එකග විය නොහැකිය. අවසාන මූල්‍ය ප්‍රතිඵලය සඳහා මේ මගින් බලපෑමක් වී නැත.

(ඌ) ඡේදය මගින් පෙන්වා දී ඇති පරිදි ආර්ථික සේවා ගාස්තුව ගිණුම්වලට ගැලපීමේ ක්‍රමය නිවැරදි බව පිළිග න්නා අතර, සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබූ නිසා ලාභ අලාභ ගිණුමට හර කර ඇත.

(එ) ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල අතර සිදුවන ගුවන්කාල විකුණුම් ගනුදෙනු සටහන් කෙරන ජංගම ගිණුම් 2016 වර්ෂයේ ජනවාරි සිට පරික්ෂා කිරීමේ කටයුතු සිදුකළ අතර මේ දක්වා එය සිදුවෙමින් පවතී. 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සියලු ප්‍රාදේශීය කාර්යාල ජංගම ගිණුම් පරික්ෂා කරන ලද අතර ප්‍රධාන කාර්යාලයෙන් විකාශනය කිරීමට ලබාදුන් දැන්වීම් විකාශනය කර ඇතත් ආදායමට ගිණුම්ගත නොවුනු ආදායම් ගිණුම් ගත කිරීමටත් කටයුතු කරන ලදී. එහිදී හඳුනාගත් ප්‍රධාන දෝෂ දෙක වූයේ ප්‍රාදේශීය කාර්යාල විසින් ආදායම් ගිණුම්ගත නොකර තිබීම හා ගිණුම්ගත කළ ආදායම් ප්‍රාදේශීය කාර්යාලවල ජංගම ගිණුම් සටහන් නොයෙදීමක්ය. ඒ අනුව 2016ට පෙර ආදායම් ගිණුම්ගත නොකර තිබූ වටිනාකම පෙර වර්ෂවල ආදායමට එකතු කිරීමෙන් 2017දී තවදුරටත් පරික්ෂා කර ජංගම ගිණුමට සටහන් නොගැලපූ ගනුදෙනු නිවැරදි කිරීමටත් කටයුතු කර ඇත. ඒ අනුව 2016 අවසන් ගිණුම් වාර්තාවේදී 2016 වර්ෂයට අදාල ගනුදෙනු පරික්ෂා කර බලා නිවැරදිව ගිණුම් තබා ඇත. 2015-12-31 දිනට තිබූ ශේෂයන් පෙර වර්ෂවලට ගැලපීමට කටයුතු කර ඇත.

(ඒ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල ජංගම ගිණුම් සැසඳීමේදී රුහුණු සේවයෙන් ලැබුණු රු. 128,321/-ක මුදලක් මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුමට ඇතුලත් කළ යුතුව තිබුණද, එය ඇතුලත් වී නොතිබුණු අතර රුහුණු සේවය මගින් එම මුදල කඳුරට ජංගම ගිණුමට බැරකර තිබුණි. එම ද්විත්ව සටහන නිවැරදි කිරීම සඳහා එය ණයහිමියන්ට මාරු කර ඇත. විගණනය පෙන්වා දෙන පරිදි එම මුදල ණයගැතියන්ට ගැලපීම් කළේනම් වාඩාත් අර්ථාන්විතය.

(ඔ) මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු වෙමින් පවතී.

(ඕ) බැරකම නිශ්චිතව හඳුනාගත් පසු ගිණුම්වලට ඇතුලත් ගැලපීමට කටයුතු කරනු ඇත. මෙය තවමත් නිශ්චිත තීන්දුවක් නොමැතිව පවතින නඩු කටයුත්තකි.

(ක) මෙය අවිනිශ්චිත ශේෂයක් නොවන නිසා අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කළ නොහැක. මෙම ශේෂය අනිවාර්යයෙන්ම සංස්ථාවට අයවිය යුතු මුදලක් නිසා විවිධ ණයගැතියන් ලෙස දක්වා ඇත.

(ග) 1979 වර්ෂයේදී ලිපියක් මගින් අවුරුදු 30 කාලයක් සඳහා බදු ලබාදී තිබූ මෙම ඉඩම හා මාර්ක්බෝඩ් ආයතනයෙන් රු. 250,000/- මිලදී ගත් ගොඩනැගිල්ල ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වර්තමානය වන විටත් භුක්ති විඳිමින් ඇත. ඉදිරියට සංස්ථාවට බදු ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් මගින් කටයුතු කරමින් ඇත.

(ච) 2017 වර්ෂයේදී මේ සඳහා ගිණුම ගලපා ගොඩනැගිලි ගිණුම නිවැරදි කර ඇත.

(ජ) 2017 මූල්‍ය ප්‍රකාශයේදී නිවැරදි ගොඩනැගිලි වටිනාකමට අයත් සමුච්චිත ක්ෂය හා ක්ෂය ගැලපීම නිවැරදි කර ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

(ට) 2017 වර්ෂයේදී මෙම ගනුදෙනුව සම්බන්ධව ගිණුම් ගලපා වත්කම් අපහරණ ගිණුම මගින් ප්‍රාග්ධන වාසිය ගණනය කර මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කරීමට කටයුතු යොදා ඇත.

(ඩ) ත්‍රිකුණාමල විකාශනාගාර ව්‍යාපෘතිය 2016 වර්ෂය වන විටත් වෙනමම ව්‍යාපෘතියක් ලෙස සැලකීම නිසා ඉන් ලැබිය යුතු ආදායම ද වෙනත් ආදායම් යටතේ දැක්වීම කර ඇත. 2017 වර්ෂයේදී ත්‍රිකුණාමල ව්‍යාපෘතිය අනෙකුත් ප්‍රාදේශීය කාර්යාල වශයෙන් ගිණුම්වල දැක්වීමට කටයුතු කර ඇති හෙයින්, මෙම ආදායමද ඒ අනුව ගුවන්කාල ආදායමට එකතු කර දැක්වීමට කටයුතු යොදා ඇත.

2:2:4 **නොසැසඳූ පාලන ගිණුම**

| | |
|---|---|
| අ විදේශ වෙළඳ ණයගැතියෝ<br>ආ අගරු චෙක්පත්<br>ඇ සේවක ණය<br>ඈ ලැබිය යුතු තැන්පතු<br>ඉ සේවක විවිධ අත්තිකාරම් | නොසැසඳුනු පාලන ගිණුම්වල කේවල ශේෂ ලැයිස්තු මගින් සනාථ කළ නොහැකි පැරණි ශේෂ යටතේ ඇති 2007ට පෙර සියලුම ගුවන්කාල ණයගැතියන් අයකර ගැනීමේ හැකියාවක් නොමැති හෙයින්, සංස්ථා මණ්ඩල අනුමතියෙන් කපාහැරීම සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. කේවල ශේෂ ලෙස දැක්විය නොහැකි ලේඛන වලින් සනාථ කළ නොහැකි අනෙකුත් ශේෂද සංස්ථා මණ්ඩලයට ඉදිරිපත් කර මහා භාණ්ඩාගාරයට අනුමතියට ඉදිරිපත් කර ඇත. |

2.2.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) උපලේඛන හා පාලන ගිණුම් අතර වෙනසක් පවතින බව දන්වන අතර 2017 වසරේදී මෙම මුදලින් මිලියන 2.4ක් සඳහා ගැලපීම් කර ඇත.

(ආ) නිරවුල් නොකළ පැරණි ශේෂ පවතී.

(ඇ) 2007 දක්වා පැරණි ශේෂ කපාහැරීමට භාණ්ඩාගාර අනුමතිය ඉල්ලා ඇත.

(ඈ) විගණන ගාස්තු කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කර ඇත.

(ඉ) 2012 හා 2016 ණය හිමියන් සඳහා කරන ලද ගැලපීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා භාණ්ඩාගාර අනුමතිය ලැබී ඇත.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ණයහිමි පාලන ගිණුම හා කේවල ශේෂ ලැයිස්තු අතර පැවති වෙනස හඳුනාගැනීමට අවශ්‍ය මූලික ලිපි ලේඛන සොයා ගැනීමට නොහැකිවීමත් ණයහිමියන් සම්බන්ධයෙන් කිසිම හිමිකම් පෑමක් නොකළ බැවින් මෙම ගැලපීම් කළද 2017 මේ පිළිබඳ පරීක්ෂා කර බලා නිවැරදි කිරීම් කර ඇත.

(උ) ගුවන්විදුලි සංස්ථාවේ සම්ප්‍රේෂණ කුළුණ බඳුදීම වෙනුවෙන් මෙම මුදල සංස්ථාවට අයවිය යුතුව ඇත.

(ඌ) ණයගැතියන් 04 දෙනෙකු එවා තිබූ පිලිතුරු අනුව අයවිය යුතු ශේෂයක් නැති බවට සඳහන් කර තිබුණද එම අයගෙන් අයවිය යුතු ශේෂ පවතින බව සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වේ.

2:2:6 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

| | |
|---|---|
| (අ) ඉඩම් | ඉඩම් පිළිබඳ විස්තර වාර්තාව විගණනයට ඉදිරිපත් කර ඇත |
| (ආ) ගොඩනැගිලි | සංස්ථාවේ විකාශනාගාර ප්‍රාදේශීය සේවා හා වෙනත් කාර්යයන් සඳහා යොදාගත් දැනටමත් යොදාගන්නා ගොඩනැගිලි සම්බන්ධ විස්තරාත්මක වාර්තාවක් සකස් කිරීමට සිවිල් ඉංජිනේරු අංශයට පවරා ඇත. |
| (ඇ) ණයගැතියන් | මරණ දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් අයකිරීම ප්‍රාදේශීය උපතැපැල් කාර්යාල මගින් කර ඇති අතර, දැනට වසර 10කටත් අධික කාලයක සිට පවතින මෙම විස්තර සොයාගැනීමට ලිපිගොනු නොමැතිවීම නිසා පරීක්ෂා කර බලා 2017 සංස්ථා මණ්ඩලයට යොමු කොට අනුමතියෙන් කපාහැර ඇත. |
| (ඊ) ත්‍රිකුණාමල (ඩොයිෂවෙල්) ප්‍රතිවිකාශන මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් | ඉදිරියේදී මෙම ස්ථාවර වත්කම් සම්බන්ධ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කරනු ඇත. |

| | |
|---|---|
| (උ) කෙරීගෙන යන වැඩ සඳහා ගෙවීම් (ප්‍රධාන කාර්යාල නව ගොඩනැගිල්ල) | මෙම සියලුම ඉදිකිරීම් කටයුතු නාගරික සංවර්ධන අධිකාරියෙන් කෙරුණු අතර, මේ දක්වා ඒ සම්බන්ධ වාර්තා සංස්ථාව අවස්ථා කිහිපයකදීම ලිඛිතව මෙන්ම වාචිකවද ඉල්ලා ඇති අතර මේ දක්වා ලබාදී නැත. |
| (ඌ) වසර 10කට අධික කාලයක සිට ගිණුම්වල පවතින වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ (ලක්හඬ ශාඛා ගිණුම) | ලක්හඬ ගුවන් විදුලිය ගුවන්විදුලි සංස්ථාව යටතේ ගුවන්විදුලි පරිශ්‍රය තුළම පවත්වාගෙන ගොස් තිබූ අතර එය පසුව අයි ටී එන් ආයතනයට පවරා ගන්නා ලදී. සංස්ථා පරිශ්‍රය තුළ පවත්වාගෙන ගිය කාලයට අදාලව එම ආයතනයට සපයන ලද පහසුකම් සඳහා අයවිය යුතු මුදල් ලෙස ගිණුම්වල සටහන් කර ඇතත්, එය සනාථ කිරීම සඳහා ගිවිසුම් හෝ වෙනත් වාර්තා නැත. |
| (ඍ) අවසන් තොග | 2016 වර්ෂය අවසානයේදී නව ගොඩනැගිල්ලට යාබදව තිබූ ගබඩාව කඩා ඉවත්කිරීම නිසා තොග ගණනය කිරීමට නොහැකිවිය. |

**2:2:7 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 13(6) වගන්තිය | විගණන නිරීක්ෂණ නිවැරදිය |
| 14(1) වගන්තිය | 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ වනවිට සකස් කර පරිවර්තන කටයුතු සඳහා භාරදී ඇත. වාර්ෂික වාර්තාව සඳහා අනිවාර්යයෙන් ඇතුලත් කළයුතු 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වර්තාව සංස්ථාව වෙත ලැබුණේ 2017 සැප්තැම්බර් 30 වන දිනයි. එම තොරතුරු සඳහා සංස්ථාවේ 2016 විගණන වාර්තා ලැබුණු විගස වාර්ෂික වාර්තා කෙටුම්පත සකස් කර විගණනයට ඉදිරිපත් කරනු ඇත. |
| (ආ) 2006 අංක 13 දරන පනත හා 2017 මැයි 17 දිනැති 2017 අංක 07 දරන ආර්ථික සේවා ගාස්තු පනත | ගැසට් පත්‍රය ප්‍රමාදවී ලැබුණු බැවින් ඒ මත පැරණි අනුපාතයට බදු ගණනය කිරීම නිසා වගකීම අඩුවෙන් දක්වා තිබුණද මේ වන විට එය නිවැරදි කර ඇත. 2016-12-31 දිනට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව නිවැරදි වේ. |
| (ඇ) මු.රෙ. 371(2)(ඇ) | මෙම අත්තිකාරම් මුදල් මේ වන විට පියවා ඇත. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 4.2.2 වගන්තිය | සමස්තයක් ලෙස සංයුක්ත සැලැස්මේ කාර්ය සාධනය පිළිබඳ ඍජු අවධානය යොමු නොවී තිබුණත් ප්‍රයෝගිකව ක්‍රියාත්මක වැඩසටහන් සම්බන්ධ අධීක්ෂණයක් සිදුවී ඇත. |
| 7.4.5 වගන්තිය | වාහන සම්බන්ධයෙන් භෞතිකව පරීක්ෂා කර වාර්තා සකස් කර ඇත. |

| | |
|---|---|
| 5.1.3 වගන්තිය | 2016-2018 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර නොමැති අතර 2018-2020 සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර ඇත. |
| (ඉ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය I ඡේදය | විගණනය සඳහන් කර ඇති එක් වාහනයක් ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවුවද ඒ සඳහා කිසිවෙකු ඉදිරිපත් නොවීය. ඉතිරි වාහන අපහරණය කිරීම සඳහා කටයුතු කිරීමට නියමිතය. |
| (ඊ) 2005 ජූනි 16 දිනැති අමප/05/විවිධ (026) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | සංස්ථාවේ සේවා අවශ්‍යතාවය මත අංශ ප්‍රධානීන්ගේ නිර්දේශය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය සහිතව මෙම පත්කිරීම සිදුකර ඇත. |
| (උ) 2007 මැයි 11 දිනැති අංක 09/07 දරන පරිපාලන චක්‍රලේඛයේ 08 වන වගන්තිය | සංස්ථාවේ සේවා අවශ්‍යතාවය මත මෙම නිලධාරියා නැවත පත්කිරීමට සිදුවූ අතර සංස්ථා මණ්ඩලයෙන් නියම කළ ගෙවීම් කරයි. |
| (ඌ) 1978 දෙසැම්බර් 19 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සංස්ථාවේ මුදල් අංශය මගින් භාණ්ඩ සමීක්ෂණ කමිටු පත්කරන අතර ඔවුන් විසින් සිදුකරනු ලබන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට සමගාමීව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කරයි.<br><br>2011 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යයි. ඉඩම් සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් සකස් කර ඇත. එහි සංස්ථාව සතු ඉඩම්වල සියලු විස්තර ඇතුළත් කර ඇත. ගිණුම්වල සංස්ථාව භුක්ති විඳින ඉඩම් සම්බන්ධ සටහන් යොදා ඇත. 2017 වර්ෂයේදී සංස්ථාව සතු වාහන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇත. 2011ට පෙර වත්කම් හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණන ලේඛන සකස් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට නියමිතය. |
| (ඒ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධ ලේඛනයක් තොරතුරු තාක්ෂණ අංශයට සකස් කරන ලෙස දැනුම් දී ඇත. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

(අ) විගණනය සඳහන් කර ඇති නිරීක්ෂණ නිවැරදිය

(ආ) විගණනය සඳහන් කර ඇති නිරීක්ෂණ නිවැරදිය

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) විගණනය ඉදිරිපත් කර ඇති අනුපාත විශ්ලේෂණය නිවැරදි වේ.

3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

(අ)

i ජංගම වත්කම්වල ඇතුලත් කර ඇති කේවල නාම ලෙස හඳුනාගත නොහැකි ණය ශේෂ ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

ii විදේශ ණය ලෙස 1974 සිට 1999 දක්වා මිලියන 35.3ක්ද, 2000 සිට 2005 දක්වා මිලියන 23.8 ක්ද වශයෙන් අයවිය යුතුව ඇත. එම ණය මේ දක්වා උපලබ්ධි නොවී පවතී. උපලබ්ධි නොවන ණය වර්තාමානය විනිමය අනුපාතයට ගණනය කර ගිණුම්වල පෙන්වීම මත උපලබ්ධි නොවන ආදායමක් සහ ඒ මත බදු ගෙවීමට ද සිදුවන බැවින්, වර්තමාන අගයට ගණනය කර නැත.

(ආ) අවසන් ගිණුම්වලදී දළ ලාභය සලකා බලනුයේ විකුණුම් මත ලාභ ප්‍රතිශතය ගණනය කර බැලීමට සහ අනුපාත ගණනය කර යම් යම් තීරණවලට එළඹීමටය.

(ඇ) අනුපාත විශ්ලේෂණ නිවැරදිය

(ඈ) මහා භාණ්ඩාගාරයෙන් නිශ්චිත කාර්යයක් සඳහා ලබාදුන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ආයෝජනය කර ලාභ ලැබිය නොහැක.

3.4 සංස්ථාවට එරෙහි හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්

(අ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ආ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ඇ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ඈ) විගණන නිරීක්ෂණ නිවැරදිය

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) විගණනය සඳහන් කර ඇති සංස්ථාවේ අරමුණු නිවැරදිය.

(ආ) සංස්ථාවේ අනවශ්‍ය වියදම් හඳුනාගෙන එම වියදම් සීමා කිරීමට කටයුතු කළද, පාලනය කළ නොහැකි වැටුප් ආදි වියදම් නිසා දිගින් දිගටම වියදම් වැඩිවී ඇත.

(ඇ) ප්‍රාදේශීය කාර්යාලවල අලෙවි ආදායම වැඩිකිරීම සඳහා යම් යම් ක්‍රමෝපායන් අනුගමනය කිරීම තුලින් යම් පමණකට ආදායම් වැඩිවී තිබුණද අලාභයට හේතුවන්නේ වියදම වැඩිවීමයි.

(ඈ) ප්‍රාදේශීය සේවා සහ සමස්ත ගුවන්විදුලියේ ශ්‍රවණ තත්ත්වය වර්ධනය කිරීම සඳහා සම්ප්‍රේෂණ පද්ධති සවිකිරීම හා පවතින පද්ධති යාවත්කාලීන කිරීම සඳහා වියදම් අනිවාර්යයෙන්ම දැරිය යුතුය. එම නිසා සංස්ථාව පාඩු ලැබූවත් මෙම අනිවාර්ය වියදම සිදුකර ඇත.

(ඉ) විගණන නිරීක්ෂණ නිවැරදිය

(ඊ) තරඟකාරි වෙළඳපල තුල ගුවන් කාලය අලෙවි කිරීම සඳහා අලෙවි අංශයේ කාර්ය මණ්ඩල උත්සාහය තුලින් වෙළඳ පල අභියෝග ජයගැනීම සඳහා කටයුතු කරයි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මෙම ඉඩම් පවරා ගැනීම සඳහා අදාල රාජ්‍ය ආයතන සමග කටයුතු කරමින් ඇත. අදාල ගොනුව විගණනයට ඉදිරිපත් කළ අතර, ගොඩනැගිලි වටිනාකම සම්බන්ධ විගණන නිරීක්ෂණ නිවැරදිය.

(ආ) ප්‍රධාන කාර්යාලයේ වාණිජ පරමාර්ථයෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමේ අයිතිය ඉල්ලා සිටීමේදී ඒ සඳහා බදු අයිතිය ලබාදීමට එම බදු මුදල ගණනය කර තිබුණි. නමුත් මෙම කාර්යය ඉටු නොවුන අතර බදු මුදල් ගෙවීම් කිරීමට නොහැකි බව දිගින් දිගටම අදාල ආයතන දැනුවත් කරන ලදී. ඒ අනුව මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර බදු අයකිරීමකින් තොරව ප්‍රධාන

කාර්යාලයේ ඉඩම සංස්ථාවට පවරා දීමට අනුමතිය ලැබී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු කරමින් ඇත.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියට ඉඩම් පැවරීමේදී සංස්ථාව සතුව පැවරුම් ඔප්පු තිබුණ අතර අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මුදල් ලබා ගැනීමේදීද එම පැවරුම් ඔප්පුව අනුව මුදල් ලබාගෙන ඇත. නමුත් මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයට පවරා දීමේදී එම පැවරුම් ඔප්පුවේ දෙවන උපලේඛනය පදනම් කරගෙන ඉඩම පවරාගෙන ඇත.

(ඈ) විගණන නිරීක්ෂණ නිවැරදිය.

(ඉ) ඉඩම් හැර ගොඩනැගිලි පිරියත හා උපකරණ, සංගීත භාණ්ඩ , ලී බඩු පටිගත කිරීමේ යන්ත්‍ර හඬ තරංග උපකරණ, ට්‍රාන්ස්මීටර්, පරිගණක යන ස්ථාවර වත්කම් සඳහා ලේඛන සකස් කිරීමට අදාල අංශ වෙත කටයුතු කරන ලෙස දැනුම් දී ඇත ඉඩම් ලේඛනය සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

(ඊ) මේ සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා නීති අංශය කටයුතු කිරීමට නියමිතය.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) අඹේවෙල මධ්‍යම තරංග විකාශනාගාරය පවත්වාගෙන යාම සඳහා සංස්ථාවට පවරා තිබූ අක්කර 30 භූමි ප්‍රමාණයෙන් සංස්ථාව දැනටමත් භුක්ති විඳින සංචාරක බංගලා ලෙස භාවිතා කරන සංස්ථා ගොඩනැගිලි සහිත භූමි ප්‍රමාණය හා පිවිසුම් මාර්ගය පමණක් සංස්ථාව මගින් ඉලල්ම් කර ඇත. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඇත.

(ආ) ලංකා බෙල් ආයතනය සමග ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු යොදමින් ඇත.

**4:4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

(අ) නුවරඑළිය නිවහන නිවාඩු නිකේතනය සංස්ථාව විසින් පවත්වාගෙන යයි. සංස්ථා මණ්ඩල තීරණයක් අනුව ගැනුම්කරුවකුට බද්දට දී තිබූ අතර නැවත පවරා ගැනීමට කටයුතු කර ඇත.

**4:5 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්**

ගුවන්විදුලි සේවා ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා ලබාගත් මෘදුකාංගය සංස්ථාවේ සේවා 03ක් සඳහා සාර්ථකව ක්‍රියාත්මක වේ. ගිණුම්කරණය සඳහා නව මෘදුකාංගයක් හඳුන්වා දීමට කටයුතු කරයි.

**4:6 හඳුනාගන්නා ලද පාඩු**

අ ආර්ථික සේවා ගාස්තු පනත ප්‍රමාද වී ගැසට්වීම නිසා පැරණි අනුපාතයට බදු ගණනය කිරීම නිසා මෙම ශේෂය පැවතියද මේ වන විට නිවැරදි කර ඇත.

ආ සංස්ථාවේ නවීකරණ කටයුතු සිදුකරන ලද්දේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබූ නාගරික සංවර්ධන අධිකාරිය විසිනි. නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉවත්වීම නිසා වැඩ හෙමින් සිදුවීම මත මෙම මුදල් වැඩි කාලයක් ගිණුමේ පැවතුණි. ප්‍රාග්ධන ආධාර ඉතිරි කිරීමේ හෝ වෙනත් ගිණුමක ආයෝජනය කළ නොහැක.

ඇ විගණනය අදහස් කරන පරිදි ආයෝජනය කළ නොහැකි මුදලක් ආයෝජනය කර, පොලී ලබාගෙන අයිරා පොලියට හිලව් කිරීමට හැකියාවක් නැත.

ඈ ගුවන්විදුලි සංස්ථාවේ දැනුවත් වීමකින් තොරව මෙම ඉඩම් කට්ටි බෙදා දී ඇත. මේ සම්බන්ධයෙන් අදාල සියලුම අංශ වෙත සංස්ථාවට තක්සේරු වටිනාකම අයකර දීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. කටාන ප්‍රාදේශීය ලේකම් විසින් 2000-2001 කාල වකවානුව තුල බෙදාදී ඇතැයි විගණනය සඳහන් කර ඇති ඉඩම් කොටස් වලද තක්සේරුව ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.

ඉ මේ සම්බන්ධ විමර්ශනයක් පැවැත්වෙමින් පවතී. වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.

**4:7 අනාර්ථික ගනුදෙනු**

2015-01-19 දින එවකට අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ ටී. ඩී. කේ. ඒ. ජයන්ත මහතා එම තනතුරෙන් මුදාහැර ඇත. නමුත් ඒ වන තෙක් ඔහුට ගෙවූ වැටුප් ඇතුළු අනෙකුත් පහසුකම් විශ්‍රාම යන තෙක්ම ගෙවා ඇත.

**4:8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

කරගහතැන්න විකාශනාගාර කටයුතු සක්‍යතා අධ්‍යයනයකින් පසුව සිදුකර ඇත. ටෙන්ඩර් කටයුතු අමාත්‍යාංශය මගින් ඉටුකර ඇත. සංස්ථා ඉංජිනේරුවන් මේ සඳහා සම්බන්ධ වූ අතර තාක්ෂණික හේතූන් මත ව්‍යාපෘතියේ යම් ප්‍රමාදයක් සිදුවිය. මේ සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා සම්ප්‍රේෂණ යන්ත්‍රවල කාර්යක්ෂමතාවය හා ඉංජිනේරු සහතිකය 2016-08-02 දින විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

**4:9 කාර්ය මණ්ඩල පරිපාලනය**

2006-09-22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු විධිවිධාන අනුව මේ වන විටත් බඳවා ගැනීම් පටිපාටිය සකස් වෙමින් ඇත. 2013 වර්ෂයේදී අනුමත වී ඇති සේවක සංයුතිය සම්බන්ධයෙන් පවතින ගැටළු හේතුවෙන් නැවත සේවක සංයුතිය සකස් කරමින් පැවතීම මෙයට හේතුවයි.

(ආ) 2013 වර්ෂයේ අනුමත සේවක සංයුතිය අනුව විගණන නිරීක්ෂණ නිවැරදි වේ.

(ඇ) සංස්ථාවේ මාණ්ඩලික තනතුරු ඇතුලු සියලුම පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වුවත් නව සේවක සංයුතිය අනුමත වී බඳවා ගැනීම් පටිපාටිය සකස් වන තුරු ප්‍රමාදයක් ඇත.

**4:10 වාහන උපයෝජනය**

(අ) අංක 64-3220 දරන වාහනයේ අයිතිය පවරා ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය සමග අදාල කටයුතු කරමින් ඇත. නමුත් ගුවන්විදුලි සංස්ථාවට පැවරීම සම්බන්ධ ලේඛන සොයා ගැනීමේ අපහසුව නිසා මෙය අපහසු වී ඇත. තවමත් සංස්ථාව මෙම වාහනය භුක්ති විඳිමින් ඇත.

(ආ) අංක 60-0355 දරන වාහනය භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින අතර, මහවැලි අධිකාරියට මෙය ඉවත් කර ගන්නා ලෙස දැනුම් දී ඇත. මෙම වාහනයේ ලියාපදිංචිය ඇත්තේද මහවැලි අධිකාරියට බැවින්, මෙය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5:1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

විගණන නිරීක්ෂණ නිවැරදිය

**5:2 සංයුක්ත සැලැස්ම**

විගණන නිරීක්ෂණ නිවැරදිය

**5:3 ක්‍රියාකාරී සැලැස්ම**

ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කරුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී යම් යම් අඩුපාඩු සිදුවී ඇති බව පිළිගන්නා අතර, මූල්‍ය දුෂ්කරතාද සමහර අවස්ථාවලදී බලපා ඇත.

**5:4 අභ්‍යන්තර විගණනය**

(අ) අභ්‍යන්තර විගණන විමසුම්වලින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීම සඳහා අදාල අංශවලට යොමු කර ඇත.

(ආ) විගණන සහායකයින් ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරනු ඇත.

**5:5 ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදයේ (ආ) වගන්තිය අනුව අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා සැලැස්මක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු යොදා ඇත.

**5:6 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2014 වාර්ෂික වාර්තාව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

5:7 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) පුත්තූර් ඇන්ටනා කුළුණ සම්බන්ධයෙන් 2015 වර්ෂයේද මෙම කරුණු විගණන වාර්තාවට ඇතුලත්වී ඇති අතර, ලක්සල ආයතනය සමග සාකච්ඡා කර ගෙවූ අත්තිකාරම් මුදලින් රුපිලියල් මිලියන 4.3ක් අයකරගෙන ඇත.

(ආ) තවමත් සවි කිරීමට කටයුතු නොකළ මීටර් 60 ක් සහ 100ක් උස ඇන්ටනා කුළුණු සඳහා ලබාගෙන ඇති කුළුණුවල කොටස් පරීක්ෂා කර බලා තක්සේරු කර සුදුසු පරිදි ගිණුම් සංශෝධනයට කටයුතු කරන ලෙස අදාල අංශ දැනුවත් කර ඇත.

(ඇ) මෙම නිවාස දෙකම නිවාස සංවර්ධන අධිකාරිය සතු වන අතර, මහනුවර නිවාසය රූපවාහිනී සංස්ථාවෙන් මිලදී ගෙන ඇත. අනුරාධපුර නිවාසයද නිවාස සංවර්ධන අධිකාරිය සතු නිවසක් වන අතර මේවා පවරා ගැනීමට කටයුතු කර ඇත.

5:8 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

සංස්ථාවේ ශ්‍රවණ තත්ත්වය සම්බන්ධයෙන් පැමිණිලි ඉංජිනේරු අංශය වෙත යොමුකරන අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඉංජිනේරු අංශයෙන් ගනු ලබයි.

6. පද්ධති හා පාලනයන්

(අ) i සංස්ථාව විසින් පෞද්ගලිකව ඉඩම් හිමියන්ගෙන් මිලදීගත් ඉඩම් සඳහා නිත්‍යානුකූල ඔප්පු ඇත. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙනුවෙන් අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වෙත පවරා සංස්ථාවට වෙන්කර ඇති ඉඩම් සඳහා ඔප්පු ලබාදී නැත. ගුවන්විදුලි සංස්ථාවේ කාර්යයන් ඉටුකරන තුරු එම ඉඩම් භුක්තිය විදීමට සංස්ථාවට බාධාවක් නැත.

ii සංස්ථාවට විශාල ඉඩම් අවශ්‍ය වූයේ මධ්‍යම තරංග විකාශනාගාර පවත්වාගෙන ගිය අවධියේ වන අතර මේ වන විට එම තාක්ෂණය සංස්ථාව ඉවත්කර ඇත. එම නිසා එම ඉඩම් ප්‍රායෝජනයට නොගනී.

iii සංස්ථාවේ කටයුතු සඳහා භාවිතා කළ රජය විසින් පවරා දී තිබූ ඉඩම් රජයේ ඉල්ලීම මත වෙනත් පාර්ශවයන්ට භාරදී ඇත. මෙම ඉඩම් සඳහා ප්‍රතිලාභ ඉල්ලීම් කර ඇත.

iv ඉඩම් හා ගොඩනැගිලි භෞතිකව ප්‍රත්‍යාගණනය නොකළ බවට නිරීක්ෂණය නිවැරදිය.

v වත්කම් සඳහා ඒ ඒ ශාඛා අනුව වට්ටෝරු භාණ්ඩ ලේඛන පවත්වා ඇත.

02 i මෙම ණය අතරින් අය නොවන ලෙස හඳුනාගත් ණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ භාණ්ඩාගාරයට වාර්තාකර ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර ඇත.

ii ණයගැති පාලන ගිණුමේ වෙනස හඳුනාගෙන ඇති අතර ගිණුමේ පෙන්වන වෙනසට අදාලව කේවල ශේෂ වර්ගීකරණයක් කර ගැනීමේ අපහසුතාවය පවතී. හේතුව 2002ට පෙර මූලික ලිපිලේඛන සොයා ගැනීමට ඇති අපහසුතාවයයි. මෙය අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

| | | |
|---|---|---|
| 03 අවසාන තොගය | | 2017 වර්ෂය සඳහා භෞතික තොග ආනයනය කරගෙන යනු ලබන අතර තොග ගණනය කරන දිනයක්ද විගණනයට දන්වා ඇත. |
| 04 වාහන පාලනය | | (i) 2017 වර්ෂයේ අබලන් වූ මයික්‍රෝ වාහන 09ක් විධිමත් අනුමතියෙන් විකිණීමට කටයුතු කර ඇත. තවදුරටත් ඇති භාවිතා කළ නොහැකි වාහන සම්බන්ධයෙන් අදාල කටයුතු 2018 වර්ෂයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ඉවත් කිරීමට නියමිතය.<br>(ii) වාහන භෞතිකව පරීක්ෂා කර හඳුනාගෙන ඇත. |
| 05 වත්කම්වල පිරිවැය | | පැරණි සමහර වත්කම්වල පිරිවැය හඳුනාගත හැකි පරිදි ලේඛන නඩත්තු |

කර නොතිබීම නිසා සමහර වත්කම්වල පිරිවැය හඳුනාගත නොහැක. එහෙත් මෙම වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති බැවින් වත්කම්වල අගයක් නොපවතී දැනට පාවිච්චියට ගත හැකි වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කරයි.

(ආ) වගකීම් නිරවුල් කිරීම

i ණය හිමියන් — ණයහිමි පාලන ගිණුමේ හා උපලේඛන අතර වෙනස හඳුනාගෙන ඇතත් වෙනසට අදාල කේවල ශේෂ හඳුනාගත නොහැක.

ii උපචිත වියදම් — උපචිත වියදම් යටතේ දක්වා ඇත්තේ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය අනුව ගෙවීම් ප්‍රමාද කර ඇති මුදල් වන අතර, ඒවා ඉදිරි වර්ෂවලදී ගෙවීමට හෝ අදාල ආයතන සමග සාකච්ඡා කර තීරණයක් ගන්නා තෙක් පොත්වලින් ඉවත් කිරීමට නොහැක.

(ඇ) කාර්ය මණ්ඩලය පාලනය

i බඳවා ගැනීම් පටිපාටිය සකස් කර ඇති අතර අනුමතිය ලබාගෙන නැත.

ii සේවා අවශ්‍යතාවය මත සංස්ථා මණ්ඩල අනුමතියෙන් උපදේශකයන් බඳවාගෙන ඇත.

iii රාජ්‍ය ප්‍රතිපත්තිය මත දින 180 ඉක්මවා සේවය කර තිබූ සමහර සේවකයින් බඳවා ගැනීමට සිදුවීම.

(ඈ) ගිණුම්කරණය

i සංස්ථාවේ ගිණුම්කරණ ක්‍රමය යාවත්කාලීන වේ.

ii විකුණුම් පිරිවැය ගණනය කිරීමේ දෝෂ 2017 වර්ෂයේදී නිවැරදි කර ඇත.

iii වත්කම්, වගකීම්, ආදායම්, වියදම් ද්විත්ව සටහන් ක්‍රමය යටතේ ගිණුම් තබන බැවින් අත්හැරීමට හේතුවක් නැත.

(උ) ගිණුම්කරණය

i වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර ඇත

ii කොන්ත්‍රාත් පැවරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කටයුතු කර ඇත.

(එ) බදු ගෙවීම — මූල්‍ය තත්වය අනුව සමහර කාර්තුවල බදු ගෙවීමේ ප්‍රමාදයක් පැවතීම නිසා ගෙවිය යුතු බදු වගකීමක් ලෙස පෙන්වා ඇත.

මෙයට - විශ්වාසි,

සිද්දි එම් ෆාරුක්

සභාපති

Sri Lanka Broadcasting Corporation
Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka